අභ්‍යාස ප්‍රයෝග ශුද්ධි පද විවරණාදීන් යුක්තවූ

අමෘත බින්දු,

(නොහොත්)

උද්ධෘත අමාවතුර.

අම්බලම්ගොඩ-රන්දොඹේ,
මහාචෛත්‍ය පරිවෙණාචාර්ය පණ්ඩිත,
වලගෙදර සෝමාලෝක තිස්ස
ස්ථවිරයන්වහන්සේ විසින්
සම්පාදිත යි.

විද්‍යෝදය මහා විද්‍යාලයයෙහි
උප ප්‍රධානාචාර්ය පණ්ඩිත
වැලිවිටියේ සෝරත මහාස්ථවිර
පාදයන්වහන්සේ විසින් ලියනලද
ප්‍රස්තාවනායෙන් සමන්විත යි.

මහාචෛත්‍ය පරිවෙණාධිපති
අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්ති සිරි
තොටගමුවේ පඤ්ඤාමොලි තිස්සාභිධාන
අමරපුරනිකායේ මහා නායක මාහිමියන්
වහන්සේ විසින් ප්‍රතිග්‍රාහිතයි.

අම්බලම්ගොඩ
පී. ඇම්. සී. ද සිල්වා මහතා විසින්
විජය යන්ත්‍රාලයෙහි මුද්‍රාපිත යි.

1937.

සංඥාපනය.

සකල කවිකුල තිලකයන් මෙන් වැජඹුණු පුරාතන කවි ශ්‍රේෂ්ඨයන් විසින් විරචිත ගද්‍ය පද්‍ය කාව්‍යයන්ගෙන් පොෂිතවූ සිංහල භාෂායෙහි වර්ධනය හා ව්‍යාප්තිය ද තදුද්ග්‍රහණ ධාරණාදීන් ඇතිවිය. නවීනයන්ගේ සාහිත්‍ය ඥානය ද එයින් ම වැඩෙමින් පවතී. ඒ මේ ස්වභාෂාමය කාව්‍ය ග්‍රන්ථයන් අතුරෙහි **අමාවතුර බුත්සරණ** ආදි ගද්‍ය කාව්‍යයන් හා **කව් සිළුමිණ කාව්‍යශේඛරය** ආදි පද්‍ය කාව්‍යයෝ ද අතිශය සම්භාව්‍ය වෙති. වර්ෂයක් පාසා පැවැත්වෙන ගුරුවරුන්ගේ ප්‍රාරම්භ පරීක්ෂණාදියට සැරසෙන්නාවුන්හට ඒ පොත් සම්පූර්ණයෙන් ඉගෙනීම දුෂ්කර බැවි පිළිගත් විද්වත්වරයෝ ඒ ඒ ග්‍රන්ථයන්හි රුචිරතර සුමධුර ප්‍රධාන කොටස් උපුටා පළකරවීම සිංහල සාහිත්‍යය නගාලීමට මාර්ගයකැ යි සලකති. එහෙයින් ම අද එබඳු නොයෙක් උද්ධෘත කාව්‍යාදීහු දක්නා ලැබෙත්. අමාවතුරෙහි එබඳු වැදගත් කොටස් පිළියෙළ කොට පළකර වීම වැඩදැයි බැව් සැලකූ **මහාචෛත්‍ය පිරිවෙන් වැසි ආචාර්ය බෙරතුඩුවේ ධම්මාධාර තිස්ස** ස්ථවිර තුමන් විසින් ව්‍යාපාරිතවූ අපි මෙහි විශේෂයෙන් ව්‍යාපෘත වීමු.

අමා නම්වූ නිවන් සපුරට ගලා බස්නා දිය පාරක් වැනි දහම් රසයෙන් පරිපූර්ණවූ ග්‍රන්ථය **අමාවතුර** නම් විය. එහිවූ ඒ ඒ දහම් කොටස් නමැති දියබිඳු උපුටා රැස්කළ ග්‍රන්ථය අන්වර්ථ වශයෙන් අමෘතබිඳු නම් විය. එසේ ම අමාවතුරෙන් උපුටාගත් කොටස් ම එහි වූයෙන් එය උද්ධෘත අමාවතුර ය යි ද සලකනු ලැබේ.

මෙය පාඨශාලා හැරයාමේ විභාගය, ප්‍රාචීන භාෂොපකාර සමිතියේ ප්‍රාරම්භ විභාගය ආදි විභාගයනට සුදුසු වන ලෙස

සඞ්ග්‍රහ කෙළෙමු. පිරිවෙන් වලද ඉගැන්වීමට ද මෙය සුදුසු වේ. තදුද්ග්‍රහණයෙහි නියුක්තයන් ගේ විමංසන බුද්ධිය වැඩී මෙන් සාහිත්‍යය පිළිබඳ වෛශාරද්‍යය දනවනු වස් පාඩමක් පාසා ලියූ **අභ්‍යාස ප්‍රයෝග ද** ඒ ඒ තන්හි යොදලීමු. දුර්බෝධ පදයන් වර්ණනා කරමින් ලියූ **ග්‍රන්ථි පද විවරණය** මෙහි අගට යොදා ඇත.

අප ආචර්‍යොත්තම අමරපුර නිකායේ මහානායක ධුරන්ධර **අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්ති සිරි තොටමුවෙ පඤ්ඤාමොලි තිස්සාභිධාන මහාචෙතිය පරිවෙණාධිපති** මාහිමියන් වහන්සේ මෙය පිළිගෙන වදාළහ.

තවද මේ පිළිබඳ ව උගතමනා වැදගත් කරුණු පිඬු කොට දක්වමින් **විද්‍යෝදය මහාවිද්‍යාලයයෙහි උප ප්‍රධානාචාර්‍ය පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සෝරත** මහාස්ථවිරයන් වහන්සේ විසින් ලියූ ප්‍රස්තාවනාව මෙහි ඇතුළත් බැවින් වැඩි විස්තර නො ලියමු

අම්බලම්ගොඩ ප්‍රසිද්ධ පොත් වෙළෙඳ මහතෙක් වන **පී. ඇම්. සී. ද සිල්වා මහත්මයා** මෙහි මුද්‍රණය **විජය යන්ත්‍රාලය** මගින් මනාව කරවන ලද බව හා මෙය නැවත මුද්‍රණය කරවීම යථොක්ත පී. ඇම්. සී. ද සිල්වා මහත්මයා අයත් බවත් මෙයින් නිවෙදනය කරමු.

ශ ව.

W. Somaloka Tissa Thero,

Mahachetiya Pirivena,
Randombe, Ambalangeda,
23. 7. 37.

ප්‍රස්තාවනා.

පුරාණ කාව්‍යග්‍රන්ථයෝ ඉතිහාස ගවේෂකයන්හට අනුරුධ පුර පුලස්ති පුරයන් වැනියහ. කාව්‍ය කර්තෘවරයාගේ දැනීමක් නැතිව ම තත්තත්කාලීන චාරිත්‍ර වාරිත්‍ර වාග්විශේෂාදීන් කාව්‍යයන්හි ඇතුලත් වන හෙයිනි. පුරාණයෙහි නො පැවැති විදෙශිය චාරිත්‍රයක් යම්කිසි කාව්‍යග්‍රන්ථයක සඳහන් ව තිබේ නම්, ඒ කාව්‍යග්‍රන්ථය අයිති රටෙහි ඒ චාරිත්‍රය අයත් ව සිටි ජාතිය බල පැවැත්වූ බව නිශ්චය කළ හැකිය. අපේ සමහර පොත්හි ද්‍රවිඩ වචන සුලභ ය. එයින් නිශ්චය වන්නේ ඒ ග්‍රන්ථ කරණ කාලයෙහි මේ රටෙහි ද්‍රවිඩයන්ගේ බලය ව්‍යාප්ත ව පැවැති බව යි. මේ ආදි නොයෙක් ඓතිහාසික සිද්ධීහු පුරාණ ග්‍රන්ථ ගවේෂණයෙහි දී මතු වී එති.

එසේ ම පුරාතන කාව්‍යයෝ භාෂාවෙහි ශිෂ්ටරීති ආරක්ෂා කරණ නිධාන වැන්නෝ ය. භාෂාව සම්බන්ධ ව්‍යාකරණ රීති ඉගෙණීමට ඇති ඉතාමත් පහසු ක්‍රමය වනාහි කාව්‍ය ග්‍රන්ථයන් විචාර බුද්ධියෙන් යුක්ත ව පරිශීලනය කිරීම ය. විශේෂයෙන් සිංහල ව්‍යාකරණය උගත යුත්තේ පුරාණ කාව්‍යග්‍රන්ථ හැදෑරීමෙනි. සිංහල භාෂාවට තිබෙන එක ම පැරණි වියරණ ගත සිදත් සඟරාව ය. එය ඉතා ලුහුඬින් කරණ ලද්දකි. සිංහල භාෂාවෙහි ඇති සියලු ම ශිෂ්ටරීති එහි ඇතුලත් නො වේ. එහෙයින් සිංහල ව්‍යාකරණ උගත

යුත්තේ ඡේකප්‍රයොග වූ පුරාතන සිංහල ග්‍රන්ථයන්ගෙන් ම ය. හුදු ව්‍යාකරණ ග්‍රන්ථ වූකලී බොහෝ දෙනාගේ සිත් පිණවීමෙහි නො පොහොසත් වෙති. කාව්‍ය ග්‍රන්ථයෝ එබන් දන්හට නිතැතින් ම වියරණ උගන්වති

අමාවතුර වනාහි පිරිසිදු සිහල බසින් කළ මනහර ගත් කිපය අතුරෙන් එකකි. ගතට මේ නම අතිශය සම්චීන ය. 'අමා' යනු නිවණට ද, දිවබොජුනට ද, මිහිරි දියට ද, නමකි. 'වතුරු' යනු ගලා පැතිර ගිය දියට ද, පැතිරයැමට ද, නමකි. ඒ නම් දෙක සමාස වීමෙන් 'අමාවතුරු' යන නම සිඩ ය. මේ පොතෙහි වැකියක් පදයක් අකුරක් නො හැර අමා (= මිහිර) පැතිර පවතී. මෙහි භාෂා විලාසය අතිශය ලලිතය. අති චමත්කාර ජනක වාඞ්මාලාවන්ගෙන් ලියූ චරිත කථාවෝ පරමවෛචිත්‍ර්‍යාවහ ය. කථාමාධුර්‍ය්‍යය අක්‍ෂයී ය. ආශ්චර්‍ය්‍යයෙකි. මෙය පදනුපදික පරිවර්‍තනයක් වුව ද, මෙහි කර්‍තෘවරයා විසින් මෙය සරසනු පිණිස අමුතු දෙය එකතු නො කළ ද, මීට මුල් වූ බොහෝ පාලිපාඨයන් කියවන විට නො ලැබෙන අවාච්‍ය වූ හෘදයාර්ද්‍ර භාවයක් මෙය කියවීමෙහි දී ලැබෙන්නේ ය. ගුරුළුගෝමීන්ගේ වාග්විදග්ධ නිපුණත්වය, අහෝ! ආශ්චර්‍ය්‍ය ය. මෙය නැවත නැවත කිය වත් කියවත් ම අභිනව රසයෝ පැදී එත්. **අමාවතුර** යන නම මේ ගතට තිසි වන්නේ එහෙයිනි.

ඓතිහාසික සිඩි පර්‍යේෂකයන් හට මේ පොතෙන් වැඩි පිහිටක් නො ලැබේ. පාලිපොත්හි එන චරිත කථා බෙහෙවින් පාලිවචනයන්ගෙන් බිඳගත් වචනයන්ගෙන් ම පවසන ලද හෙයිනි. එසේ වුවත් සිංහල ව්‍යාකරණ රීති ගවෙෂකයන් හට, රත්නගවෙෂකයන් හට රත්නපුරයට ද වඩා, මේ පොත ශ්‍රෙෂ්ඨ වන්නේ ය.

අමාවතුරෙහි ඉතා වැඩි කොටසක් සූත්‍ර-අර්‍ථකථාවන්ගේ පරිවර්‍තන ය. සෙසු බොහෝ පරිවර්‍තකයන් මෙන් ගුරුළු

ගෝමිතුමා තමන්ගෙන් අමුතු අදහස් මීට එකතු නො කොළේ ය. පාලිවාක්‍යයන් ගේ ස්ථාන පවා, ප්‍රචලිත සිංහල වාක්‍යරචනා ක්‍රමයට ගැළපෙන සේ, වෙනස් කරන්නට එතුමා තුටු නො වී ය. මේ පොතෙහි කීප පලක ම පෙණෙන වාක ගර්භිතඃඛයට ද හෙතුවූයේ සාකල්‍යයෙන් ම පාලිපාඨයන්ට අනුගත වීම යි. සිංහල ව්‍යාකරණරීති ඉක්ම වූ එක් තැනකු දු මෙහි නැතැ යි කිය යුතු තරමට මේ පොත නිරවද්‍ය ය. සිංහල ව්‍යාකරණරීති නො ඉක්මවා පාලිවචනයන්ට රම්‍ය වචන ලිවීම එතුමා ගේ පරිවර්තන ක්‍රමය වී ය.

ත්‍රිපිටකයෙහි නොයෙක් තැන විසිර තුබුනු විසිතුරු චරිත කථාවන් ගෙණ, විසිර ගිය මුතු ඇට ගෙණ අමුතු මුතු වැලක් අවුණන්නෙකු මෙන්, ගුරුළුගෝමි තුමා මෙහි යෙදී ය. එහෙයින් මේ ග්‍රන්‍ථය පාලිපදානුපදික පරිවර්තන බහුල වුව ද, අළුත් ම කෘතියකැ යි කිය යුතු ය.

ගුරුළුගෝමි තුමාගේ ප්‍රතිභාන ශක්තිය අමාවතුරෙන් ප්‍රකට නො වතත්, එතුමාගේ අනික් කෘතියක් වූ ධර්මප්‍රදීපිකාවෙහි නොයෙක් තැන යෙදුනු වර්ණනාවන්ගෙන් එතුමා එයින් ද කවිගණනායෙහි කනිෂ්ඨිකාධිෂ්ඨානය කරණ බව දැක්වුව වේ. ධර්මප්‍රදීපිකාවෙහි ඇතුලත් වර්ණනාවන්හි සමහර තැන අන්‍යකෘතීන් ගේ ඡායාමාත්‍ර පෙණුනත් ගුරුළුගෝමි තුමා ධර්මයෙන් බැහැර වූ ලෞකික වර්ණනාවන්හි දී අන්‍ය කෘතීන් ගෙන් අදහස් පැහැර ගතැ යි කිම යුතු නො වේ. බහුශ්‍රැත ව්‍යක්ත කවීන් තුල සමාන අදහස් ඇතිවීම ධර්මතා ය. අතීතයෙහි යුරෝපයෙහි සිටි මහාකවීන්ගේ කෘතීන්හි ප්‍රාචීන කවීන් වූ කාලිදාසාදීන්ගේ අදහස් ද ගැබ් ව තිබෙන බව නො රහසකි. ඒ අදහස් කාලිදාසාදීන් ගේ කෘතිවලින් පැහැර ගතැ යි කිම අයුතු ය.

මේ ග්‍රන්‍ථයෙහි කර්තෘවරයා වූ ගුරුළුගෝමි තුමා ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 1700 වැන්න හා 1826 වැන්නත් අතර කලෙක්හි

ධර්මශාස්ත්‍රඥත ප්‍රභාවෙන් ලක්දිව හෙබවූ බව කිය හැකි ය. ඊට හෙතු කිම? යත්:- එතුමාගේ ධර්මප්‍රදීපිකාවෙහි ජිනාලඞ්කාර වර්ණනාවෙන් ගත් සාධක පාඨ පෙණේ. ජිනාලඞ්කාර වර්ණනාව සරණලද්දේ 1700 වැන්නෙහි දී ය. 1791 දී රජ බවට පැමිණ 1826 දී සවර්ගස්ථ වූ දෙවෙනි පැරකුම්බා රජු ගේ කාලයෙහි දී සාළු සිදත්සඟරාවෙහි එතුමාගේ නාමය ද සඳහන් වෙ යි හෙතු මේ ය.

එතුමාගේ නම ‘ගුරුළු’ ය. ‘ගොමි’ යන්න උපාධියකි. එය ‘ගොමින්’ යන සංස්කෘත ශබ්දයෙන් සිංහල භාෂාවට ගත්තකි. ‘බෞද්ධොපාසක’ යනු එහි අර්ථ ය. එහෙයින් ‘ගුරුළුගෝමි’ යන්නෙහි අර්ථය නම් ‘බෞද්ධමහොපාසක වූ ගුරුළුතෙම’ යනු යි.

ධර්මප්‍රදීපිකාව වනාහි ගුරුළුගෝමි තුමාගේ සවසමය සමයාන්තරයන්හි හා විවිධ ශාස්ත්‍රාන්තරයන් හි ත් අප්‍රතිහත ව පැවති විශාරද බුද්ධිප්‍රභාවය විදහා දක්වන සවර්ණමය දර්පණ තලයකි. මෙතරම් පොත් සුලභ වූ කාලයක සිටින බහුශ්‍රැතයන් විසින් කියවන්නට තබා දකින්ට වත් නො ලද ග්‍රන්ථ මහත් රාශියක් ගුරුළුගෝමි තුමාගේ හෘදය ගත ව පැවති බව ධර්මප්‍රදීපිකාවෙන් ඔප්පු වේ.

ධර්මප්‍රදීපිකාව අමාවතුරට වඩා මහලු ය. ඒ බව අමාවතුරෙහි ම සඳහන් වේ එහෙත් ධර්මප්‍රදීපිකාවෙහි භාෂාව හා අමාවතුරෙහි භාෂාවත් සසඳ බලන කල අමාවතුර ධර්මප්‍රදීපිකාවට වඩා අවුරුදු සිය ගණනකින් වැඩිමහලු ය යි කිය යුතු සේ පෙණේ. එසේ වීමට හෙතු කීපයකි. අමාවතුර ලියන කාලයෙහි ගුරුළුගෝමිතුමා වෘද්ධව සිටි සිංහල භාෂාවට චක්‍රවර්තියෙක් වී ය එහෙයින් එතුමා භාෂාවට යටත් නො වී ය. එතුමාගේ අදහස් අනු ව භාෂාව නමා ගැනීම එතුමාට සුසාර වී ය. පෙලබසින් වචන බිඳ බිඳ සිය බසෙහි යෙදී ය. කොතරම් ගැඹුරු දහමක් වුව ද පැවසීමට යොග්‍ය

සිංහල වචන එතුමාට දුලීභ නො වී ය. වයසින් බාල වූ අමාවතුරෙහි භාෂාව වැඩිමහලු ධර්‍මප්‍රදීපිකාවෙහි භාෂාවට වඩා ගැඹුරුවීමට මේ එක් හෙතුවකි.

සිදත් සඟරාවෙන් පසු සම්බන්ධ විභක්ති ප්‍රත්‍යයයක් ලෙස ම සම්මත වූ 'ගේ' යන්න නිපාතයෙකැ යි හැඟෙන සේ "බුදුනු දූ ගේ (= බුදුන් ගේ දූ), මයි දූ ගේ (= මාගේ දූ) යනාදි නොයෙක් තැන මෙතුමා යෙදී ය. අමාවතුරු–සිදත් සඟරා කාල දෙක්හි අතර විශාල නො වේ. එතරම් ලංව සිටි දෙදෙනෙකුන් ව්‍යාකරණයෙහි වැදගත් තැනක් පිළිබඳව වෙනස් අදහස් ඇති ව සිටිම සැලකිය යුත්තකි. එහෙයින් සිදතෙහි ඡේක ප්‍රයොගයන්ට විරුඬ වූ සේ පෙණෙන තැන් සිදත් කතු තුමාගේ නො දත්කමින් වී ය යි කිම යුතු නො වේ. එකල්හි ද සිංහල ව්‍යාකරණය නො යෙක් මත භෙද යන්ට භාජන ව පැවති බව මෙයින් සිතිය හැකි ය.

අමාවතුරෙහි පරිච්ඡේද අටළොසකි. එයින් ප්‍රථම ද්විතීය පරිච්ඡේද පාලිපරිවර්‍තන නො වේ ප්‍රථම පරිච්ඡේදයෙහි මුළු ජාතක පොත හකුළා දක්වන ලදි. එය එකම වාක්‍ය යෙකි. ද්විතීය පරිච්ඡේදයෙහි බොධිසත්ත්වයන් වහන්සේ තුසී පුරෙන් සැව මහමායා දෙවිය කුස පිළිසිඳ ගැණීමෙහි පටන් පස්මරුන් දිනා සර්‍වඥතාඥාන දමනය කොට බුදු වීම තෙක් තොරතුරු දක්වන ලදි. දම්සක් සුතුර දෙසීමෙහි පටන් දෙව්රම් වෙහෙර පිළිගැණීම තෙක් කථා ප්‍රවෘත්තිය තෘතීය පරිච්ඡේදයෙහි එයි. එතැන් පටන් එක් එක් පරිච්ඡේදයෙහි ගෘහපති–බ්‍රාහ්මණ–රාජ ආදීන් දමනය කළ අයුරු ප්‍රකාශ වේ.

අමාවතුර පරිශීලනය කිරීමෙන් ප්‍රයොජන රාශියක් ම ලැබිය හැකි ය. බුඬචරිතය, නිරවද්‍ය සිංහල වාක්‍ය රීති, පැරණි සිංහල වචන යනාදිය ඉගෙණ ගන්නා අතර ම අවාච්‍ය වූ අතිශය ප්‍රීතියක් ද, මේ පොත කියවීමෙන් ඇති වේ. මේ පොතෙහි එන කථා වස්තූන්ට මුල් වූ පාලි සූත්‍ර–අර්‍ථ

කථාවන් හා සසඳා කියවීමෙන් පාලිභාෂා විෂයයෙහි දැ පටුත්වයක් ඇති වේ.

මෙබඳු පැරණි පොත්වලින් සුදුසු කොටස් උපුටා ගෙණ කරණ ලද සඞ්ග්‍රහ ග්‍රන්ථයෝ වර්තමාන ලොකයෙහි දියුණු වූ සියලු ජාතීන් අතර ම සුලභය හ. ලක්දිව එබඳු සඞ්ග්‍රහ ග්‍රන්ථ පළවන්නට වූයේ මෑතක පටන් ය. මෙ බඳු සඞ්ග්‍රහ ග්‍රන්ථයන්ගෙන් භාෂා ශාස්ත්‍රයන් ගේ අභිවර්ධනයක් මිස හානි යක් නම් කිසිවිටෙක ත් නො වේ. එහෙයින් අමාවතුරෙන් පාඨ උද්ධරණය කොට 'අමෘත බින්දු' නමින් මේ සඞ්ග්‍රහ ග්‍රන්ථය පිළියෙල කළ **පණ්ඩිත සොමාලොක තිස්ස ස්ථවිර පාදයන් වහන්සේම** උගත් ලොකයාගේ අවඩකාදර සතුතිය අයත් විය යුතු ය.

මිට,

වැලිවිටියේ සොරත ස්ථවිර.

1937 ජූලි මස 30 වෙනි දින

විද්‍යොදය පිරිවෙණේ දීය.

පටුන.

කාරණය.	පිටු.
අජාසත් රජතුමා I.	1 — 5
අභ්‍යාස ප්‍රයොග	6 — 6
අජාසත් රජතුමා II.	7 — 12
අභ්‍යාස ප්‍රයොග	13 — 13
අජාසත් රජතුමා III.	14 — 21
අභ්‍යාස ප්‍රයොග	22 — 22
මහා විජිත රජතුමා I.	23 — 27
අභ්‍යාස ප්‍රයොග	28 — 28
මහා විජිත රජතුමා II.	29 — 32
අභ්‍යාස ප්‍රයොග	33 — 33
දීඝ තපස්සී නිගණ්ඨයා.	34 — 36
අභ්‍යාස ප්‍රයොග	37 — 37
උපාලී මහ සිටුවරයා I.	38 — 42
අභ්‍යාස ප්‍රයොග	42 — 43
උපාලි මහ සිටුවරයා II.	43 — 48
අභ්‍යාස ප්‍රයොග	49 — 49
උඹගු සිටුදුවක්.	50 — 54
අභ්‍යාස ප්‍රයොග	55 — 55
පුදුම තාපසයා.	56 — 59
අභ්‍යාස ප්‍රයොග	60 — 60
මණ්ඩපප කුමාරයා.	61 — 66
අභ්‍යාස ප්‍රයොග	67 — 67
ග්‍රන්ථි පද විවරණය.	69 — 90

අමෘත බින්දු.

(නොහොක්)

උද්ධෘත අමාවතුර.

අමෘත බින්දු. 1.

අජාසත් රජතුමා. i.

ප්‍රධාන කරුණු.

(1) රජගහ නුවර. (2) බිම්සර රජ බිසොවගේ පුදුම දොළ දුක. (3) බිසොවගේ ස්වාමි භක්තිය. (4) පාප මිත්‍ර සේවනය. (5) පිය රජ මැරීමේ උපාය. (6) අජාසත් කුමරු රජවීම. (7) බිම්සර රජුගේ පතුල් පැළවීම.
(8) පිය රජුගේ මරණය.

---

(1) රජගහ නුවර. මගධ රට රජගහා1 නම් නුවරෙක් වී. එ නුවර මන්ධාතු මහා ගොවිඤ්දි රදුන්2 විසින් පිරිගා කරනුලද්3 බැවින් රජගහා නම් විය. බුදුන් දවසු දු4 සක්විත්හත් දවසු දු නුවර වෙයි. සෙසු කල සිස් ව යකුන් විසින් පිරිගා කරනු ලද්ව ඔවුනට වසත්5 උයන් සෙයින්6 සිටි.

---

1. රජගහ.
2. රජුන්.
3. කරනලද.
4. දවස ද.
5. වසත්.
6. ලෙසින්.

(2) බිම්සර රජ බිසොවගේ පුදුම දොළදුක.

සැවැත් නුවර මහ කොසොල් රජහු දූ රජ ගහා නුවර බිම්සර මහ රජහට:[1]–බිසොව අජාසත් කුමරහට ගබ්ගත. ඔහු කුස වසන කල බිසොවට දෙළෙක් උපදනේ රජ්‍රුදකුණු දිසරුයෙන් ලේ බොන දෙළෙක් උපන.

හෝ තමහට උපන් දෙළ කිසි කෙනකුන්ට නො කියා වැහැරගියා. රජ පිළිවිස බලා නො කියන්නෙන් "ති මට විපරිත වනු කුමටය"යි සත්නෙන්[2] පිළිවිසගෙන "සැවකාමු[3] දෙළෙක තිට උපන්නේය"යි වෙදු ගෙන්වාගෙන රත්සැතින් දස රුව පළවා රත් තැටියෙන් ලේ ගෙන දිය හා මුසුකොට පොවාලිය, දෙළ සන්හින.[4] නෛමිත්තිකයෝ "එ ගැබ රද්[5] සතුරු දරුයෙක, උහු විසින් රජ නස්සි"යි කිහු.[6]

(3) බිසොවගේ ස්වාමි භක්තිය.

ඒ අසා ගබ හෙළා පියටිවැ උයන් ගොස් කුස මඩවයි, ගබ නොහෙයි, රජ ඇය එක් වන් උයන් යනසේ දැක පරිජනයන් පිළිවිස අතුරු දැන තී කුස පුතකුබව් දුවකුබව් නො ද දැනෙයි.[7] "අසුවල් රජ තමහට උපන් දරුවක් හට මෙසේ කැරවී ල" යන මහත් අගුණ රාශියෙක් දඹදිව් තෙලෙහි පැතිර යෙයි "වටාලා එසේ නොකරා"යි රකවල් දෙවියැ. හෝ "ඔහු උපන් කල මැරුව මැනව"යි සිතුව. දරුවා උපන් කල රකවල සිටි මිනිස්සු[8] උහු දැක රජහුගේ කිමෙන් කුමරහු පා කළහ. කුමරහු මහත්වූ කල ඇර මවු බිසව් දැක් වූහු. හෝ ඔහු දැක පුත්‍ර සනා කලා. එසින් ඔහු මරන්නට නො පොහොසත් වුව. රජද් අනුක්‍රමයෙන් ඔහුට යුව රජ තන් දින්.

---

1. රජුහට.
2. ප්‍රයත්නයෙන්.
3. කටුවූ. / සවකාවූ. / සැවකාවූ
4. සන්හිඳින.
5. රුදු.
6. කීවාහු.
7. නොදැනෙයි.
8. මිනිස්නු.

(4) පාප මිත්‍ර සේවනය.

එකල්හි දෙව්දත් මහ තෙරහු සිතූහු. "සැරියුත්[1] මහ තෙරහු ද මුගලන් මහ තෙරහු ද මහසුබු මහතෙරහු ද වෙන වෙන පිරිස් ගෙන වාසය කෙරෙති,[2] මසිදු[3] පිරිසක් නොව ගත මැනවැ යි, ලාභ විනා පිරිස්කොට නො ගතහැක්ක. එසේ බැවින් ලාභ උපැයුව මැනවැ"යි විනයෙහි කී ක්‍රියායෙන් අජාසත් කුමරහු සෘඩි[4] පෙළහරයෙන් පහදවා, සවණ ද රුයිම් මෙහි ද පන් සියයක්[5] රථ පිරිවරින් තමා කරා එළඹෙන සේ විස් වස් කාළ සේ දැක, ඔහුහට මෙසේ කිය. "කුමාරය! පෙර මිනිස්හු බොහෝ කලට ආයු ඇත්තාහ, දැන් එසේ නො වෙයි, තෝ තොප පියා මරා රජව ව,[6] මම් බුදුන් මරා බුදු වෙම්"යි, පිය රජහු මරන්නට යෙදී.

(5) පුත් කුමරු රජවීම.

එකල්හි රජකුමර "අපවත් හිමියෝ දෙව්දත් තෙරහු[7] මහත් ආනුභාව ඇත්තාහ. ඔවුන් නො දත් දෑයෙක් නම් නැති." කාළවයැ සිරියක් බැඳගෙන දෙවෙන් දවාල් වෙවුලමින් රජ ගෙට ගොසින් වති. ඇමැත්තෝ එකල්හි ඔහු තිරුසොාට ගෙන සබව දැන "කුමාරයා ද මැරුව මැනවැ, දෙව්දත්හු ද් මැරුව මැනවැ හැම මහණහු ද් මැරුව මැනවැ"යි බැණගෙන සැළකොට කාළ මැනවැ යි රජහට කිහු. රජ කුමරුවා මරම්හ යි සිතූ ඇමැත්තන් අතැ.[8] මෙහෙවර ගෙන නො මරම්හ යි සිතූ ඇමැත්තනට මහත් මෙහෙවර දී, කුමරහට කුමක් සඳහා මරමී සිතුයෙහි දෑ?යි පිළිවිස රජය සඳහා යි කියෙන් "ඉතා මැනවැ යි තා කැමැති රජය බලා ගතැ"යි[9] රජය ඔව්හට දක්වා දිනි. හෝ මාගේ මනොරථය නිපනැයි දෙව්දත් තෙරුන්ට කිය.

---

1. සැරියුත්.
2. කරති.
3. මයිත්.
4. සෘඩිමත්.
5. සත්සියයක්.
6. රජව.
7. අපවත්හිමියෝ.
8. { අත. / ඇත
9. ගත්තැයි.

එකල්හි දෙව්දත් තෙරහු "තෝ මීයන් ඇතුළු කොට[1] බෙර සදහා මිනිසක්හු වැන්නෙහි, කිහිප දවසකින්[2] තා[3] පියේ තාගේ නිහසර සඳහන් කොට බලා රජය ගන්නී" කිහ. ඔස වහන්සේ කුමක් කෙරෙම් කිය. රජු මරාපිව මැනැවැ යි කීහ. මා පිය රජහට සැතින් වධ නො කටහැක්කැ යි[4] කිය. "නැවෙන්නට නිසි ගෙයෙක[5] ලා අහර වළකා මරාපියව"යි කීහු. හේ පිය රජු නැවෙන්නට නිසි ගෙයෙක[5] බහාපියා, අන්නිය මිස අනෙකක්හු[6] නො වැද්ද දෙන්නේ ය යි යෙදීය.

(6) පිය රජු මැරීමේ උපා.

එතන පටන් ගෙන දේවිහි රන් තැටියෙක බත් එව හිඟැ[7] තබාගෙන වදනී.[8] රජ ඒ වළඳා යපෙයි. හේ "මපණෝ[9] කිසේ යපෙති?" පිළිවිස ඒ පවත් අසා, "ඇය හිගින්[10] යම් දූයෙක් නො ගෙන වැද්දදෙන්නෙය"යි යෙදීය. එතන පටන් ගෙන දේවීහි බත් මුහුළ[11] තබාගෙන වදනී.[12] එයි දු අසා අන්නිය කොහෙ බැඳ නො වැද්ද දෙන්නෙය යි යෙදීය.

එතන පටන්ගෙන රන්මරවැඩිය බත් එව පියාලා පයින් ගෙන වදනි,[12] රජ ඒ අසා "අන්නිය මරවැඩි ලා නො වැද්ද දෙන්නෙය"යි යෙදීය. එතන පටන්ගෙන දේවීහි ගඳදියෙන් නයා ශරීරයෙහි[13] සිසුම්පුරු ගල්වා පිළී පෙරව ගෙන වදනී. රජ පා ඔවුන් සිරුර ලෙව යපෙත්. යළිදු පිළිවිස ඒ පවත් අසා අන්නිය නො වැද්ද දෙන්නෙය යි වැළකී. දේවීහි දෙර වූගේ මූල සිට, හිමි! බිම්සර මහරජ! ඔහු ළදරු කල මරා නො පිය දුන්ව,[14] තොප සතුරා පොපි ම පුට්ව,[15] මේ තොපගේ

---

1. ඇතුල්කොට. 2. දවසින්. 3. තාගේ. 4. නැක්කෙමි යි.
5. ගෙයක. 6. අනිකක්. 7. හිස. 8. ඇරදෙයි. 9 මපියාණෝ.
10 {හිසින්. {හැඟින්. 11. මුහුලස, 12. වද්දී. 13. ශරීර. 14. දුන්.
15. {පුරිව. {හැසී.

නිමාමි[1] දක්මය. මම් මෙත්න පටන්ගෙන තොප දක්නා[2] නො ලැබෙමි. මාගේ වරදෙක් ඇත්නම් මා කෙරෙහි ක්ෂමා කරන්නෙය යි වැලැප වැහැස නැවැත්ත

(7) පිඟ රජුගේ පතුල් පැළවීම.

එතැන පටන්ගෙන රජහට අහර නැතිවිය. සෝවාන් රජ මග පල සුවෙන් සක්මන් කොට යපෙයි. රජුගෙ ශරීරය දිලියෙ යි අප්පා කිසේ යපෙති? පිළිවිස සක්මනින් යපෙන සේ, ශරීරය දිලියෙන සේ, අසා සක්මන් නො කොට දුන මැනවැයි, මපණන්[3] පතුල් කරයෙන් පළා ලුණුතෙල් ගල්වා කිහිරඟුරෙහි චිටි චිටි යන අනුකරණ ඇතිකොට [පස්ව] යි නැවැමියන් යවී.

රජ ඔවුන් දූසා එකැතින් මපුත් කිසිවක්හු විසින් දන් වනලද්දේ වන, මොහු මං දූලිවලු මෙහෙ පිණිස ආහ යි සිති. ඔහු ගොස් වැද සිටියාහ. කුමක් හෙයින් අවුදූ? යි පුළුවුස්නා ලද්දහු එ රජුගේ හස්න සැලකළහ.

තොප රජුනෝ අණ කරව යි, කියනලද්දහු දේවයන් වහන්ස! වැඩහුන මැනවැ යි කියා රජු වැද, වහන්සේ ඇපි රජු අණ කරම්හ. අප කෙරේ නහමක් කිපුණ මැනවැ, ඔබ වැනි දූහැමි රජපා කොනකුන්ට මේ සුදුස්සෙක් නො වෙ යි කියා, වමතින් ගොප් ඇටය අල්වා දකුණතින් කරය ගෙනැ පතුල් පළා ලුණුතෙල් ගල්වා කිහිරඟුරෙහි චිටි චිටි යන අනුකරණ ඇතිකොට පක්හ.

---

1. නිම්මා. 2. දකිනු. 3, {පියාණන්, පණන්,

[ ] මේ අතරවූ කොටස ඇතැම් පොතෙක නැත.

අභ්‍යාස ප්‍රයෝග.

සාමාන්‍ය ප්‍රශ්න. අජාසත් කුමරු නිසා ඇතිවූ දොළ හා එහි විපාක පැහැදිලිකර ලියනු. 2. දෙව්දත්හු අජාසත් කුමරු පැහැදවූ පරිදි ලියනු. 3. ඔහු දුන් ප්‍රධාන උපදේශය දක්වනු. 4. නියම භාර්‍යාවකු විසින් ස්වාමියකුට පැවැතිය යුතු කෙසේද? 5. පියාට දුන් අන්තිම වධය දක්වනු.

ව්‍යාකරණ ප්‍රශ්න. **''වෑන්නෙහි- සිතූයෙහි''**- යන මෙහි සන්ධි දක්වනු. **සොවාලිය-පුටුව-වැහැස-සත්ව**- මේ පදයන්හි නිෂ්පත්තිය ලියනු. **රජපා- මුහුළු** ශබ්ද වරනගනු.

ඉතිහාස ප්‍රශ්න. බිම්සර මහරජුගේ මව් පිය පරපුර දක්වනු **දෙව්දත්හු- සෑමිශුන්**- මේ නාම් ගැන දන්නා යමක් ලියනු.

පුරාවිද්‍යා ප්‍රශ්න. **රජගහා නුවර, කොසොල් රට**, මේ දේශයන්හි අතීත වර්තමාන තත්ත්වය පැහැදිලි කරනු. මේ දෙරටෙහි ප්‍රධාන ස්ථානයක් ලියා වර්ණනාකරනු.

උධෘත වාක්‍ය ප්‍රශ්න. "තී මට විපරීතවනු කුමටය." "රජු මරාපිව මැනවැ" "මේ තොපගේ නිමාම් දුක්මය." "තොප රජුගේ අණකරව." මේ වාක්‍යයෝ කවරුන් කවර කවර අවස්ථාවන්හි කුමක් කුමක් පිණිස කියන ලද්දහුද?

අමෘත බිඳු 2.

අජාසත් රජතුමා. ii.

ප්‍රධාන කරුණු.

1. පතුල් පැළීමට හේතු. 2. බිම්සර රජුගේ මරණය. 3. අජාසත්හට පුතකු ලැබීම. 4. මව බිසොව පියාගේ පුත්‍ර සෙනහස දක්වීම. 5. අජාසත්හු රාත්‍රි ගතකරන පරිදි. 6. බුදුරදුන් දක්නට යාම. 7. රජ පෙරහර. 8 බුධ දශීනය හා පැහැදීම. 9. ශ්‍රමණඵල දෙශනාකිරීම.

1 පතුල් පැළීමට හේතු.

එ රජු පූර්ව ජන්මයෙහි දගබ් හඟණෙක්හි[1] වහන් ලා ගියේය. සඟුන් හිඳුනට අතුළ කළාලක් හො දෙවි පයින් ඇක්මිණ. මේ එහි ඵලයි.

2. බිම්සර රජුගේ මරණය.

රජහට මහත් වේදනා උපන. අහෝ! බුදෝ! අහො ධම්මො! අහො සඞ්ඝො! යි තුනුරුවන් සඳහන් කරනුයේ ම දගබ් අඟණෙහි[2] බහාලූ මලක් සෙයින් මෙළෙ.[3]

සව්මහරජ දෙව්ලෙව්හි වෙසවුණු මහරජාණන් පිරිවර ජනවසභ[4] නම් යක්ෂයක් ව උපන. පළමු සවරෙක්හි එහි උපද[5] මහත් සම්පත් වැළඳුයේය. සවරෙක්හි දඹදිව රජ වූයේයෑ. දැන් [6]සත්වනවර රජවැ සත් වන වර සපුරමින් ගොස් උපන.

---

1. දාගැබෙක්හී.
2. දාගැප් අස්තෙහි,
3. මළා.
4. {සතාසහ. / සහනාම්,
5. ඉපද, / උපන.
6. {සත්වනවර සපුරමින් / සත්වන රජව,

3. අජාසත්හට පුතකු ලැබීම.

එ දවස් අජාසත්හු පුතෙක් උපන. පුතුන් උපන් බව් දු[1] පියාණන් මළ බව් දු[1] දන්වන්නට දෙ පත එකාවට ම අළග. ඇමැත්තෝ පළමු "පුතු උපන් බව් කියම්හ" යි එ පත රද අත තුබූහ. රජහට එකෙණෙහි ම පුත්‍රසනා උපද.[2] සියල් සිරිරු පැතිරැ ඇටමුල් පැහැර සිටියේයැ. එකෙණෙහි ම පිය රජහුගේ ගුණ සඳහන් කොට "මා උපන් කල මපණන්හට දී[3] සනා මෙසේ ම උපන්නෙය. යව මපණන් විහිද්ව යි[4] යෙදීයැ. "කුමක් විහිද්වම්හ මහරජ!" යි අනෙක් පත අත තුබූහු. හේ[5] එපවත් අසා වලප්මින් මෑණියන් කරා ගොස් "අන්නැ මපණනට මා කෙරෙහි සනා හා පිය හෝයි පිළිවිත.

4. මව්බිසව පියාගේ පුත්‍ර සෙනහස දැක්වීම.

"ඔහු බාලපුතැ කුමි කියහි? තා ළදරු කල ඇඟිල්ලෙහි පොළෙක් නැඟි. එකල්හි වලප්නාහු සන්හිඳුවන්නට නො පොහොසත් වූ වාහු විතිස මණ්ඩලෙහි හුන් තා පිය රජහු කරා ගෙන ගියහ.[6] හේ තා ඇඟිල්ල මියෙහි තිබීය. පොළ මියෙහි[7] ම සිල්විය. හේ තා කෙරෙහි සෙනෙහෙන් ලේ මුසු පූයා දමා නො පියා ම ගැළපිය. තා පියා තා කෙරෙහි සනා මෙබන්දැ යි කිහු. හේ වැළැප වැහැස පියාණන් සිරිරු ගළකිස කැරැවී.

5. අජාසත්හු රාත්‍රී භයකරන පරිදි.

එකල්හි රජගහා නුවර සැණකෙළියෙක් විය. නුවර වැස්සෝ එ නුවර දෙව්නුවරක් සෙයින් සදැ සැණවෙස් ගෙන දෙවියන් සෙයින් සැණකෙළි කෙළිත්. අජාසත් රජ පණුරසීපොහෝ දවස් රැ සරු සඳුරැසින්

---

1. බමුද්.
2. උපද.
3. පණවත්. / පතස්වත්. / පියාණන්වද්,
4. මයිත්වයි.
5. නෝ,
6. ගියේය,
7. මුවයෙහි,

රිදීසොළෙන් නික්මුණු කිරිදහර සෙයින් රිදී විමනින් නික්මුණු මුතුවැල සෙයින් සමන්කුසුම්දම් සෙයින් දිලියෙන රාත්‍රියෑ නිරිඳු මහලෙහි[1] ඇමැතිමඬුලු පිරිවරා සේසත්යට ගනරන් මුවා අස්නෙහි හුන්නේයි කුමට හුන්නේය? යත්. නිදි වළ කානු සඳහා හුන්නේයි

මෙ රජ පියා මළ තැන් පටන්ගෙන නිදන්නට ඇස පියාලූ ඇසිල්ලෙහි ම සියල් සිරිර[2] සැත්දහස් ඔත්සාල් සෙයින් හඬමින් ම පුබුද්දි. "මහරජ! කිමැ'යි පුළුවුත්සාල්හි වළහයි. එයින් ඔහට නිදි නො රිසියෙයි. මෙසේ නිදි වළකානු සඳහා හුන් රජ මෙ රෑ සඳරෑයින් රමණීය යෑ, අභිරූප යෑ, දශීනීයයෑ, සිත් පහදවයි. කවර මහණ බමුණුකොනෙකුන් කරා යම්හ"යි, කා කරා ගියකල අප සිත් පහද්දි යි උදන් ඇනි.

එ අසා එක්තරා රජමහඇමැත්තෙක් මහරජ! පූරණ කාස්සපයා[3] කරා එළඹෙන්නෙය, එකල සිත් පහද්දි යි කිය. රජ එ අසා නො බිණීය. අනෙක් ඇමැත්තෙක් මක්ඛලී ගොසාලයා කරා එළඹෙන්නෙය යි කිය, අනෙකෙක් අජිත කෙසකම්බලයා කරා එළඹෙන්නෙය යි කිය. අනෙකෙක් පකුධකච්චායනයා කරා එළඹෙන්නෙය යි කිය. අනෙකෙක් සඤ්ජයබෙලට්ඨපුත්‍රයා කරා එළඹෙන්නෙය යි කිය. අනෙකෙක් නිගණ්ඨනාථපුත්‍රයා කරා එළඹෙන්නෙය, එකල්හි සිත් පහද්දි කිය.

මෙසේ ඇමැත්තන් තමන් තමන් ලදගත් නුවටැජරන් කි කල්හි රන්වන් මියුරුරස ඇති අඹපකක් කෑවි[4] පුරුෂයක්හු තමා අත තුබූ කදුරු පකක් දැක දමාපියන්නක්හු සෙයින් නො ගිවිස නො බැණ හිඳ තමහට නො දුරු තන්හි[5] හුන් ජීවකයනට හැයි සබඳ! නො බැණ හුන්නෙහි නො යි? කිය.

1, නිරිඳි මහලෙහි. 2, විගස ම සියලු ශරීරයෙහි.
3, පුරාණ කාශ්‍යපයා, 4, කාකෑවි, 5, නුදුරුස,

රජු මෙතෙක් පරිභාෂා කරනු ජීවකයන් සඳහා කොළේ යි. කුමටය? යත්. තමා ඇරැ බුදුන් දක්වනු සඳහා යි. තෙමේ ගොස් දක්නට නොහැකි නිසි ද? යත්. තමා මහාපරාධයෙන් ගොස් දක්නට නො නිසිම්, ජීවකයා පිටිපස හිඳ බුදුන් දුට මැනවැ යි මෙතෙක් පරිභාෂා කොළේ.[1]

රජුගේ අභිප්‍රාය ජීවකයෝ නො දනිත් ද? යත්. දන්නි. වැලි කුමට නො බැණ හුන්නාහු ද? යත්. විබෙච් පසිඳුනා සඳහා ය. කිසේය? යත්. එපිරිස නුවටැජරන් සදෙනා ලද ගත් ඇමැත්තෝ බොහෝ දෙන රැස්වූවාහු ඔහු මා බුදුගුණ කියනට වන්කල අතුර තුරෙහි නැඟී තමන් තමන් ලද ගත් නුවටුන්ගේ ගුණ කියති.

එසේ වන්නා හා මා[2] කියන බුදුගුණ නිමාමට නො යෙයි. රජ වූකලී රෙප මැ මොවුන්ගේ නුවටැජරන් සාරා එළඹ නිස්සාර බැව් දත්තෙන් ඔවුන්ගේ ගුණ කථායෙහි නො සතුටුව මා පුළුවුස්සි, එකල්හි මම් බුදුන්ගේ ගුණ කියා බුදුන් සාරා ගෙනයෙමි. රදුංගේ අභිප්‍රාය දනුතු දී[3] විබෙච් පසිඳුනා සඳහා නො බැණ හුන්හ. එකල්හි රජ ඇමැත් තිතිගේ බස් අසා මම යමක්හු යමක්හු බස් නො ඇසියටි යෙමි ද හෙමැ හෙමැ බෙණෙයි, යමක්හුගේ බස් ඇසියටි යෙමි ද හේ ම නාරජ වස[4] වළඳා සිටි ගුරුළක්හු සෙයින් නො බෙණෙයි, මට මහත් පිරිහිණෙකැ යි සිතී. සිතා බලා "ජීවක උපශාන්තවූ බුදුන්ගේ සච්ය, තෙමේ ද උපශාන්තය, එබැවින් වත් සපත් මහණක්හු සේ නො බැණ හුන්නේය. මා නො බුණු කල හේ නො බැණෙයි. ඇතක්හු මඬනාකල[5] ඇතක්හු ම ගේ පසින් මැඬිය මැනැවැ"යි සිතා, ජීවකයන්ට මේ ඇමැත්තන් තමන් ලදගත් මහණුන්ගේ ගුණ කියන්නන්

---

1. කොළෝ. 2. හැමැ. 3. දනුතුදු
4 නාරජ මස. 5. මඩුනාකාල.

මුව නො පොහොයි. මොවුන්සේ ම නාද් ලදගත් මහණහු නැද්ද? කිම දිළිඳුහි ද? මපියේ නට ඉසිර නො දුන් නේ ද? නොහොත් සැදූහැ නැත්තෙහි දූ? සි පිළිවිත්. එකල්හි ජීවකයෝ මා ලවා මේ රජ බුදුන්ගේ ගුණ කිය වියපි බඳ1 දූත් මා නො බැණ හිඳිනට කල් නො වෙයි. යම්සේ මේ ඇමැත්තෝ රදු වැඳ හිද2 තම තමන් ලදගත් නුවටුන්ගේ ගුණ කිහු ද. එසේ බුදුන් ගුණ නො කිව මැන ව යි, හුනස්නෙන් නැඟී බුදුන් වසන දස බලා පසඟ පිහිට්වා වැඳ නියරසින් දිලියෙන ඇඳිලි බැඳ මහරජ! මා යන්තම් මහණක්හු සාරා එළඹෙති නො සිතව.

* * * * * * * * * * *

මහරජ! අපබුදුහු මාගේ අඹවනයෙහි අඩ තෙළෙස්යල්සියක් සහුන් පිරිවරා වැඩවෙසෙති. තොප වැනි සියනු දු දහස්නු දු සුවහස්නු දු සිත්ගෙන බණ කියති. රිසි සේ එළඹ පැන පුළුවුස් නෙය යි කිහ.

රජු බුදුන්ගේ ගුණ අසත් අසත් සියල් සිරිරු3 පස්වණක් ප්‍රීතීන් අතුරු නැතිවැ පිරිහියේ. හේ එම විගස බුදුන් සාරා යාටිව මා මෙවේලේ බුදුන් සාරා යන්නාහට අතික් කිසි සොනෙක් යානයක්4 යොජන්නට නො නිස්සඟ ජීවකයා විනාය යි; සිතා සබඳ ජීවකය! යා නො ම ඇතුන් සඳුවා යි කිය. අනෙක් අශ්වයාන රථයාන ඇත ද ඇතුන් ම සද එළවන්නට කියනු කුමටය? යත්. උත්තමයන් සාරා යනකල උත්තමයානයෙන් ගිය මැනවිනු දු, අශ්වයාන රථයාන ශබ්දයෙන් දුර ම එහි හඬඇසෙන්නනු දු පස්පසැ5 යන්නාහට ද් ගජයානයෙහි හඬ නො ඇසෙන්නනු දු, නිවි බුදුන් සාරා නිවි යානයෙන් ගිය මැනවැ යි සිතා ඇතුන් සද එළවන්නට යෙදී.

---

1. බවද. / බැඳිද,
2. හඹුවෙසි, / මැද හිඳ,
3. සිරුර,
4. යානයෙක්,
5. පස්පස්, / පසුව, / පසුපස්,

ජීවකයෝ රජ මෙ වේලේ බුදුන් දක්නට යෙම් යෙයි. රජ්ජුරුවන් සතුරෝ බොහෝහ. ඉදින් අතරමඟ කිසි අන්තරායෙක් වීනම් අන්හු මා ගරහති. "ජීවක රජ මා කිවා කොරෙයි, අකාලයෙහි රජුගෙන නික්මෙයි" කියා ය. බුදුනු දු ගරහති. "මහණගොයුම් තමා කිවා කොරෙතී කියා කල් නො නහමා කළාකොරෙයි" කියාය. එබැවින් මයිද් බුදුනු ද් නො ගරහන නියායෙන් යම්සේ රජහට රකාවල් සුසංවිහිත වේ ද එසේ කොරෙමි, සිතුහු. එක්බිති අඹුන්මිනිසුන් නිසා පුරුෂයනට භය නම් නැති. සුවයෙන් අඹුන්මිනිසුන් පිරි වරින් යෙයි. පන්සියක් ඇතින්නන් සදවා පන්සියක් මාග මුන් පිරිමිවෙස්[1] ගන්වා අයි තෝමර ගත් අත් ඇතියාහු[2] රජු පිරිවරව යි[3] කියා වැළිදු සිතුහු.

මෙ රජහට මෙ අත්බැව මහ එලයට උපනිශ්‍රය නැති, බුදුහු උපනිශ්‍රය බලා ධම් දෙසති. එසේ බැවින් මහජනා රුස්කරවමි, එසේ වන්නා හා බුදුහු කිසිකොනකුන්ගේ උප නිශ්‍රය හෙයින් ධම් දෙසති. ඒ දෙසුන් මහජනයාහට[4] උපකා රයට ම වැටෙයි යි, එබඳනට කියා යවූහ. නුවර බෙර පියවි කරවූහ, "අද රජ බුදුන් කරා යෙයි, හැමදෙනා තම තමන්ගේ කැරුමිණි තුබූ පරිද්දෙන් අවුදු රජහට අරක්ගන්නෝය යි" යෙදූහු. එකල්හි මහජනයෝ "රජ බුදුන් දක්නට යේ ල. එ ධම්දෙසුන් කිබඳ? හෝ "සැණකොළියෙන් කිම?" එයට යම්හ යි. හැමදෙන ගඳමල් ගෙන ගොස් රජු පෙරමඟ බලා මහ සිටියෝ.

---

1. පිරිවෙස්,
2. { ඇතිව, ඇතියාව,
3. { රජු පිරිවරයව යි, පිරිවරා යව,
4. මහජනය හටද,
1. වෙයි,

අභ්‍යාස ප්‍රයොග.

සාමාන්‍ය ප්‍රශ්න. 1 "දුගබ් අහඹෙහි බහාලූ මලක් සෙයින්" මෙයින් කුමක් ව්‍යක්ත කෙරේද? එහි අද හස කිම? 2. "සත්වනවර සපුරමින් ගොස් උපන" මේ කුමක් දැක්වීමට කියනලදද? 3. බිම්සර රජුගේ පුත්‍රස්නෙහය ප්‍රකටවන සැරුණු දක්වනු. 4. අජාසත් කුමක්හෙයින් රැ නො නිදයි ද? 5 සෙසු ඇමැතියන් කථාකරද්දී ජීවකයන් තුෂ්ණීම්භූතවීමට හේතු දක්වනු. 6. බුදුන් දක්නට ඇත්යාන පිළියෙළකිරීමට ද ඇතින්නන් ම යෙදීමට ද හේතු කවරහුදැයි ලියනු. 7. "රිදිකෙළෙන් තික්මුණු කිරි දහර සෙයින්" "නාරජ වස වළඳ සිටි ගුරුළක්හු සෙයින්" "වත්සපන් මහණක්හු සේ" මෙහි අදහස් කෙසේද? උපමෙය පක්ෂය පැහැදිලි කරනු. පොතෙහි දැක්වෙණ ලෙස රාත්‍රි වර්ණනාවක් ලියනු. 8. එකල සැණකෙළි පැවැත්වූ පරිදි දක්වනු. එය කිනම් ක්‍රීඩාවක් ද? කවරකලෙක ආරම්භවී ද?

ව්‍යාකරණ ප්‍රශ්න. "විහිද්වම්හ"–ගැලපීය–දන්නි–පුළුවුස්සි–නොනිස්සහ–මේ ක්‍රියාවන්ගේ නිෂ්පත්ති සොයනු. 2. "කියනුද්– දිළිඳුහි? මේ කවර ක්‍රියාකොටසක් ද? එහි ධාතුප්‍රත්‍යයන් දක්වනු. 3. "දැන් මා නො බැණ හිඳිනට කල් නො වෙයි" .මෙහි පදවිභාගය කරනු.

පුරාවිද්‍යා ප්‍රශ්න. ජීවකගේ අඹඋයන කොහි වී ද? කෙසේ පිහිටියේ ද? එහි වර්තමාන තත්‍වය දක්වනු.

අමෘත බිඳු 3.

අජාසත් රජ. iii.

ප්‍රධාන කරුණු.

1. රජ මහ පෙරහර. 2. අජාසත් රජු අඹවනයට ප්‍රවිෂ්ටවීම. 3. රජුගේ සිතු පැහැදීම හා බුහුතුල පහලවූ සිතිවිලි. 4. අජාසත් රජු පැන පිළිවිසීම. 5. රජු බුදුන් සරණ යාම.

එසඳ ජීවකයෝ "මහරජ! ඇතුන් සඳු එළවූයේය. කල් දන්නේ මැනවැ" යි කීහු.

(1) රජ මහ පෙරහර. රජ පන්සියක් මාගමුන් පන්සියක් ඇතුන් නංහා, තෙමෙහෙ මඟුල්ඇතු නැඟී, මිණිදඬු වැට පහනෙන් එකාලුකොට, මහත් ආනුභාව යෙන් නුවරින් නික්මිණි.

එකොණෙහි පන්සියක් මාගම්හු පිරිමිවෙස් ගෙන හිස් වෙළා දසරුයෙහි කඩු තබා මිණිතෝමර ගෙන නික්මුණහ. ඔවුන් එක්බිති සොළොස්දහසක් නළුවෝ රජ පිරිවැරූහ. ඔවුන් එක්බිති කුරු කුද්1 කිරාතා දිහ. ඔවුන් එක්බිති රජ ගේ රක්නා රජුකොරෙහි විස්වස් ඇමැති පුරුෂයහ. ඔවුන් එක්බිති විසිතුරු වේශ විලාස ධරවූ සැටදහසක් මහා මාත්‍යයහ. ඔවුන් එක්බිති නො එක් පළඳනෙන් 1සැදි නන් නන් අවි ගත් විද්‍යාධර තරුණයන් බඳු අනූදහසක් පමණ

---

1. කුරුකුදු. 2 { පළඳනාගෙන්. පලඳිනීන්.

රැටි දරුවහ.[1] ඔවුන් එක්බිති සියක් වටනා පිළී හැද පන් සියක් වටනා පිළී එකස්කොට බහාලා නහා ගඳපිලවුන් ගත් රන්මල් ආදි නන් බරණින් සැදුණු දසදහසක් බමුණෝ දකුණු අත් ඔසවා ජයශබ්ද ගොහිමින් යෙති. ඔවුන් එක්බිති පසඟතුරු ගත් පුරුෂයෝ පසඟතුරු වයමින් යෙති. ඔවුන් එක්බිති දුනුපෙළය[2], ඔවුන් එක්බිති වෙර පැහැර යන ඇත්පන්තිය, ඔවුන් එක්බිති ගෙලෙන් ගල පැහැර යන අස්පන්තිය, ඔවුන් එක්බිති එහි එහි පැහැර සිටි රථ පන්තිය, ඔවුන් එක්බිති දසරියෙන්[3] දසරියෙහි පැහැර සිටි යෝධයහ, ඔවුන් එක්බිති තමන් තමනට තිසි ආභරණ සම්පතින්[4] වොරජනා අටලොස් සේනිහ සි, යම්සේ කෙළවර සිට වුහුව් සරයෙක් රදුකා ෆා නො පැමිණේ ද, එසෙයින් ජීවකයෝ රජුගේ පිරිස් සංවිධාන කොට "ඉදින් රජහට කිසි උපද්‍රවයෙක් වේ නම් හැමදෙනහට පෙරටුව රජහට දිවි දෙමි" සි තුමූහු රජුට වැළැත ගෙන යෙති. ලියවැට මිණි දඬුවැට පහන් මෙතෙක් සියය, මෙතෙක් දහසය, යන පමණ නැති.

(2) අජාසත් රජු අඹවනයට ප්‍රවිෂ්ටවීම.

මෙසේ මහත් රාජානුභාවයෙන් එ රජහු දෙතිස් මහදෙරක් හා සුසැට සුළුදෙරක් ඇති රජගහා නුවර පැදුම් දෙසෙහි දෙරින් නික්ම නුවර පවුර හා ගිජුකුළුපව්ව හා දෙ අතුරෙහි ජීවකයන්ගේ අඹවනයට වෙත්වැ ගියකල්හි "බුදුන් සාරා යනකල නිශ්ශබ්දවැ ගිය මැනවැ සි, රජගෙහි ම ඔට ජීවකයන් කිසෙයින් බෙර නො ගැසිය දී මහත්කොට නො කිණිය දී යන රජහට භය උපන. කුමටය? යත්. අඩතෙළෙස් යල් සියක් සඟුන් වසන අඹවනයේ

---

1. දරුවෝත, 2. { බෙළය / බැලල. / බෙහලය } 3. { දසරුවෙන්. / දූසැරියෙන්. } 4. සම්පතින්. 5. { දියා. / දින. }

කිබිස්නා හඩෙකු දු පොවා[1] නැති. ජීවක "මා නුවරින් පිටතට නෙරගෙන පෙරටින් බලකායක් දක්වා මා මරා තෙමේ රජ වියැටිය, මේ පස්ඇතක්හට බලඇත්තේය, මා වැළැත ගෙනයෙයි. මා සොරෙහි ආයුධගත් එක පුරුෂයකුදු නැති. මට කැරුණේ මහත් පිරිහිණෙකැ යි, සිතා බියපත්ව, ජීවකය! මා නො නස්හි දූ" යි කිය. එකල්හි ජීවකයෝ "මේ රජ මාගේ මාත්‍රා නොදන්ති.[2] මම් ලිහිඹිත්තකුදු[3] දිවි නො ගළවම්. රජු නො අස්වැසීම් නම් නස්සි යි" සිතා තරකොට අස්වසන්නාහු, "මහරජ! නො බා නො බා පෙලෙ බලා ගන මණ්ඩලමාලයෙහි පහන් දිලියෙන්නාහ"යි කීහ. එකල්හි රජ දෙරටුවෙන් පිටත ම සිට ඇත්පිටින් බට. බැස කිම සිටි විගස ම බුදුන්ගේ තේජස් රජු වෙර පහළ.

එකල්හි රජහට එ සොණෙහි සියල් සිරිරින් සෙවද හන්සළු පෙලා පියත පමණ විය. තමාගේ අපරාධ සඳහන් කොළේ මහත් භය උපන. හේ ඉඳුරා බුදුන් කරා යන්නට නො පොහොසත් වූයේ ජීවකයන් අත ගෙන අරම් සැරි සරන්නක්හු සෙයින් ජීවකය! තා මේ කැරුවූ සේ යහපත, මේ කැරුවූ සේ යහපතැ, යි ගුණ කියමින් අනුක්‍රමයෙන් මණ්ඩලමාලයට සම්ප්‍රාප්ත වැ, බුදුහු සබඳ! කොහි යයි පිළිවිත්. කුමට පුළුවූස්සි යත්! ඇතැම්හු නො හඳුනන්නෙන් පිළිවිත යෙත් හේ අකාරණියැ. මෙ ළදරුකල පියරජු හා ගොස් බුදුන් දුටුවිරිය. පැසුළු පාපමිත්‍රයන්ගේ සැසැගින් පියරජහු මරා බුදුන් මරන්නට දුනුවාවන් මෙහෙයා නාලාගිරිහි විහිද මහත් අපරාධයක් කොට සිටියෙන් බුදුන් කරා නො වන්නා මිස නො හඳුනන්නේ නො වෙයි. බුදුහු වනාහි දෙතිස් වරලකුණෙන් හා අසූ අනුව්‍යඤ්ජනයෙන් සැදි සිරිරු ඇති සව්හ, සවණක් රුසින් දිලියෙමින් සියලු අරම් බබුළුවා තරුපිරිවරනලද පුන්සඳක් සෙයින් මහණ ගණා පිරිවරා

1. පවා.
2. නොදත්තෙය.
3. {ලිහිඹිත්ල කදු. / ලිහිඹිල්ල ෆුදු.}

මණ්ඩලමාල මධ්‍යයෙහි වැඩහුන්නාහ. බුදුන් කවර නො හඳුනති? මෙ රජ තමාගේ ඉසුරු ලීලායෙන් පිළිවිත. හඳුනතු දු නො හඳුනන වන් ව පුළුවුස්නේ රජුන්ගේ සිරිනි.

ජීවකයෝ වනාහි රජුගේ බස් අසා මෙ රජ පොළොව සිට පොළොව් කොහි ය? යන්නක්හු වැන්න, අහස් බලා හිර සඳ කොහි ය? යන්නක්හු වැන්න, මෙරමුල සිට මෙරගල කොහි ය? යන්නක්හු වැන්න.

බුදුන් පෙරට සිට බුදුහු කොහි ය යි පුළුවුස්නේය. එසේ බැවින් මොහු බුදුන් දක්වමි ඇඳිලි බැඳ "මහරජ! පෙරටොහු අප සම්මාසම්බුදු හ මැදටැඹ නිසා පැදුම් දස බලා සඟපිරිස් පිරිවරා වැඩහුන්නාහ යි කීහු.

(8) රජුගේ පැහැදීම හා ඔහු තුළ පහළවූ සිතිවිලි.

රජ බුදුන් කරා එළඹ සනනට ගනට නො කොට එක් තැනෙක්හි බුදුන් නො වැද ම සිට නිවාත පොහොණක්හි පිපි රත් පියුම් වනයක් සෙයින් නො බෑණ ම වැඩහුන් සඟුන් දිට, එහි එක්කෙනකු දු අතක් සොල්වනුවෝ නො ද ඇති, පයක් සොල්වනුවෝ නො ද ඇති, සව් බරණින් සැදි නළුපිරිස් පිරිවරා බුදුන් පෙරට සිටි රජ හෝ රජ පිරිස් හෝ එක්කෙනකු දු නො බැලුහ. හැම සඟහු ම සවණක් පැහැයෙන් දිලියෙන බුදුන් බලා හුන්හු රජ සඟුන්ගේ උපශමයෙහි පැහැද මඩ නැති පහන් විලක් සෙයින් සන්හුන් ඉඳුරන් ඇති සඟුන් මෙ පුන පුනා බලා "මේ උපශමය මපුතු උදා කුමරහට වේව යි සිතා උදන් ඇනී.

ඔහු පැවිදිව මේ සඟුන් සෙයින් උපශාන්තවනු සඳහා නො වෙයි, මෙ රජ සඟුන් දැක පැහැද පුතු සඳහන් කෙළේ. දිලිඹි[1] දූයක් ලදින් හෝ අපූම් දූයක් දැක පියවූ තැයන්

1. දිලුඹි.

මිතුරන් සඳහන් සරනු ලොකයාගේ සිරිති, එසඳ බුදුහු රජුගේ සිත්සසර[1] දැක, මෙ රජ මා හා සමග සාථාකරන්නට නො පොහොසත්වූයේ බික්සඟුන් බලා පුතු සඳහන් කොළේ, මා නො බණනා කල්හි මෙ රජ කිසිදෙයක් කියන්නට නො තිස්ස. මුහු හා සමඟ සාථාකළ මැනැවැ යි, මහරජ! යම්සේ උස්තැන වට දිය නතු තැනට යේ ද, එසෙසින් ම සිත් තම පුතු කරා නතුවිය යි වදළෝ.

එසඳ රජු සතුටුව "බුදු ගුණ අචින්ත්‍ය පරිදි මම් දැන් දන්මි, මාසේ බුදුනට අපරාධ කළ කෙනෙක් නම් නැති. මා විසින් බුදුන්ගේ අක්වටා[2] රජු මරනලද, දෙව්දත්හු කියමන් ගෙන දුනුවාවන් මෙහෙයීමි, නාලාගිරිහි විහිද්වීමි,[3] මා නිසාය දෙව්දත්හු ගල්කුළු වුහුටුයේ යැ, මෙසේ අපරාධ ඇති මට බුදුහු ප්‍රිය තෙපුල් කරනදූය. අහෝ! යගහ,[4] බුදුහු පස්වැදූරුම් තාදී[5] ගුණයෙහි පිහිටියාහ, මෙබඳු ගුණමුහුදු සථරුන්[6] තබා බැර සථරුන්[6] පිරියස්සම්හ යි,[7] සොම්නස් වැ පුතු තමහට පිරිය පරිදි කියා බුදුන් පසඟ පිහිටුවා වැඳ සඟුන් වඳුත්, බුදුනට පිටිපා වැන්දමනා වෙයි, සඟනට ඇඳිලිබැඳ එකත්පස් ව හිඳ පැන පුළුවුස්නට අවසර ගත්, එසඳ බුදුහු– "පිසියුණුදෙයක් පුළුවුස. මහරජ!"යි සජිඳ පවරුණෙන් පැවරුහු, මෙසේ "බුදුන් සජිඳ පවරුණෙන් පැවරූ කල්හි රජ– පැන පුළුවුස්නේ "වහන්සේ! ඇත්අරු අස්අරු රියසැරි ආදීහු තමන් තමන් දන්නා ශිල්පයෙහි

(4) අජාසත් රජු පැන පිළිවිසීම.

ඵල මෙ ම ජන්මයෙහි ලැබෙති, රජකුලෙන් මහත් සම්පත් ලදින් තුමූහු දු සුවයෙන් වැටෙති,[8] මව්පියනු දු අඹුදරුවනු දු මිත්‍රයනු දු ඇමැත්තනු දු සුවයෙන් පස්වටති, මහණ බමුණනට සුගතිය උපද මහත් සම්පත් වළඳනට තිසි දනු දු දෙති.

1. ක්ෂිත්සරසර,
2. බුදුන් අග්වටා,
3. {විසිදුවමි / විදවම
4. යහානා,
5. {ආදි / තාදි
6. සතරුවන්,
7. පිරිසෙස්නත්,
8. වැසෙති,

වහන්සේ! එසෙයින් ම මෙ ම ජන්මයෙහි මහණුව ම එල දක්විය[1] හැක්ක හො? යි පිළිවිත, බුදුහු- පැන නො විසඳ ම සිතූහු "තීර්ථකයන්ගේ ලදගත් ඇමැත්තෝ මෙයට ආවාහ. හලමනා පක්ෂය ද් ගනමනා පක්ෂය ද් දක්වා කියනකල්හි අප මහරජ මෙයට මහත් උත්සාහයෙන් මෙ අය, ඔහු ආ තැන් පටන්ගෙන මහණ ගොයුම්හු මහණුන්ගේ කෝලාහල හා සටන් කියති යි මුමු නනු[2] වෙති. සකස්කොට බණ නො අසති, රජ කියන සාලට[3] දහනට නො තිස්සහ. රජු ම අනුව පවතියි. එබැවින් රජු ම හාර සාළ මැනව යි **මහරජ**– මෙ පැන සෙසු මහණ බමුණන් පුළුවුත්විරියෙක් හා ඇද්ද? ඔවුනො වුන් කී දැ නා සදහන් ඇත්හොත් යා යි වදාළහ. එකල **රජ**– පණ්ඩිත ප්‍රතිරූපකයනට කියනු දුක, ඔහු පෙදෙහි පෙදෙහි අකුරෙහි අකුරෙහි දෙස් දෙති, ඒකාන්ත පණ්ඩිතයෝ වූකල කියනු අසා මනාකොට කිව පසස්ති. නො සේ කී දැයක් ඇත ඉදිකොට දෙති.[4] බුදුන් හා සම ඒකාන්ත[5] පණ්ඩිත කෙනෙක් ඇත්තාහු නො වෙති, එබැවින් කිව මැනවැ යි සිතා, වහන්සේ! මම එක්සමයෙක්හි පූරණකාස්සප නම් නුවටහු කරා ගොස් මෙ ම නියායෙන් පැන පුළුවුත්මි, හේ "පව්කැමි දු පින්කැමි දු එල නැති" යනාදි විසින් තමාගේ දශීන කිය, "අම්බං පුට්ඨෝ ලබුජං ව්‍යාකරෙය්‍ය" යනු සෙයින් මා පුළුවුත්තා තබා අනෙකක් කියයි, මම ඔහු කී දය නො ගිවිස "අසුවල්රජ තමාගේ විජිතයට ගිය මහණට[6] මෙනම් දෙයක් කෙළේල" යනු නො කිය වුව මැනැවින් නො බැණ නැඟී ගියෙමි, යි කිය. මේ නියායෙන් ස නුවටැජරන් සාරා එළඹ පැන පුළුවුත් සේ, ඔවුන් තමා පුළුවුතු දු තබා තමන් තමන් දශීන දක්වූ සේ, එහි තමා නො සතුටු සේ, කියා වහන්සේ! මම වැලි පෙළා තෙල් නො ලබන්නක්හු

---

1. දක්ක,
2. මුමුනාවු,
3. කියනතුරු,
4. ඉදිරිපත්කොට, ඉදිත්කොට
5. එකාන්තයෙන්,
6. මහණබමුණට.

සෙසින් තිර්ථකයන්ගේ දශිනයෙහි සාරයක් නො ලදින් වහන්සේ පැන පුළුවුස්සනට ආමි. වහන්සේ! මෙ ම ජන්ම යෙහි මහණුවම ඵල දක්විය හැක්ක හෝ'' සි කිය,

එකල බුදුහු–කියග මහරජ තා මම් පුළුවුස්මි. තාගේ කිඝරුදසෙක් පින්පල පෙළහර යැ මේ, අජාසත්රජු ද මිනිසැ, මම ද මිනිස්මි, මෙ රජ පස්කම් ගුණෙන් පින පිනා රජ කොරෙයි, දෙව්රජක්හු වැන්න, මම් ඔහුගේ දස්මි, මා මුහු සේ ම පින්කළ මැනැව, ඉදින් දන් දෙම් නම් රජු එක්දවසක් දුන් දන් සියක්භාග කළ කල එසින් එක්භාග යක් පමණ දනක් මම් දිවිපමණින් දෙන්ට නො තිස්සෙමි, ඔස මා පැවිජිව සිල්රක්ක මැනව 'සි පැවිජ විය, පැවිජි ව සිල්වත් ව අපිස් සතොස් වැ වෙසෙසි. ඔහු එසේ වසනකල "මා දසු මට මෙහෙයට එන්නේය, සි හා කියහි දූසි" වදාළහ.

වහන්සේ! එසේ නො කියම්හ, ඇපි ම2 ඔහු වැඳ පුදා දන් දෙම්හ "සි කිය. කියග,

මහරජ–ඉදින් එයඑසේ වීනම් මෙ ම ජන්මයෙහි මහණුව ම මේ ඵල නොවේ ද සි වදාළහ. වහන්සේ! එකානත යෙන් මෙ ම ජන්ම යෙහි මහණුවම මේ ඵලය සි කියැ

මහරජ– මෙසේ මා විසින් මෙම ජන්මයෙහි මහණුව ම පළමුවනඵල පනවන ලදූ සි වදාළහ.

වහන්සේ! මෙසෙසින් ම මහණුවම මේ ජන්මයෙහි ම අනෙක් ඵලයක් හා පැනවිය හැක්ක හෝ" සි කිය.

මහරජ! එසිත් තා ම පුළුවුස්මි, තට උපයා දෙන ගොවි යෙක් තාගේ විධි3 දූක මයිදු පින්කළ මැනවැ සි කුදු මහත් සැපත් පියා පැවිජි වැ සිල්වත් ගුණවත් වැ වැටෙසි. ඔහු

---

1. වනකල, 2. අප, 3. විහි-ඊට-වික්

එසේ වසත1 මාගේ ගොවි හි මට උපයා දෙන්ට එන්නේ ය යි හා කියති[2] දූ සි වදාළෝ.

වහන්සේ! එසේ නො කියමි. ඇපි ම2 ඔහු වැඳ පුදා **සතර** පසයෙන් දන්දෙම්හ යි කිය. කියග

මහරජ! ඉදින් එසේ වේ නම් මෙ ම ජන්මයෙහි මහණුවම මේ ඵල වේ ද? නො වේද? යි වදාළෝ,

හන්සේ හ! ඒකාන්තයෙන් ම මෙ ම ජන්මයෙහි මහණුව ම ඵලය"යි කිය.

මහරජ– මෙසේ මා විසින් මෙ ම ජන්මයෙහි මහණුවම දෙවනඵල පනවනලදූ" යි වදාළෝ.

වහන්සේ! මෙම ජන්මයෙහි මෙයට වැඩි මහණුවම අනෙක් අතිශය ඵලයක් හා පැන්විය හැක්ක හෝයි කිය. ඔස

මහරජ– අස දනැ යි බුඩෝත්පාදයෙහි පටන්ගෙන අග්‍රත්ඵලය පසීනනකොට අහස්ගඟ වතුරු සෙයින් ධම් දෙසා **මහරජ**–මෙ ම ජන්ම යෙහි මහණුවම මේ ඵලය මෙයට වඩා උතුම් අනෙක් අතිශය ඵලයෙක් නැනැ යි වදාළෝ.

(6) රජු බුදුන් සරණ යාම

එකල්හි රජ තන්හි තන්හි සාධුකාර දී ආදි මධ්‍ය–වසාන පහසා සකස්කොට අසා * * * * * * * පස්වනක් ප්‍රිතින් පිනනලද සිරුරු ඇති ව දිවි පියම්නි දූ3 සරණ නො පියමි, තුනුරුවන් සරණ ගොස් * * * * නමා පියා ධම්රජනු[4] මැරූ වරද කමවා වැඳ තුන්යළක් පැදකුණු කොට තිය රශින් දිලියෙන ඇදිලි මුදුනෙහි පිහිටුවා පැනෙන නාක් නැන බුදුනට අභිමුඛවෙමින් ගොස් දස[5] විජහනතැන සිට බිම පසඟ පිහිටුවා වැඳ බුදුන්ගේ ගුණ සඳහන් කොරෙමින් නුවර ගියේ.

---

1. වශනකල, 3. අප, 5. පියරජහු,
2. කියත්නොති, 4. දිවිපියත්, 6. දසුන්-අසුන්

අභ්‍යාස ප්‍රයොග

සාමාන්‍ය ප්‍රශ්න. 1. රජු බුදුරදුන් දක්නට ගමන්සාල පෙරහරෙහි සවරූප දක්වා වාක්‍යයක් ලියනු. 2. ජීවකයන් කෙරෙහි අජාසත් රජතුළ බිය ඉපදීමට හේතු දක්වනු. 3. දෙතිස් ලකුණු- සවණක්රැස්, කවරහුද? 4. ශ්‍රාවකයන් වහන්සේ වැඩහුන් පරිදි කෙසේද? 5. ඒදුටු අජාසත්රජුට කුමක් සිතුණිද? 6. මේ ජීවිතයෙහි ම පෙන්විය හැකි ශ්‍රමණඵල දක්වනු.

ව්‍යාකරණ ප්‍රශ්න. 1. "ජීවකයෝ මහරජ! ඇතුන් සදු එළවූයේය. කල් දන්නේ මැනවැ යි කීහු." මෙහි ක්‍රියාපදයන්ගේ ධාතු ප්‍රත්‍යයන් දක්වා උක්තපද වෙන් කොට ලියනු. 2. රැව්දරුවහ-පහළ-සිරිති- මේ පද කවරහුදැ යි පැහැදිලි කරනු. 3. "පුතු තමහට පිරිය පරිදි- මුමු නගු වෙති- පැන පුළුවුස්නට- දිවිපම ණින් ස නුවටැ ජරන් කරා- පැනෙන තාක් තැන-" මෙහි ඇති විබත් කවරහු ද? කවර අරුත් සලකා එසේ යොදත් ද?

ඉතිහාස ප්‍රශ්න. 1. පෙර රාජබලය කවර තන්‍ඩයක පැවැත්තේද? එදත් අදත් වූ වෙනස විවෙචනය කර දක්වනු 2. සනුවටැජරන්ගේ සවරූපය දක්වනු, 3. ඔවුන්ගේ සමයයෝ අදත් පවතීත් ද? ඒ කවරහු ද?

පුරාවිද්‍යා ප්‍රශ්න. ගිජුකුළුපව්ව කොහි පිහිටියේ ද? එහි වර්තමාන තත්‍වය කෙසේ ද? 2. අඹවනය කා අයත් ද? එය කුමක්නිසා එ නමින් පළවී ද?

මහාවිජිත රජතුමා.

ප්‍රධාන කරුණු.

1. මහාවිජිත නාමය. 2. දනවෙතනා පහලවීම. 3. යාග ශබ්දය. 4. පෙරෙවි බමුණු දුන් මහඟු අවවාද. 5. රට සමෘධ කරවීම. 6. යාගයට සෙස්සන් කැමැත්ත ලබා ගැනීම. 7. අෂ්ටාඞ්ග සමන්විත රජතුමෙක්. 8. චතුරඞ්ග සමන්විත පුරෝහිත බ්‍රාහ්මණයෙක්. 9. ත්‍රිවිධ චෙතනා.

---

1. මහා විජිත නාමය.

අතීතයෙහි දඹදිවැ මහාවිජිත නම් රජෙක් විය. හේ මුහුදින් පිරිහුන් මහත් පොළෝ මඩල දිනුයෙන් මහාවිජිත නම් වී. එ රජ ආඪ්‍යය, මහාධනය, මහාභොගය, බෝහෝ රන් රිදී ඇත්තේය. සතුටු[1] සොම්නස් උපද්නට තිසි රන්බඳුන් රිදීබඳුන් ඈ බොහෝ උපකරණ ඇත්තේය, බොහෝ ඇතුන් ඇත්තේය, බොහෝ අසුන් ඇත්තේය, බොහෝ රථ ඇත්තේය, බොහෝ රට ඇත්තේය, ධනයෙන් පිරුණු[2] ධාන්‍යයෙන් පිරුණු,: පිළියෙන් පිරුණු නොයෙක් දහස් කොට ගේ[3] ඇත්තේය.

2. දනවෙතනා පහලවීම.

එ රජ එක් දවසක් සතුරුවනින් පිරුණු[2] සොටාර දහස්බලා "මේ ධන කා රැස්කෙළේ යැ" යි භාණ්ඩාගාරයන් පිළිවිත. මහරජ! තොප පියන් මුත්තන් ඈ සත්වන කුල පරම්පරායෙහි වූවන් රැස්කළ ධනය" යී කිහ. ඔහු කොයට ගියාහ,, යී කිය. මහරජ! මිය පරලොව ගියාහ යී කිහ.

1, සතත්, 2. පිරුණේ, 3, කොටාගාර.

තමන් ඉපද වූ ධන නො ගෙන ගියෝ දෑ යි කිය. මහරජ කුමක් කියව? ධන තබා පියා යත් මිස[1] ගෙන යන්නාහු නො වෙති" යි කිහු. එකල්හි රජ නැවතී[2] සිරියහන් ගැබ ගොසින් හිඳ "මම මිනිස්ලොවැ විපුල මහත් භොග ලදුමි. මුළු දඹදිව් දෑනැ වෙසෙමි. පරපෙලව්හි ත් මා සුවවිඳුනා සඳහා මහත් යාගයක් කාළ මැනවැ යි සිතී.

3. යාගශබ්දය. යාග ශබ්දය දේවපූජායෙහි ද් සඞ්ගතික්‍රියායෙහි ද් දානයෙහි ද් වැටෙයි. මෙතනවූ කාල යාග ශබ්දයෙන් දන් කියත්.

4. පෙරෙවි–බමුණු දුන් මහගු අවවාද. "දන් දෙන්නන් එක් පණ්ඩිත පුරුෂයකු හා බැණ ගෙන දුන මැනවැ" යි තමාගේ පෙරවි බමුණු ගෙන්වා ගෙන "ආචාර්‍ය්‍යී! මම් මහායාගයක් කාටවියෙමි, පරලොව ද සුව විඳුනා සඳහා යැ. මට අනුශාසන කාළ මැනවැ යි කිය. එකල්හි පෙරවි බමුණු මේ රජ මහදන් දියවිවන, ජනවුයෙහි සොරහු බොහෝහ. ඔවුන් නො සන්හිඳුවා දන් දෙනකල ගෙනෙන කිරි දිහි සාල් ඈ දන සම්භාර චොලෝ ගන්ති, ජනපදය සොරුන් විසින් ආකුල වෙයි. එසේ වන්නා හා රජුගේ දන් බොහෝ කාලක් නො පවත්ති, ඕහු සිතට සුවද නො වෙයි, සිතා, "මහරජ– තාගේ රට සොරහු බොහෝහ. ඔවුන් නො සන්හිඳුවා බදු කර වුවර[3] ගන්නේ දහම් නො වෙයි, සොරුන් මැරුව හොත් ඔවුන්[4] සොරෙහි දිවි තුබූ කෙනෙක් තාගේ රට වැස්සන් පෙළති, තාගේ මේ සංවිධානයට පැමිණ සොරහු සන්හිඳෙති. එබැවින් තාගේ රට ගොවිකම්[5] කාටවියනට බිජු[6] බත් හුදලු කෑති සිහිවැල් දෙනු මැනවි, වෙළෙඳහම් කාටවියනට බඩු මිල දෙනු මැනව, සෑමි වැවියනට ඔවුනොවුන් තුබූපරිද්දෙන්

1. මියගනු, 3. වධකරන්නේ, 5. ගොවිතැන්,
2. වැලි, 4. ඔහු, 6. බිජ්,

නිමඳ1 දිවෙල්2 තනතුරු ගම් නියම්ගම් දෙනු මැනැව, එ මිනිස්හු3 තමන් තමන් කළමනා ගොවිකම් වෙළෙඳම් ඈ කම්හි යෙදුනාහු රට නො පෙළති, එසේ වන්නා හා තට4 ධන ධාන්‍යයෝ බොහෝ රැස් වෙති. සොරුන් නැති වන්නා හා මිනිස්හු භය නැති ව සතුටු ව දරුවන් ළමැඩි යෙහි නටවමින් දෙර නො පියාලා නිසැක ව දවස් යවනු වෙති" රජහට අනුශාසනා කෙළේ.

5. රට සමෘද්ධ කරවීම.

එකල්හි රජ ඉතා මැනවැ යි ගිවිස ගෙන ගොවිකම් කටවියනට බිජු බත් හුදලු කැනි සීවැල් දින, වෙළෙඳම් කටවියනට බඩුමිල දින, තමා සැම්වැටියනට ඔවුනොවුන් තුබූ පරිද්දෙන් නිමඳ දිවෙල් තනතුරු ගම් නියම්ගම් දින. ඒ මිනිස්හු තම තමන්ගේ කම්හි යෙදුනාහු රජුගේ රට නො පෙළූහු. රජහට ධන ධාන්‍යයෝ රැස්වූහ. මිනිස්හු සොරුන් නැතිවන බැවින් භය නැති ව සතුටු ව දරුවන්ළ ද මැඩියෙහි නටවමින් දෙර නො පියාලා නිසැක ව වෙසෙති.

6. යාගයට සෙස් සන් කැමැත්ත ලබාගැනීම.

එකල්හි රජ හැමසේ ම රට සමෘද්ධබව දැන පෙරෙවි බමුණු කැඳවා ගෙන "ආචාර්‍ය්‍යයෙනි! තාගේ උපායෙන් රට සොරහුද් නැතිවූය, ධන ධාන්‍යයෙන් කොටාර දහස් ගණින් පිරිණ. රටවැස්සනට ද භය නැති විය. මම මහායාග කටවියෙමි, පරලොව ද සුව විඳුනා සඳහා යැ. මට අනුශාසනා කරනු මැනවැ"යි කිය. එකල්හි:-

පෙරෙවි බමුණු, "මෙ රජ මහාදන දෙන්නට මහත් උත්සාහ ඇත්තේය. ඉදින් තමාගේ රට රජ ආදිනට නො කියා දෙන්නේ වී නම්, ඔහු හැම දෙන නො සතුටු වෙති, ඔවුන් සතුටු වන කියාවක් කළ මැනවැ"යි සිතා-

---

1. නිබඳ.
2. වෙල් තනතුරු,
3. {එහි. {ගියි,
4. {රට. {කට.

"**මහරජ**! තා මහදන් දියට් බැවින් තාගේ රට රජනට ද් තා සැනැහැති ඇමැත්තනට ද් පිරිස්වැස්සනට ද් බමුණු මහ සල් කුලයට ද් සිටි මහසල් කුලයට ද් නියම්ගම් වැස්සනට ද් දනව් වැස්සනට ද් "මම් මහායාග කටට්යෙමි. පරලොව ද[1] මට සුව සඳහාය. එයට මට අනුදත්තෝ මැනවැ"යි කියන් නට යෙදීය. මහරජ ඉතා මැනවැ යි තමාගේ විජිතයෙහි රජ ආදීනට කියැ. ඔහු මේ රජ ඉසුරුමී, අභිභවා දන් නො දී අපට කියයි, කාළ සේ හෙවූය,[2] නො කි කාල දන සම්භාර බලන්නට ද්[3] නොගතී සතුටු වැ–

"**මහරජ**! දෙයධම් නැතිකාල ද් මහලු කාල ද් මෙ බද් දනක් දෙන්නට නො පිළිවන, තෝ මහත් ධන ඇත්තෙහි, ළදරුයෙහි, ඉතා මැනවැ, මහායාග කරන්නෝ ය"යි කිහු.

7. අෂ්ටාඞ්ග සමන්විත රජනුවෙක් ශුනුබව. මහාවිජිත නම් රජ අට අඟකින්[5] සමු පෙතය, කවර අට අඟය?[5] යත්, අභි ජාතයැ, අභිරූපයැ, මහත් ධන ඇත් තේයැ, මහත් සිවුරඟ සෙනඟ ඇත් තේයැ, මහත් සැදැ ඇත්තේය, බහුශ්‍රුත යැ, කී කි බස අර් දන්නී පණ්ඩිතයැ– ව්‍යක්තයැ, අතීත අනාගත වර්තමාන අර් යන් සිතන්නට සමර්යැ, "මම[6] මෙසේ සම්පත් අතීතයෙහි පින් කොළෙන් ලද්දේ ය"යි සිතනුයේ අතීත අර්යන් සිතන් නට සමර් නම් වෙයි, "දැන් කාළ පින් කමින් අනාගතයෙහි සම්පත් ලබන්නට නිසි වෙමි," සිතන්නෝ අනාගත අර්යන් සිතන්නට සමර් නම් වෙයි, "මෙපින්කම් නම් හැම මහාපුරුෂ යන් විසින් ඇසුරුයේය.[7] මාගේ භොග ද් ඇති, දන වෙත නා ද් ඇති බැවින් පින්කම් කොරෙමි"යි සිතනුයේ වර්තමාන අර්යන් සිතන්න ට සමර් නම් වෙයි, මේ අට අඟින් සමුපෙතව දෙනුවහුගේ[3] දනට හැමදෙසෙන් මහාජනයෝ එළඹෙති.

---

1 පරලොව,
2. { ගේතුව, / ගෙවුව,
3. ලබත් ගට,
4. මෙබඳුදත්,
5. අවගෙකින්,
6. මට,
7. සුරුයේය,
8. දෙවනුව.

අජන්මවත් හෙමේ හේ යොහොත් කල් දේ ද, දූන් ම විපිළි සර[1] ඇතිව සිඳපියයි. මේ අෑ නොයෙක් සිතිවිලි සිතා කිසි සෙනෙක් ම නො එළඹියටි වෙති. මහාවිජිත නම් රජ මේ අටඅඟින් සමුපෙත යෑ. මේ අටඅඟ ද මෙම යාගයට පරිවාරවේ.

8. චතුරඞ්ග සමන්විත පුරෝහිත බ්‍රාහ්මණයෙක්.

එ රජුගේ පෙරෙවි බමුණු සතර අඟෙ කින් සමුපෙතයෑ, කවර සතර අඟින් යත්? අභිජාතයෑ, තුන්වේදයෙහි පාර යට ගියේයෑ, සිල්වතෑ,[3] නුවණැත් තේයෑ, අභිජාතාදි ගුණෙන් යුත් පුතු ලන්ගේ සංවිධානයෙන් දෙන දන් බොහෝ කල් පවතින්. හැම දෙසින් ම මහාජනයෝ අගහිත වන බැවින් එළඹෙන් මෑ යි, මෙසේ එරජුගේ පෙරෙවි බමුණු සතර අඟෙකින් සමු පෙතයෑ, මේ සතර අඟ ද ඒ යාගයට පරිවාර වේ.

9. ත්‍රිවිධචේතනා.

එකල්හි පෙරෙවි බමුණු රජුගේ යාගයට පෙරටව ම සිතී, "දන් දෙන්නාහු තුන් තෙනෙහින් එක් තැනකම චලිත වෙති, මේ රජු තුන්තන්හි පළමු ම අචල කළ මැනවෑ"යි රජහට තුන් විධාන දෙසී, කිසේය? යත්:-

"**මහරජ**! තා යාගකටටියහු විසින් කිසි කවර විපිළිසර යක් නො කළ මැනවෑ, "මාගේ ධාන්‍ය නස්සී" කියායෑ. යාග කරන්නහු විසින් කිසිකවර විපිළිසරයක් නො කළ මැනවෑ. "මාගේ ධන නස්මින් සිටියේය" කියා යෑ. යාග කළහු විසින් කිසි කවර විපිළිසරයක් නො කළ මැනවෑ, "මාගේ ධන නටෑ"යි කියා යෑ. පසුවෑ නොහැඩුණ්[4] මැනවෑ, පූර්ව චේතනා අචලකොට පිහිටි විය යුත්තේයෑ, එසේ වන්නා හා දනයෙහි ඵල මහත් වෙ යි, මධ්‍ය චේතනා ද් අපර චේතනා ද් එසෙ සින් ම අචලකොට පිහිටිවිය යුත්තේයෑ, එසේ වන්නා හා දනයෙහි ඵල මහත් වෙයි.

1. පිළිසාරං, 2. අඟෙකින්, 3. සිල්වත්ය, 4. නොතබුණ.

අභ්‍යාස ප්‍රයොග.

සාමාන්‍ය ප්‍රශ්න.

1. මහාවිජිත යනු කොසේ අසවර වී ද?
2. දන චෙතනා පහළවීමට හේතු ලියනු.
3. පෙරෙවි බමුණුගේ අනුශාසනය ලුහුඩින් ලියනු.
4. මහායාගයක් කරන්නහු විසින් ඒ කෙසේ ආරම්භ කළයුතු ද?
5. මහාවිජිත රජුගේ පිහිටි අෂ්ටාඞගය ලියනු.
6. දනය මහත් ඵලවීමට අවශ්‍ය දෑ ලියනු.

ව්‍යාකරණ ප්‍රශ්න.

1. **පිරිහුන්–දුනුසෙන්**– මොවුන්ගේ නිෂ්පත්තිය ලියනු.
2. **දිකි–සිඟිවැල්–දියවල්**– ශබ්ද වරනගනු.
3. **කොවාර– වෙණෙදුම්– රටවැස්සනට**– මේ වචන යන්හි සන්ධිවූ පද විසන්ධිකර දක්වනු.
4. **කැටපිළෙගම්– වඩාලෝගන්ට දන්න**– මේ ක්‍රියා වන්ගේ නිෂ්පත්තිය ලියනු.
5. නිමඳ– හෙටු– කරවුවර– මොවුන්ගේ ප්‍රකෘති රූප හා අර් ලියනු.

පුරාතන කාව්‍ය පරීක්ෂණ.

පෙර රජුන් රට පාලනය කළ පරිදි ලියනු. ඔවුන්ගේ ප්‍රධාන යුතුකම් කවරහුදැයි පරීක්ෂාකොට දක්වනු.

මහා විජිත රජතුමා. ii.

ප්‍රධාන කරුණු.

1. දනයෙහි විපිළිසර නො වියයුතුබව. 2. ඒ මහායාගයෙහි ස්වරූප. 3. මහජනයාගේ රාජභක්තිය. 4. අනුයාගය.

---

1. දනයෙහි විපිළිසර නොවියයුතුබව.

එක්බිති ඉදින් මෙ රජු දුශ්ශීලයන් දැක "මාගේ දනය නස්සි, දුශ්ශීලයහ වළඳන්නාහ"යි සිල්වතුන් කෙරෙහි ද් විපිළිසර[1] ඉපයූයේ වී නම් දනය මහා ඵල නො වෙයි, විපිළිසර නම් දයකායනට පිළිගාවන්[2] කෙරෙන් ම උපද්දි. එසේ බැවින් පළමු ම ඒ විපිළිසරය නො උපැද්ද දූන මැනැවැ යි දස ආකාරයෙකින් පිළිගාවන්[2] කෙරෙහි, විපිළිසර නො කළ මනා පරිදි කියනුයේ:-

මහරජ! (1.) තාගේ දන් ගන්නෝ[3] පණිවා කරන්නාහු ද් නොකරන්නාහු ද් එති, එහි යම් කෙනෙක් පණිවා කරන්නාහු වූහු නම් ඒ පාපයෙන් අනිෂ්ට විපාක උන්ට ම වෙයි, සෙස්සනට වන්නේ නො වෙයි, එහි යම් කෙනෙක් පණිවා නො කෙරෙද්ද, ඔවුන් සඳහා දන් දෙන්නේය යි සිත් පාදවන්නේයැ, එසෙයින් ම:-

(2.) අයිනාදන් ගන්නාහු ද් නො ගන්නාහු ද්,

(3.) කාමමිථ්‍යාචාරයෙහි පවත්නාහු ද් නො පවත්නාහු ද්,

(4.) මුසවා කියනුවෝ ද් නො කියනුවෝ ද්,

1, විපිළිසාර, 2, පිළිගනුවන්, 3, ගන්නාහු, ගත්තෝ,

(5.) අනුන්ගේ අයිණි[1] කියන්නාහු ද් නො කියන් නාහු ද්,

(6.) අන්නට සාතීශ පෙපුල් බණන්නාහු ද් නො බණන්නාහු ද්,

(7.) සම්ඵප්පලාප। බණන්නාහු ද් නො බණන් නාහු ද්,

(8.) අනුන් සම්පත ලොභ කරන්නාහු ද් නොක රන්නාහු ද්,

(9.) අනුන් කෙරේ කැටෙන්නාහු ද් නො කැටෙන් නාහු ද්,

(10.) මිසදිට්හ ගන්නාහු ද් නො ගන්නාහු ද්–

තාගේ දන් ගන්නට එළඹෙත්. එහි යම් කෙනෙක් අයිනා දන් ඇ ගන්නාහු වූ නම් ඒ පාපයෙන් අනිෂ්ට විපාක උන්ට ම වෙයි. සෙස්සනට වන්නේ නො වෙයි, එහි යම් කෙනෙක් අයිනාදන් ඇ නො ගන්නාහු නම් ඔවුන් සඳහාය මා දන් දෙන්නේ යෑ, සිත් පහද වන්නේ ය යි මේ දස ආකාරයෙන් පිළිගාවන් කෙරෙහි විපිළිසර නො කළ මනා පරිදි යාගයට පෙරටව ම කියා ගිවිස්විය.

එක්බිති මහරජ! තා මෙසේ දන් දෙන කල "අපට නො කියා රජ යාග කෙරේ"යි, කියන්නට නිසි යමෙක් නැති, යනාදි විසින් සොළොස් ආකාරයකින් රජහට සොම්නස් උපද්දි.

2. ඒ මහායාගයෙහි ස්වරූපය.

ඒ යාගයෙහි ගෙරින් නො ද මැරූහ. එළුවන් නො ද මැරූහ. කුකුළන් නො ද මැරූහ. හූරන් මුවන් ලිහිණීන් ඇ නොයෙක් සතුන් නො ද මැරූහ. යූපයට[1] රුක් නො ද සුන්හ, ඉළුප්දූ නො ද අළහ. දස් දූසි[3] ආදිකම්කරුවෝ යාග කරන තැන මෙහෙවර[4]

1. {අස්ණී, අසුණි, 2. යූපය, 3. දූසිදස්, 4. මෙහෙ,

කාටටි වුව කෙරෙති, නො කාටටි වුව නො කෙරෙති. යමක් කාටටි වුහු නම් කාටටි දූ කෙරෙති නොකාටටි දූ නො ම කෙරෙති, දඬුමුගුරු ගෙන මෙහෙ කෙරෙහිද?නො කෙරෙහිදූ?යි කියන් නාහු නැති, ඉදින් මෙහෙ[1] කෙරෙහි නම් කර, නො කෙරෙහි නම් තළම්හ, බඳම්හ,[2] යන්නෝ නැති, කඳුළු මුසු මුහුණු ඇති වැ වැලප වැලප මෙහෙ කරන්නෝ නම් නැති. මිහිරි තෙපුල් බැණ මෙහෙ කැරැවූහ.[3] එහි දස්නට දස්හ යි නො කියති, දූස්නට දූස්හ යි නො කියති, කම්කරුවනට කම්කරු වහ යි නො කියති, පිය තෙපුල් බැණ අඹුන් මිනිස් පිරිමින් කෙරෙහි බලඇත්තනට බලනැත්තනට තිසි තිසි මෙහෙ දක්වා දී මෙසිද් කරව යෙති, ඔහු තමන් තමන් සිත්වූ[4] පරිද් දෙන් මෙහෙ කොළෝ.

ගිතෙල් වෙඬරු දිහි මී සකුරු ආදීන් යාගකොට නිම වූහු,[5] කිසේය යත්? රජු පිවි නුවර[6] සතර දොර ද් ඇතුළු නුවර මැද ද් මේ පස්[7] තන්හි මහදන්හල් කරවා එකෙකි දන්හල එකෙකි ලක්‍ෂ ලක්‍ෂ බැගින්[8] දවස දවස පස් ලක්‍ෂ යක් ධන විසඳ හිරු නැඟී තැන පටන්ගෙන ඒ ඒ කලට[9] තිසි බොජුන් සිය අතින් රන් කෙණෙස්ස ගෙන පිණිවූ ගිතෙල් වෙඬරු දිහි මී සකුරු මුසුකොට හඹු කඳු බත් මාලු බොන දූ[10] ආදීන් මහජනා සැතැප්පි, ගෙන යාවියනට[11] එසෙයින් ම බඳුන් පුරා දෙවයි. සවස් වේලෙහි පිළින් ගඳින් මලින් පුදයි, ගිතෙල් ආදි මහසැළ පුරා යමෙක් යමක් වැළ දියටි වී නම් හේ ඒ වළඳවයි. නො එක් සිය තන්හි තබවයි.

3. මහජනයාගේ රාජ භක්තිය.

එකල්හි එ රජුගේ රට රජහු ද් ඇමැත්තෝ ද් පිරිස් වැස්සෝ ද් බමුණු මහසල් කුල වැස්සෝ ද් ගැහැවි මහසල් කුල වැස්සෝ ද් නියම්ගම් වැස්සෝ ද් දනව්

---

1. මෙහි. 2. වදිම්හ, 3. කළාහු, 4. සිතතුබු, 5. නිමුණු, 6. පිවිනුවර, 7. සත්තැන්, 8. බැවින්, 9. කලට. 10. {හඹුකැඳ මාලු බොන දූ, හඹුකඳ. 11. යාචකයනට,

වැස්සෝ ද් "මෙ රජ ගිතෙල් ආදි ජනපද වාසීන් කෙරෙන් ගෙන්වා නො ගෙන තමා ගැති දූ වියදම්කොට මහදන් දෙයි අපට කිසි දූයක් නො කියයි, අප නො බැණ හිඳුනා තැන් නො යෙදෙයි, රජගෙහි ධන අපමණ යැ, එතෙකුදු වුව ද් ධන ඇරදුන මැනවැ"යි, ගැමින් නියම් ගැමින් නුවරින් ධන නානා ගෙන වෙන වෙන ම ගැල් පුරා රජු කරා ගෙන ඇර 'මහරජ! මේ ධන බලාගන්නේ මැනවැ'යි කිහු.

රජ "මාගේ ධන බෙහෙව ධැමින් සෙමෙන් ගත් කරවුවරින් රැස්කෙළේ ය, තෙලෙ තොපට ම වේව යි කැමැත මොබින් ගෙනයව"යි, කියා නො ගත.

4. අනුයාගය. මහාජනයෝ එකා තැනකා ගොස් සිට බැණ ගෙන "මේ ධන නැවත අපගේ ගෙට ගෙන යන තැන් සොබනේ නොවෙයි, රජ මහායාග කෙරෙයි, ඇපි අනුයාගකරම්හ යි, යම්සේ පැදුම්දෙසෙන්[1] එන් නාහු අපගේ දන්හල හඹු බී රජුගේ දන්හල බත් වළඳා නුවර වදිද් ද, එ බඳු තන්හි අනුයාග කරම්හ"යි රජ්දරු ආදීහු[2] පැදුම් දෙසෙහි දන්හල් කරවා දන්දුන්හ, එසෙයින් ම දකුණු දෙසෙහි ඇමැති ආදීහු දන්හල් කරවා දන්දුන්හ, පැළ දෙ සෙහි බමුණු ආදීහු දන්හල් කරවා දන්දුන්හ, උතුරු දෙසෙහි ගොවි ආදිහු දන්හල් කරවා දන්දුන්හ, ඔවුන්ගේ යාගයෙහි ද් ගෙරින් නො ද මැරූහ, එළුවන් කුකුළන් හූරන් මූවන් ලිහි ණින් නොඑක් සතුන් නො ද මැරූහ, රුක් නො ද සුන්හ, ඉළුප් දූ නො ද අළුහ, දස් දූසි කම්කරුවන් නො ද තළ කිරුවා ගිතෙල් වෙඬරු දිහි මිහි සකුරු ආදීන් යාග කොට නිමවූහු.

1. පැද්දෙසෙන්, 2. {රජදරු ආදීහු, රජ්ජුර් ආදීහු,

අභ්‍යාස ප්‍රයොග.

සාමාන්‍ය ප්‍රශ්න. 1. මහාවිජිත රජුගේ තත්ත්වය පහද වැකියක් ලියනු. 2. මහායාග යනු කවරේ ද? 3 රට සමෘද්ධිමත් කිරිමට හේතු දක්වනු. 4 ඒ පිණිස කළ යුතු දේ ලියනු. 5. මහාවිජිතරජ කවරකවර අවයවයන් ගෙන් සම්පූර්ණ ද? 6. යාගයක් සම්පූර්ණවීමට අවශ්‍ය අඞ්ග සම්පූර්ණකර ලියනු. 7 ත්‍රිවිධ චෙතනා දක්වනු. 8 ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි අප්‍රසන්නවීමට කරුණු දක්වනු. 9. ඒ මහායාගය කළ පරිදි ලියනු. 10. එහි ප්‍රයොජන කවරේ ද?

ව්‍යාකරණ ප්‍රශ්න. 1. "**බොහෝ උපකරණ ඇත්තෝය, සොරගු බොහෝහ, නිසැකව දවස් යවනු මැති**— මේ වාක්‍යයන්හි ක්‍රියාවන්ගේ ධාතු ප්‍රත්‍යය දක්වා උක්ත පද දක්වනු. 2. **හඹු**-**කඳු**-**බත්**-**මාලු**-ශබ්දයන් ගේ ව්‍යුත්පත්තිය හා අර්ථ දක්වනු. 3. **දශසහසනාද**– **අපට** නොකියා– **කලට** නිසි– යන තන්හි සළු පදයන්ගේ විබත් ලියනු.

ඉතිහාස ප්‍රශ්න. ඒ කාලයෙහි රටේ ගොවිතැන හා වෙළඳ විවීම දියුණුවීමට හේතු කවරහු ද? එබඳු දියුණුවක් බලාපොරොත්තු විය යුත්තේ කොබඳු ජනතායක් විසින්ද?

පරීක්ෂණ. 1· රට සියල්ලෙන් සමෘද්ධි නම් දවස දවස පස් ලක්‍ෂයක් වියදමින් දෙන දන් ගත්තෝ කවරහු ද? 2. "**කම්කරුවනට කම්කරුවන යි නො කියති**," එසේ නම් කවරහුය යි කියයුත්තාහු ද? එසේ නො කීමෙන් ඔවුන්ගේ කවර ගුණයක් පළවේ ද? 3. එකල මිනිසුන්ගේ ආහාර පිළිබඳ විවෙචනයකරනු.

දීඝතපස්සි නිගණ්ඨයාගේ බුඩදශීනය.

<u>ප්‍රධාන කරුණු.</u>

1. දීඝීතපස්වි බුදුරදුන් දක්නට යාම. 2. ඔහු බුදුරදුන් හා කල ධර්ම සාකච්ඡාව. 3. කර්මවිභාගය.

---

1. දීඝීතපස්වි බුදුරදුන් දක්නට යාම.

එක් සමයෙක්හි බුදුහු මිණිසාවද පෙරෙව් ගදැතුන් බඳු රත්පවුල් පෙරෙව් මහානුභාව සම්පන්න සඟ පිරිස් පිරිවරා, දෙව්රමින් නික්ම, ගම් නියම්ගම් නුවර දනව් මඬුලු ගල් වල් සවනක් ගන බුදුරස්හි කුමුටුවමින්[1] දනව් සැරිසරමින්[2] ගොස්, මගධරට නාලන්ද නම් නුවර නිසා පාවාරිකා නම් සිටුහුගේ අඹ උයන්හි වැඩ වෙසෙති. එකල්හි නිගණ්ඨනාථපුත්‍ර නම් නුවට මහත් නුවට පිරිස් පිරිවරා නාලන්දායෙහි වෙසෙයි. උහුගේ දීඝීතපස්වී නම් නුවටෙක් නාලන්දායෙහි වළඳා, පාවාරික නම් අඹවනයට බුදුන් කරා එළඹ, සාමීචි කොට අවසර ගෙන, එකත්පස්ව හුන්නෝය. හුන්නාහට,

2. ඔහු බුදුරදුන් හා කල ධර්ම සාකච්ඡාව.

බුදුහු:- කියග තපස්විය, නිගණ්ඨනාථපුත්‍ර පව්කම් කිරීමට කිහි කමක්[3] දක්ව යි? වදාළහ.

භොයුම් භොතුව! නැමැ ය නැමැ 'යි නො දක්වයි. දණ්ඩය දණ්ඩය යි මිස[4] කීය, එ සඳ-

---

1. කුමුදුවමින්,
2. සැරිසැරීමෙන්, සරමින්,
3. කහි කමක්,
4. දඬ දඬයයන් මිස, දණ්ඩය දණ්ඩයවචනයෙන්,

බුදුහු- තුඹවුන්ගේ සමයෙහි පුළුවුස්නාහු හේ පව්කම් කිරිමට කිහි දණ්ඩයක් දක්වයි, යි වදාළහ.

(**දීඝතපස්වි**) කායදණ්ඩය වාග්දණ්ඩය මනොදණ්ඩය" යන තුන් දණ්ඩයක් දක්වයි කී. එහි පළමුවන දණ්ඩය තුඹටහු අවිත්තක කොට දක්වත්. කිසේය? යත්, සුළඟ හමනකල අතු සැලෙයි. දිය සැලෙයි. එහි සිත් නැති, එසෙයින් ම කායදණ්ඩ ද අවිත්තකා[1] වෙයි. යම්සේ සුළඟ හමන කල තල්පත් ආදීහු හඬත් ම ය. දිය හඬා ම ය. එහි සිත් නැති, එසෙයින් වාග්දණ්ඩය ද අවිත්තකා වෙයි, යොත්. මෙසේ මේ දණ්ඩමය අවිත්තක කොට දක්වති. සිත් වූ කල[2] මනොදණ්ඩ කොට දක්වත්. එසඳ බුදුහු උහුගේ තෙපුල් සිටිවියටිවැ[3] කියග:-

තපස්විය! කාය දණ්ඩ අනෙකෙක් ම ය[4] හෝ? වාග් දණ්ඩ අනෙකෙක් ම ය හෝ? මනොදණ්ඩ අනෙකෙක් ම ය හෝ, යි වදාළෝ.

ගොයුම් ගොතුව! කායදණ්ඩ අනෙකෙක් ම ය. වාග්දණ්ඩ අනෙකෙක් ම ය, මනොදණ්ඩ අනෙකෙක් ම ය යි කී.

(**තපස්විය**!) මේ තුන් දණ්ඩයන් කොරෙහි පව්කම් කිරීමට නිගණ්ඨනාථපුත්‍ර කාවර දණ්ඩය මහාසාවද්‍ය කොට දක්ව,යි වදාළෝ.

ගොයුම් ගොතුව! කායදණ්ඩ මහාසාවද්‍ය කොට දක්වයි කී. කායදණ්ඩ යෙහි-

තපස්විය යි වදාළහ, කායදණ්ඩයෙමි:-[5]

ගොයුම් ගොතුව! යි, කිය

* * * * * * * * *

1. {අවිත්තකා, {අවිත්තා,
2. ඔහුට සිත්වූ කල,
3. ඈසිටිව,
4. අනෙක්මය,
5. කායදණ්ඩයෙයිමි,

එකල්හි නුවට ගොයුම්ගොතුව! පව්කම් කිරිමට කිහි දණ්ඩ යක් දක්ව යි කිය.

තපස්විය! තථාගත දණ්ඩ දණ්ඩ යි නො දක්වයි. කැම කැමයක්[1] මිස ය යි. වදාළහ. එසඳ නුවට බුදුන්ගේ සමයෙන් පුළුවුස්නේ–

ගොයුම් ගොතුව! පව්කම් කිරිමට කිහිකමක් දක්ව යි,? කිය.

තපස්විය! මම කායකර්මය වාක්කර්මය මනඃකර්මය යන තුන් කමක් දක්වමි යි වදාළෝ.[2]

3. කර්ම විභාගය. සැකෙවින් මෙහි ත්‍රිවිධ කායදුශ්චරිත කාය කර්ම නම් වෙයි. චතුර්විධ · වාග්දුශ්චරිත වාක්කර්ම නම් වෙයි. ත්‍රිවිධ මනෝදුශ්චරිත මනඃකර්ම නම් වෙයි. කායද්වාරයෙහි පැවැති චේතනා කාය කර්ම යැ. වාග්ද්වාරයෙහි පැවැති චේතනා වාක්කර්මයැ. මනෝ ද්වාරයෙහි පැවැති චේතනා මනඃකර්මය'' යි, කුමට චේතනා කර්ම නම් වී ය? යත්. චේතනා මුල්කොට ඇත්තේ යැ, කර්ම එයින් කියත්. මෙහි අකුසලට පැමිණ කායකර්ම වාක් කර්ම මහතැ යි කියන්නේ නො කොලමෙයි. කුසලට පැමිණ මනඃකර්ම මහතැයි කියන්නේ නො කොලමෙයි. කියේය? යත්. පස් අනන්තරියකර්මහි මවුන් මරනු ආදි සතර කර්ම කයින් කැරෙයි. නිරය කපෙක් දවස් පස්නා[3] සඞ්ඝභෙද කර්ම[4] වාග්ද්වාරයෙන් කැරෙයි. මෙසේ අකුසලට පැමිණ කායකර්ම වාක්කර්ම මහතැ යි කියන්නේ නො කොලමෙනු[5] නම් වෙයි. එක ධ්‍යාන චේතනායෙන් සුවාසූදහසක් කප් සුගී සපු වළඳයි එක මාර්ගචේතනායෙන් හැම අකුසල් නසා රාත් කෙරෙයි. මෙසේ කුසලයට පැමිණ මනඃකර්ම මහතැයි කියන්නේ නො කොලමෙනු නම්[5] වේ.

---

1. කමක්, 2, වදළේ, 3. කප් දවස් පස්නා,
4, සඞ්ඝභෙදක නම්, 5, { නො කලකිරෙයි කියනු, නො කලකිරෙනු නම්,

අභ්‍යාස ප්‍රයෝග.

සාමාන්‍ය ප්‍රශ්න.

1. සැරිසැරීම යනු විස්තර කරනු.
2. දණ්ඩය--කර්මය යන දෙකෙහි වෙනස ලියා කර්මය යන ශාසනික ව්‍යවහාරය කවරේදැයි පැහැදිලි කරනු.
3. කායදණ්ඩය මහාසාවද්‍ය බැව් කීමට හේතු දක්වනු.
4. "කුසලයම පැමිණ මනඃසමී මහතැයි කියන්නේ නො සොලමෙනු නම් වේ." මෙහි අදහස පැහැදිලි කරනු.
5. දීඝතපස්වීන් බුදුන් දක්නට යාමට හේතු දක්වනු.
6. "මිණි කවද පෙරෙව් ගඳැතුන්-රත්පවුල් පෙරෙව් මහාදුහා සම්පන්න සඟපිරිස්-දනව් මඬුලු ගල් වල් සවනක් ගත බුදුරස්හි කුළුටුවමින්--මෙහි අදහස් ලියනු.

ව්‍යාකරණ ප්‍රශ්න.

1. සිව්හුගේ-උහුගේ-කිහි, මේ පදයන්ගේ ප්‍රකෘති දක්වනු.
2. දක්වයි- සැලෙයි- හඬත්මය- වදලෝ, මොවුන් ගේ ධාතු- ප්‍රත්‍යයන් දක්වනු.
3. හේ- හෝ- මිස- නම්, යනු කවරාර්ථයන්හි වූ කවර පදද?
4. බුදුම්- දන්ති- දින්- ඛියවි ද්- රක්මි, යන පද සිද්ධකරනු.

පුරාවිද්‍යා ප්‍රශ්න

1. මගධරට- එකල කොබඳු තත්ත්වයක පැවතුණිද? එහි වර්තමාන තත්ත්වය කෙසේද? එහි ප්‍රධාන ස්ථාන දක්වනු.
2. දෙව්රම් වෙහෙරෙහි වර්තමාන තත්ත්වය දක්වනු.
3. ගම්- නියම්ගම්- දනව්- නුවර, මොවුන් ගේ වෙනස දක්වනු.

උපාලි මහ සිටුවරයා. i.

ප්‍රධාන කරුණු.

1. උපාලිසිටු නිගණ්ඨනාථපුත්‍රයා දක්නට යාම. 2. බුදුන් හා වාදයට සමුඉල්වීම හා බුදුන් පරශත අයුරු ප්‍රකාශ කිරීම. 4. උපාලි වාදාරෝපණයට යාම දීඝතපස් විත්ට නොරිසිය යත බව. 5. වාදාරෝපණයට යාම.

---

1. උපාලි සිටු නිගණ්ඨනාථ පුත්‍රයා දක්නට යාම.

උපාලි ගහපතිනු[1] තමාගේ බාලක ලොණකාර නම් ගමෙකින් අය අළු[2] මිනිස්නට "එව අප සථරනු දක්නට යම්හ" යි පිරිස් පිරිවරා නිගණ්ඨනාථපුත්‍රයා[3] කරා ගොස් වැඳ එකත්පස් ව හුන්නේ යි. එසඳ නිගණ්ඨනාථපුත්‍ර දීඝ තපස්වි ආවාහු දූන කොයට ගොස් ආහි යි, පිළිවිත. ගේ මහණගොයුම්හු කරා ගොස් ආමි යි කීය. උපන් කථා කිමැ යි. කියෙන් බුදුන් හා තමා හා කළතාක් කථා හැම කීය. එකල්හි නිගණ්ඨනාථපුත්‍ර දීඝතපස්විහට සාධුකාර දී "සථරනුගේ සස්න දක්තෙහි තම් නොර්ය, ලාමකවූ මනොදණ්ඩය මහත්වූ කායදණ්ඩය හා සමවන්නේ නො වෙයි, පව්කම් කිරීමට කායදණ්ඩ ම මහාසාවද්‍යය, වාන්දණ්ඩ මනොදණ්ඩ එසේ වන්නේ නො වෙයි කීය.

---

1. ගහපතිඳු, 2. අළු අය, 3. නිගණ්ඨනාථකරා,

2. බුදුන් හා වාදයට සමුඉල්වීම හා බුදුන් පරයන අයුරු.

එකල්හි උපාලි ගහපති දිඝතපස්වි හට ඔහු සේම සාධුකාරදී නිගණ්ඨ නාථපුත්‍රයහට වහන්සේ! මම මේ කථාවස්තු වැ මහණගොයුම්හට වාද රොපණය කරන්නට යෙමි. යම්සේ බලැඇති පුරුෂයෙක් දික්ලොම් ඇති එළුවක්හු ලෝම ගෙන මොබට ඔබට ලා ආකම්ණ පරිකම්ණ සම්පරිකම්ණ කෙරේද, එසෙයින් ම මහණ ගොයුම්හුගේ වාදයෙන් වාදකොට කථා මාගීයෙන් දෙස් දක්වා මොබට ඔබට[1] නො යාදී[2] ආකම්ණ පරිකම්ණ සම්පරිකම්ණ කොරෙමි

යම්සේ සුරාධූතීයෙක් රාපරහනමටුලුකස්ස[3] දෙවියට්වූයේ කසට හරනා සඳහා දෙකන ගෙන ඇද කිබිසිනිකොට කිම පියා ද. උඩුකුරු[4] කොට බිමපියා ද,[5] පුනපුනා ගසාපියා ද, එසෙයින් ම මම මහණගොයුම්හු හා වාදයෙන් වාදකොට අවධූනන නිර්ධූනන[6] නිෂ්ඵොටන කෙරෙමි.

යම්සේ බල ඇති මිනිස්හු සණපිළි කරනු සඳහා සණ වැහැරිගෙන මිටි මිටි කොට බැඳ දියෙහි ගලා තබා පිලික්සඞිය කල තුන්වන දවස් ඒ තැබූ තැනට ඇඹුල් හඹු රඟ ඈ උපකරණ ගෙන ගොස් දකුණත්පස පුවරුවක් තබා, වමත්පස පුවරුවක් තබා පෙරට පුවරුවක් තබා, කොළවර අත්ලා හැරගෙන එක් යළක් දකුණත පුවරුයෙහි පැහැර එක්යළක් වමත පුවරුයෙහි පැහැර එක්යළක් පෙරට පුවරුයෙහි පැහැර, කන්නාහු, බොන්නාහු, සණ දෙවුන් කෙළි කෙළිද්ද, මම ද සණදෙවුන් කෙළි කෙළනා මිනිසුන් සෙයින් මහණ ගොයුම්හු හා වාද කෙළියක් කොළපාමි.

1, ඔබට මොබට, 2. යා නො දී, 3. රසපරහන මටුලුකසට, 4. උඩුකුරු, 5. පිඹපියාද, 6. අවධූත්න නිධූත්න,

යම්සේ රජුගේ ඇත් සණ්‍ඩ දෙවුන් සොළි ගොළනා මිනි සුන් දැක ගැඹුරු දියට වැද සොඬින් දියගෙන එක්යළක් කුඹ එව, එක් යළක් පිට එව, එක් යළක් දකුණන් පස එව, එක් යළක් වමත්පස එව, එක් යළක් ගාළවේ අතුරේ එව, සොළීද, එසෙයින් ම මම ද මහණ ගොයුම්හු හා වාදයෙන් වාදසොට සණ්‍ඩදෙවුන් සොළි සොළනා ඇතක්හු සෙයින් මොබට ඔබට ලා ආසාම්ණ පරිසාම්ණ සම්පරිසාම්ණ සොරෙ"මි යි කිය. එකල්හි–

නිගණ්ඨනාථපුත්‍ර:– මහසිට! මහණ ගොයුම්හු හා වාදයට මම නො තිස්සෙමි, දීඝීතපස්වි හෝ තිස්සෑ, තෝ හෝ තිස්සෙහි" කිය, එකල්හි,

දීඝීතපස්වි:– නිගණ්ඨනාථ පුත්‍රය භට වහන්සේ! උපාලි මහ සිටිහු මහණ ගොයුම්හු හා වාදයටය මට නො රිසුණේ ය, හේමායාවී යෑ. අනුන්ගේ සව්වන් ආවතීනය කොට ගන්නා මායාවක් දන්නියි, කිය. එසඳ,

නිගණ්ඨනාථපුත්‍ර– තපස්විය! උපාලි මහසිටි මහණ ගොයුම්හුගේ සව්වන්නට නො තිස්ස, මහණ ගොයුම්හු උපාලි මහසිටිහු ගේ සව්වන්නට, තිස්ස, තෝ යා මහසිට, යි 'කිය.

මෙසේ තුන්යළක් දීඝීතපස්වි කියතු දු[2] උපාලි මහසිටි කුමට නභායව යි? යත් නිගණ්ඨනාථපුත්‍ර බුදුන් හා එක් නුවර නිසා වසතු දු බුදුන් නුදුටුවිරි, යමෙක්[1] බුදුම් යන පිළිත කෙලේ වී නම් ඒ පිළිත නො පියා හේ බුදුන් දක්නට

1. සච්ඡවට, 2. කියතුද්,

නො තිස්ස, එයින් මේ බුදුන්[1] නො දුටුපිරිවත, බැවින්[2] බුදුන් ගේ දර්‍ශන සම්පත්තු දු නෛර්‍ය්‍යාණික කථා දු නො දන්නෙන්[3] සිව්හු බුදුන්කරා යන්නට අවසර දින්.

දිඝීතපස්වි වනාහි කලින් කල බුදුන් කරා එළඹ සිට හිඳ පැන පුළුවුස්සි, හේ බුදුන්ගේ දර්‍ශනසම්පත්තු දු. කථා නෛර්‍ය්‍යාණික පරිදි දු දන්නි.[4] එයින් හේ "මේ සිව් ඉතා නුවණ ඇත්තේ ය. මහණ ගොයුම්හු කරා ගොස් දැක් මෙහි දු පහද්දී, නෛර්‍ය්‍යාණික කථායෙහි ද පහද්දී[5] එසේ වන්නා හා වටාලා[6] අප කරා නො වද්දි, සි තුන්යළක් නො ගිය මනා සේ කී.

එකල්හි උපාලි ගෘහපති නිගණ්ඨනාථ පුත්‍රයාගේ තෙපුල් "ඉතා මැනව වහන්සේ" යි පිළිගෙන හුනස්නෙන් නැගී වැඳ පැදකුණු කොට පාවාරික නම් අඹවනයට ගොස් බුදුන් කරා එළඹ වැඳ එකත්පස් ව හුන්නෝයි. බුදුන් දුටු කල ම පහන්නාහු දු වඳිත් ම යැ. නො පහන්නාහු දු බොහෝසේ වඳිත් ම ය. වඳනාහු කවර කාරණය? යත්. බුදුහු ඉතා උතුම්කුලෙහි උපන්නාහ. ගිහිගෙයි වසනුවන් විසින් වැන්ද යුතුවහ.[7] එයින් වඳිත්. මෙ සිව් වූකල පහන් නෙන් ම වැඳ දක්මින්[8] ම බුදුන් කෙරේ ප්‍රසාද කෙළේ. මෙසේ බුදුන් වැඳ එකත්පස් වැ හුන්–

උපාලි මහසිව්:— වහන්සේ! දීඝීතපස්වි මෙයට අය හෝ යි. කිය. අය මහ සිට යි වදළෝ. උහු හා උපන් කථායෙක් හා ඇත හෝ යි, කිය. ඇත මහසිට! යි වදළෝ, කුමන කථායෙක හෝ, යි කිය. බුදුහු උහු හා උපන් කථා තාක් වදළෝ.

එසඳ උපාලි මහසිව් දීඝීතපස්විහට සාධුකාර දී සථර හුගේ සස්න දත්තේ නම් හේය. ලාමකවූ මනොදණ්ඩය

---

1. බුදුහු මියහ, 2. එයින්, 3. නොදන්නේ, {4. දනී, 5 පහදී, දන්න,} 6. පෙරලා, 7. සුතුයයි. 8, දක්වමින්,

මහත්වූ කායදණ්ඩය හා සමවන්නේ නො වෙයි. කිය. පව්කම් කිරීමට කායදණ්ඩ මහාසාවද්‍යය. වාග්දණ්ඩ මනෝ දණ්ඩ එසේ වන්නේ නො වෙයි, කී.

බුදුහු ඉදින් මහසිට![1] තෝ රුසෙක හිඳිවූ[2] කණුවක් සෙයින් නො සෙල්වී සැබැවැ පිහිටා සිටිනෙයි[3] වී නම් තා හා කථා කරම්හ යි වදාළෝ. "වහන්සේ! මම සැබැවැ පිහිටා සිටිමි. වදාරනු මැනැවැ" යි කී.

අභ්‍යාස ප්‍රයොග.

සාමාන්‍ය ප්‍රශ්න.

1. "එව අප සථරහු දක්නට යම්හ" මේ කවරහු කාහට කුමක්නිසා කියනලද්දක් ද? සථරහු යන්නෙන් කවරහු ගැණෙත් ද?
2. "සථරහුගේ සස්න දත්තෙහි" මෙහි පැණෙන සස්න පැහැදිලි කරනු.
3. ආකම්ණ, පරිකම්ණ- සම්පරිකම්ණ- අවධූනන නිර්ධූනන- නිෂ්පොටන- යන පදයන්ගේ වචනාර්ථ වහර බසින් ලියනු.
4. සණදෙවුන්කෙළි විස්තර කර ඒ උපමාවෙන් කුමක් ඇඟවීද යි දක්වනු.
5. උපාලි සිටුහුගේ බුදුන් දැක්මට යාම දීඝීතපස්වි අනුමත නො කෙළේ කිමැ යි දක්වනු.

ව්‍යාකරණ ප්‍රශ්න.

1. "කොයට ගොස් ආහි" "කෙළියස් කෙළ පාමි" "උපාලිමහසිටි සච් වන්නට නො නිස්ස" "අය හෝ යි" මේ වාක්‍යයන්හි පදවිභාගය කරනු.

---

1. බුදුනු මහ සිට. 2. තොරසෙක්හිඳු. 3. සිටිනෙහි.

2. ගොස්– ආහි– පාමි– දත්තෙහි. යන ක්‍රියාවන්ගේ ධාතු ලියනු.
3. මොබට– ඔබට– තුන්යළක්– උහු යන මොවුන්ගේ ප්‍රකෘති– හා විබත් ලියා අර්ථ දක්වනු.

ඉතිහාස ප්‍රශ්න.

උපාලි ගැහැවි– බාලක ලොණකාර ගම– යන මේ සම්බන්ධයෙන් ලියහැකි ඉතිහාස පුවත් ලියනු.

පුරාවිද්‍යා ප්‍රශ්න.

පෙර හණ රෙදි කෙසේ පිළියෙළ කොළෝද? අනික් ගමකින් අනික් ගමකට අය ගෙන යාමට ඇති යුතුකම් හා ඒ පිළිබඳ පුරාවෘතය ලියනු, දැනුදු එසේ කරත්ද?

උපාලි මහ සිටුවරයා. ii.

ප්‍රධාන කරුණු.

1. බුදු රදුන් හා උපාලි සිටුහුගේ වාදය.
2. බුදු රදුන් සරණ යාම.

මහසිට! මේ ලෝකයෙහි සිහිල් දිය නො ගෙන හුණු[1] දිය වළඳ කරන නුවටෙක්[2] බලවත් ලෙඩක් ව සිහිල් දිය නො ලදින් මෙළේ වී නම් නිගණ්ඨනාථ පුත්‍ර උහු කොයි උපද්දි,,යි[3] යෙයි වදාළහ.

---

1. හුනු, 2. නිවටෙක්, 3. උපදින්,

වහන්සේ! මනඃසත්‍ය නම් දෙවියොනෙක් ඇති, ඔවුන් කොරේ උපද්දි.[1] මනස්හි බැඳී මෙළෙන් හා යඃ[2] යි කියෑ. ඔහු සිහිල් දිය වළඳ නො කරනු කුමටය? යත් නුව ටහු දියෙහි දිවි ඇත යන සිතින් සිහිල් දිය නො ගන්නි, එහි කුඩා දිය බිඳු කුඩා පණුවහ යෙති මහත් දිය බිඳු මහත් පණුවහ යෙති. මෙසේ පණු වහ යන සිතින් සිහිල් දිය වළඳ නො කරනුවහට පිත්තජ්වරයෙක් ඇති. ඔව්හට හුණු දිය බොනු හෝ අත් පා දෝනේ හෝ පරිශෙකා කරනු හෝ නො රිසි යෙයි. රෝගය බලවත් වෙයි. සිහිල් දිය පුව මැනව. එයින් රෝගය සන්හිඳී. මෙ වනාහි හුණු දිය ම වළඳ කොරෙයි. ඒ නො ලද කල කාඞි වළඳ කොරෙයි. සිතින් වූ කල සිහිල් පැන් බියපි ද් වෙයි. වළඳ කටැවි ද් වෙයි. එයින් ඔහුගේ මනො දණ්ඩය එහි ම බිඳෙයි. හේ "කායදණ්ඩ වාග්දණ්ඩ රක්මි" යි "මම් සිහිල් පැන් බියපියෙමි, මට සිහිල් පැන් දෙව"යි කියන්නට නො හිස්ස, ඔහු මෙසේ රක්නා ලද කාය දණ්ඩ වාග්දණ්ඩයෝ චුතිය හෝ පිළිසඳ හෝ අරන් නට නො හැක්කාහ, මනොදණ්ඩය වනාහි බුන්නෙ දු චුති ද් පිළිසැඳු ද් අරාමය.

මෙසේ දුර්වල වන බැවින් කායදණ්ඩ වාග්දණ්ඩයෝ ලාමකයහ. මනොදණ්ඩය ම බලවත් වේ. මහත් වේ. මෙසේ උපාලි ගහපති හි "බුන් මනොදණ්ඩ ඇති නුවටහු මනඃසත්‍ය නම් දෙවියන් තෙරෙහි උපද්දි"යි කිකාල–

මහසිට! සිහි එළවා කියා, තා "කායදණ්ඩ මහතැ යි, පළමු කී බස හා දූන් මනොදණ්ඩ මහතැ යි පසුව කියන බස් හා සටිත නො වෙ"යි වදළෝ.

---

1. උපදි, 2. මෛත්‍රෙත්නාය,

මේ සිව් බණන කල ම සිතී, මූර්ඡා වශයෙන් සංඥා නැත්තා හට සතියකු දු අසස් පසස් නො පවත්නී, සිත ඇතිතාක් කල "මළහ යි නො කියහැක්ක. යම් කලෙක් ඔවුන් සිත නො පවත්නේ[1] වී නම් එකල ඔහු මළහ. ඈර දවා පියව යෙති, කායදණ්ඩ නිරිහය,[2] නිර්ව්‍යාපාරය, වාග් දණ්ඩය ද් එතෙක් ම ය ඔවුන්ගේ චුති ද් පිළිසැඳු ද් සිතින් ම වෙයි. මෙසෙයිනු දු මනොදණ්ඩය ම මහත. බිදි ද්, චුති ද් පිළිසැඳු ද් දෙන බැවින් අපගේ මහදුවටහු 'ශේ සාර්‍ථ අභෙොසීාණිකායැ යි සලකා බුදුන්ගේ විසිතුරු පැන විසජුන්[3] ඇසියටි ව එසේ ද හොත්–

මහණෙ! කායදණ්ඩය ම මහාසාවද්‍ය,,යි කී. එසඳ බුද්හු අනෙක් කාරණයක්[4] දක්වන්නාහු,

මහසිට! මේ ලෝකයෙහි නුවටෙක් තෙමේ සතුන් නො මරයි[5] නො ද මරවයි, සමාදන් නො ද කෙරෙයි, සොරකම් නො කෙරෙයි, නො ද කරවයි. සමාදන් නො ද කෙරෙයි, බොරු නො කියයි, නො ද කියවයි. සමාදන් නො ද කෙරෙයි. පස්කම් ගුණ අනුභව නො කෙරෙයි. නො ද කරවයි. සමාදන් නො ද කෙරෙයි. සිහිල් දිය මළු දඹු පරණලා හකුරු කැබිලි පණුවග යෙයි. හේ ඇක් මෙන්නේ බොහො පණුවන් මිරිකා මරයි උහුට නිගණ්ඨ නාථ පුත්‍ර කිනම් විපාකයක් දක්වයි? වදළහ.

මහණෙ! "චෙතනා නැත්තෙන් මහාසාවද්‍ය කොට නො දක්ව"යි කිය.

(**මහසිට!**) ඉදින් චෙතනා ඇත්නම් කවර කොටසැ එව දක්ව යි වදාළෝ.

මහණෙ! මනොදණ්ඩයෙහි එව දක්ව යි,,කියැ.

මහසිට! මහසිට!! සිහි එළවා කියා, තා පළමු කී බස් හා දූන් පසුව කියන බස් හා සවිත නො වෙයි වදාළෝ.

---

1. නොපවත්නී, 2. නිරිහන, 3. විසජුම්, 4කාරණයෙන්, 5. නොද මරයි.

මේ සිටි බණන කලම සිතී, "අපගේ මහනුවට චේතනා නැති කම් අල්ප සාවද්‍ය කොට, චේතනා ඇති කම් මහා සාවද්‍ය කොට දක්වා, චේතනාවට මනොදණ්ඩය"යෙයි. "ඔහුගේ කාථා අනෛකාන්තිකය"යි සිතා මොවුන්ගේ කාථා නෛකාන්තිකය යි සිතා වැළිදු බුදුන්ගේ ප්‍රසන්න විසිතුරු ව්‍යාකරණ ඇසියටි ව නො අනු දත්. එසඳ බුද්හු අනෙක් කාරණයෙක් දක්වන්නාහු–

මහසිට! මේ නාළන්ද නම් නුවර බොහෝ ඇතුන් අසුන් මිනිසුන් විසින් ගහනයෑ, ඉදින් පුරුෂයෙක් කඩුවක් ගෙන අවුදු, "මේ නාළන්ද යෙහි යම්තාක් සත්තු ඇද්ද. ඔවුන් එක පහරින් මරා මස් රැස්කොට පියම්"යි කියන්නේ වීනම් හේ කරන්නට තිස්ස හෝ? යි, වදාළහ.

වහන්සේ! දහසක් දෙනෙකු දු එයට නො තිස්සහ, එක පුරුෂයෙක් නම් කුමට තිසිදැ යි කීය. කියග–

මහසිට! මේ ලෝකයෙහි සෘඩිමත් මහණෙක් හෝ බමුණෙක් හෝ අවුදු දැහැවැ, "මේ නාළන්දුව එකාවට හසම කොට පියම්"යි කියන්නේ වීනම් හේ එය කරන්නට තිස්ස හෝ? යි වදාළහ.

වහන්සේ! මෙවැනි දස නාළන්දුවකු දු විසි–තිස්- සතලිස්–පනස්–නාලන්දුවකු දු, එකාවට හසම කොට පියන්නට තිස්ස. එක නාලන්දුයෙක් නම් උහුට කිමෙක්දැ? යි කීය.

මහසිට! සිහි එළවා කියා! තා පළමු කී බස්, හා දැන් පසුව කියන බස් හා සටින නොවෙයි, වදාළහ.

* * * * * * * * *

වැළිදු බුදුන්ගේ විසිතුරු ප්‍රතිභාන දැක් කැටිව නො අනු දත්. එසඳ බුදුහු අනෙක් කාරණයක් දක්වන්නාහු

මහසිට! දණ්ඩකාරණ්‍ය, කාලිඞ්ගාරණ්‍ය, මෙධ්‍යාරණ්‍ය, මාතඞ්ගාරණ්‍ය වල් වූ පරිදි හා ඇසූවිරිද්ද? යි වදාළහ. ඇසූවිරිමි වහන්සේ යි කීය. ඒ කිමෙකින් වල් විය?[2] යනු ඇසූවිරිද්දැයි[3] වදාළහ. සෘෂීන්ගේ දූහැවිලි වලින් වල්වීය යනු ඇසීමි යි —පෙ— කී, සාල්හි–

2. උපාලි සිවුහු බුදුන් සරණයාම.

බුද්හු "මහසිට! මහසිට! සිහි එළවා; කියා තා කායදණ්ඩ මහතැ'යි පළමු කී බස් හා දූන් 'මනොදණ්ඩ මහතැ'යි පසුව කියන බස් නො ගැළපෙ"යි වදාළෝ.

උපාලි ගහපති "වහන්සෙ! මම පළමු උපමායෙන් ම ප්‍රසාද කොළෙමි. එතෙකු දු උව භගවත්හුගේ විසිතුරු ප්‍රශ්න ව්‍යාකරණ ඇසියටි වැ විරුඬයක්හු වැනිවිමි"යි පැහැද සරණ ගියේ.

බුද්නු "මහසිට! සිතා පිරික්සා සරණ යනු මැනව. තොපවැන්නවුන් මා දූක සරණ යන කලැ නුවටුන් දූක නුවටුන් සරණ යන කලැ 'මේ උපාලි මහසිටි දුටි දුටි වන් සරණයෙ'යි යනු නො කියවුව මැනැව, තොප වැනි ප්‍රසිඬ මිනිසුන් සිතා පවත්නා තැනැ යෙදෙ"යි වදාළෝ.

(**උපාලි**) "වහන්සෙ! මම සිතා පිරික්සා සරණයනු මැනව' යන මෙසින් ම ඉතා සතුටිමි. වහන්සෙ! නිඨකයෝ සවුවන් ලද්කල 'අසුවල් රජ අසුවල් ඇමැති අසුවල් සිටි අප සරණ ගියේ සව් විය'යි ධවජ නඟා නුවර හඬගහා ඇවිදිති. තමන් මහත් බව් පාළකරනු සඳහායැ. මා ත් ලද් කල එසේ කළහ. වහන්සෙ! 'සිතා පිරික්සා සරණයන්නට වදාරනද්ද'ය. වහන්සෙ! මම දෙවන වට ද් සරණ යෙමෙ යි සරණ ගියේ.

බුද්හු "මහසිට! තාගේ ගෙය බොහෝ දවසක් නුවටනට පැන් පොකුණක් සේ සිටියේ යැ. පෙර තොප ආනාක් දෙනහට

1. ප්‍රතිභාවත. 2. වල්වද. 3. ඇසිදූයි.

'නැතැ'යි නො කියා දෙයි. දැන් මා සරණගිය බැවින් ම ඕහට දෙන දෑ නො සිඳ ආ කෙනෙක්හට දෙන්නෙය''යි වදාළහ.

(උපාලි) "වහන්සෙ ! මම් ම නුවටුන් කියන්නා ඇසුයෙමි. 'මහණ ගොයුම් මට ම දන් දියයුත්තේයැ. මාගේ සව්වන්ට ම දන් දියයුත්තේ යැ. මට ම දුන්නෙහි ඵල මහත. මාගේ සව්වනට ම දුන්නෙහි ඵල මහත, අනුන්ගේ සව්වනට දුන්නෙහි ඵල මහත් නොවේ'යි කියන්නාය. දැන් වහන්සේ මා නුවටවුන් කෙරේ ද දන් සමාදන් කරවන දෑය. මම් ම එයට කටයුතු දන් මි. වදාරන දෑයට සතුටිමි. වහන්සෙ ! මම තුන්වනවට ද් සරණයෙමි''යි මෙසේ තුන්යළක් තුනුරුවන්හි සරණගියේ. එකල්හි-

උපාලිගහපති හුනස්නෙන් නැඟී බුදුන් වැන්ද.

බුද්හු ඔව්හට සිවුසස් දෙසූහ. හේ සෝවාන්ඵල පසක් කොට දුට්ධම් ඇතිව පත්ධම් ඇනිව දත්ධම් ඇතිව "වහන්සෙ! ඇප් බොහෝ කයඞී ඇත්තම්හ''යි කීයැ. කල්දන මහසිට''යි වදාළහ.

අභ්‍යාස ප්‍රයොග.

සාමාන්‍ය ප්‍රශ්න.

1. "බුත් මනොදණ්ඩ ඇති නුවටහු මනස්සත්‍ය නම් දෙවියන් කෙරෙහි උපද්දි" මෙහි මනොදණ්ඩ භෙදය වන හැටි සොයනු. ඒ නුවටහුගේ චරිතය පැහැදිලි කරනු. ඔහු කවර ධර්මයක පිහිටිබව සිතියහැකි ද?
2. "කායදණ්ඩ නිරීහය" "පරණුලා හකුරු කැවිලි පණුවහ" මෙහි අදහස් වහරෙහි යෙදෙන සේ ලියනු.
3. මනොදණ්ඩය මහා සාවද්‍ය බවට කාරුණු දක්වනු.
4. මුල්වරම කාරණය මැනවින් පැහැදිලි කළ නමුත් උපාලි සිටුහු ඒ පිළි නො ගැණීමට හේතු දක්වනු.
5. උපාලි ගෘහපතියා හා බුදුරජාණන් වහන්සේ අතර පැවැති කථාව ප්‍රශ්නොත්තර වශයෙන් ලියා දක්වනු.

ව්‍යාකරණ ප්‍රශ්න.

1. "නුවටෙක් – – **ලෙඩක් ව** සිහිල් දිය නො ලද්න් මෙළේ" "පිළිසඳ **හෝ** අරන්නට **නො හැක් කාහ**" මේ වැකිවල ක්‍රියාකාරක පදසම්බන්ධ ලියනු. මෙහි කළු අකුරු ඇති පද කවරහුද?යි දක්වනු.
2. බුද්හු– රක්මි– පිළිසඳුද්– මෙහි දක්නා වියරණ විදි කවරහු දැ යි ප්‍රකට කරනු.
3. "හසම කොට පියෙමි," මේ කොබඳු ක්‍රියා විශෙෂ යෙක්ද? මෙබඳු ව්‍යවහාරයට හේතු දක්වනු.

උඩඟු සිටු දූවක.

ප්‍රධාන කරුණු.

(1) දිඨමඞ්ගලිකා යන නාමය, (2) දිය කෙළියට යාම, (3) මාතඞ්ගට පීඩා කිරීම හා ඔහුගේ අධිෂ්ඨානය, (4) පූරා සත සිරිතක්, (5) මාතඞ්ගට දිඨමඞ්ගලිකා පාවාදීම, (6) දිඨමඞ්ගලිකා මාතඞ්ග කරට ගෙන නුවර ඇවිදීම.

1. දිඨමඞ්ගලිකා යන නාමය.

අතීතයෙහි බරණැස් නුවර සතළිස්කෙළක් ධන ඇති සිටක්හුගේ දිඨමඞ්ගලිකා නම් එක ම දූවක් වුව. යහපත පැහැපත රූපත හෝ රූපසම්පත්තින් කුසලසම්පත්තීන්[1] භොගසම්පත්තින් සම්පන්න වන බැවින් බොහෝ දෙනා විසින් පතනලද. යමෙක් යමෙක් ඇය කැමැති වී ද, ඕ[2] ඔහු දුසා ඔහුගේ ජන්මයෙහි හෝ අත්පාආදියැ හෝ දොස් දක්වා, "උහු කෙරෙහි කවුරු වෙසෙති? ඔබ නෙරපියව" යි නෙරපියවා[3] මෙසේ වූවක්හු දිටිමි; දිය ගෙනෙව; ඇස්දෝනට යැ"යි දිය ගෙන්වා ගෙන ඇස් දෙවී. එයින් හෝ දිඨමඞ්ගලිකා නම් වුව. මූලු[4] නම් අතුරුධන් වී.

2. දියකෙළියට යාම.

හෝ එක්දවසක් ගඟැ දිය කෙළිහට යා යටිවැ තොට සදවා බොහෝ කන බොන දෑ ගැල්පුරා සරහවා ගෙන බොහෝ ගඳ මල් දුම් ආදිගෙන පිළිසත් යානාවකට නැඟී නැ නො නැ පරිජනයන් පිරිවරා ගෙන් නික්මුණු.

එකල්හි අප මහසත්[5] සාමීපරවශ වැ, සැඬොල්කුලෙහි

---

1. කුලසම්පත්තීන්. 2. ඔවුනොවුන්, 3 ඔහු ඔම පියවා 4 පළමු. 5. මහබෝසත්.

උපෙද, පිට්නුවර[1] සම්ගෙයොසා වෙසෙසි. ඔව්හට මාතඞ්ග නම් නමෙක් වියැ. හේ සොලොස් හැවිරිදිකල්හි කිසිකාරිය යක් සඳහා ඇතුළු නුවරට වැද්දවිවූයේ. එක්තිල්පිළියක් හැඳ එක්තිල්පියල්ලක්[2] අතබැඳ එක්අතෙකින් පැසක් ගෙන, එක්අතෙකින් ඝණ්ඨාවක් ගෙන, "පහවව. සැඩලෙක්මි" දත් වනු සඳහා වයමින් යටත් සිතින් දුටු දුටුවන් වඳමින් නුවරට වන. එකල්හි දිඨමඞගලිකා ඝණ්ඨායෙහි හඩ අසා ජවනිකා අතුරෙන් බලන්නී ඔහු දුරින් එන්නහු දක, "මේ කවර"යි පිළිවිස. සැඩලෙක යනු අසා "ඇපි කිනම් අකුසලයක් කළම්හ හො? මේ කවර පාපයාගේ විපාකය හෝ? මා නස්නා කාලෙක් වන්නේ වෙයි, පිරිසිදුවන්නට යනුයෙම් සැඩලක්හු දිටිමි"යි සිරිරූ වෙවුල්වා ගරහා කෙළ පියා දක්නට "වහා දිය ගෙනෙව. සැඩලක්හු දුට් ඇසද් නම් කි මූවය ත් දෙවිය මැනැවැ"යි දෙව රථය නවතා ගෙන හැම දූ ගෙට දි යවා ගොස් පායට නැංග.

3. මාතඞ්ගට පීඩාකිරීම හා ඔහුගේ අධිෂ්ඨානය.

රහසොඬ ආදීහු ද් ඇයගේ පරිජනයෝ ද් "සැඩොල්හු නිසා රහ මස් ගඳ මල් ආදි වළඳනාරනු නො ලදුම්හ, ඔහු ගත මැනැව"යි ගොස්, නිවරද මාතඞ්ග පණ්ඩිතයා තර්ජන කොරෙමින් කොහෙයෙහි ගෙන බිම පැහැර හෙළා පියා විළුඹින් වැළම්ටින්[3] පහණින් තළා මළහ"යි සිතා පාගෙන ඇද කසලගොඩ දමා පියා ගියෝ.

මහසත් සන ලදින් අත්පා පිරිමැද මෙදුක් මට වූයේ[4] දිට්ඨමඞගලිකාව නිසාය, ඉදින් මම් පිරිමියෙකිම් වීම් නම් ඇය මට පාදපරිචාරිකා කරවම්"යි සිතා වෙවුල්මින් ඇයගේ ගෙට ගොස් "දිට්ඨමඞගලිකාව ලදහොත් මෙතෙනින් නැගෙම්. නො ලද මෙහි ම හෙව මියෙමී" ගෙඅඟණයෙහි හොනී.

---

1. සිටි නුවර-සිව් නුවර. පිටිනුවර. 2. පිසල්ලක්. 3. වැළම්ටෙන්. 4. දුක් උපන්නේ.

4. පුරාතන සිරිතක්.

එසමාහි දඹදිව යමක්හුගේ ගබ දෙර සැඩොලෙක් දැගැව හෙව මෙලේ වී නම්, යම්සොතෙක් එ ගබ වෙසෙද්ද ඔහු හැම සැඩුල් වෙති, ගෙමැද හෙව මෙලේ වී නම්, ගෙවැස්සෙසෝ හැම දෙන සැඩුල් වෙති, දෙර හෙව මෙලේ වී නම් එග්බිති[1] දෙගෙහි ඇත්තෝ සැඩොල් වෙති. ගෙඅඟණ යෙහි හෙව මෙලේ වී නම් දෙපසින් සත් සත් ගේ බැවින් තුදුස් ගෙහොක මිනිස්හු සැඩොල් වෙති "යි යන ව්‍යවස්ථායි.

5. මාතඞ්ගයාට දිට්ඨමඞ්ගලිකා පාවාදීම.

එකල්හි මගසනේ වනාහි ගෙඅඟණයෙහි හොත්තේ යි එකල්හි සිටිහුගේ පරිජන යෝ සවාමිය! ගෙඅඟණයේ සැඩොලෙක් හොත්තේය යි කිහ. කුමට හොත්තේ දෝ? යි ගොස් පිළිවිස බලා මේ මස්ස උහුට දී නඟාපියවයි යවියැ. ජනයෝ ගොස් මේ මස්ස ගෙන නැඟී යායි කිහ. මම් මස්සක් නිසා හොත්තෙම් නො වෙමි. දිට්ඨමඞ්ගලිකාව නිසා හොත්තෙමියි කිය. ඇය කවර වරද්ද?යි කිහු. මා නිරපරාධයහට ඇය ගැත්තන් කළ දෑ නො දක්ව? ඇ ලද, හොත්[2] නැතින් නැඟෙමි. නො ලද නො නැඟෙමියි කිය. සිටි එපවත් අසා දුවගේ දෙස් බැව් දැන එක් කහවණුවක් දී යවිය. මම දූරිය කැමැත්තෙමි කහවණු[3] නො කැමැත්තෙමි යි කිය. සිටි දු සිටිදූ දෑ[4] "අප සෙනෙහැති එක ම දුව, වංශය රක්නට තිසි අනෙක් දූරියක් ඇත්තේ නො වෙයි, කිය පත්ව "යව දරුයෙනි! අප නො පසස්නා[5] යමෙක් ඔහු මැරුයේ වී නම් අපි හැම දෙනමෝ නස්මහ[6] ඔහු රක්ව"යි වටා ඕහට රකවල් දෙවා ගඹු දී යවූහ. බත් දී යවූහ. හේ එසිදු පිළිබෙව් සොලේ. මෙ නියායෙන් දවස් යත් යත් දෙපස්හි සත් සත් ගෙහි මිනිස් නැඟී "ඇපි තොප නිසා සැඩුල්

1. එක්බිති. 2. ඇය ලදින් හොත්. 3. කහවුණු. 4. සිටු, සිටුදූ.
5. {නො සස්නා. / නො නස්ව} 6. {නසුම්හ. / නස්නාමෝ.}

වින්නට නො හැක්කම්හ. අප නො නසව. දූරිය දී[1] ඔහු කොන් තැනින් නහා යව"යි කීහු. ඔහු ක්‍රමයෙන් සියයක් දී දහසක් දී ලක්‍ෂයක් දී යවූහ. හේ එයි ද පිළිබෙඹ් කෙළේ.

මෙසේ ස දවසක් ගියකල දෙපස්හි තුදුස් ගෙහි මිනිස්සු රැස්ව "අප සැඩොල්හු නුවූව මැනව. තොප නො කැමති ද දූරිය ඇපි ඔහුට ඇරදෙම්හ"යි කීහු. මව්පියෝ ශොකපත් වැ සත් නැති වැ ගොස් යහන්හි ගැළහුනහ. ඔහු[2] දූරියගේ සිරි යහන් ගබට වැද දූරිය හැරගෙන සුපිපි කැහැලරු කොක්හි මල් අතු බිඳිනවුන් සෙයින් ඇයගේ සව්බරණ ගලවා තියෙන් සීමාන්ත දක්වා සැඩොල් කොහෙ බැඳ තිල්පිළියක් ගඳවා තිල් දියල්ලක් අත බැඳ කන තුඹුපව පළඳවා තල්පත්[3] පැසක් දී දෙ අත් කරගෙන පහයින් බහා ඇරැ තී සැමියා නෙන යවයි මහසත්හට දුන්හු.

6 දිට්ඨමඞ්ගලිකා මාතඞ්ග කරට ගෙන නුවර ඇවිදීම.

තිල්මානෙල් මලකු දූ ඉතා බරැයි නො පලඳනා ඉතා සියුමැලි දූරි නැහෙව හිමි! ගියන්නි "උට්ඨාහි සාමි"යි කීව. මහසත් මම් උට්ඨාහ නම් නො වෙම් යි කිය. කැළි කුම් යෙමී දූ?යි කිව. නැගෙව හිමි මාතඞ්ගයයි කිය. ඇය එසේ කී කල්හි "තීගේ මිනිස්හු මා නැගී හිඳුනා පමණ කාති නැති කළහ" දෙ අත් කරගෙන නහා ගනැයි කිය. ඇය[4] තමා නහා ගන්නා කල නැහෙනවන් වැ පෙරළී බිම වැටී ගි. දිට්ඨමඞ්ගලිකාව විසින් නටම්. පළඹු මා තමාගේ මිනිසුන් ලවා තළවා දූත් තොමෝ තළයි හැඞිය. එකල අත්ලා නහා හිඳුවා යම්හ හිමි'යි කියන්නි "ගච්ඡාම සාමි!"යි කිව. මහසත් "ගච්ඡයෝ නම් වල වෙති. මම තී ගැත්තන්විසින් තරකොට තළාපියනලද්දෙම්. පයින් නො යා හෙමි. පිට[5] හිඳුවා මා ගෙනයායි කීයැ. හෝ නැමී පිට්දී මහසත්හු තමා පිටට නැගී

1. දූරිදී. 2. උනු. .3 තල්පොත. 4 ඇයත්. 5. පිටින්.

කාල සොයට ගෙන යෙම් දෑ?යි[1] කිව පිටිනුවරට[2] ගෙන යායි කිය. හෝ පැදි දෙර තුරට ගොස් හිමි තා වසන්නේ මෙහි වේදෑ?යි කිව. මේ කොහැනෙක්දෑ?යි කිය. පැදිදෙර **තුරය** 'හිමියි කිව. පැදිදෙර තුරෙහි සැඩොලුන් නො විසිය හැක්කැයි කිය. මෙසේ තමා වසන තැන් නො කියා ඈය හැම දෙර තුරේ ඇවිද්දපී. මෙසේ කුමට කොළේයයත්? හව අග් දක්වා නැහි මි ගිසුන්ගේ මන් බිදුනා සඳහා කොළේ. මහාජනයෝ "පොප තබා මැගේ මන් බිදුනට තිසි අනෙක් කොතෙක් නැතැයි" ගුගුළෝ. හෝ පැළදෙර තුරට පැමිණ "හිමි තා වසන් ෙන් මෙහි වේ දෑ?යි පුළුවුත.[3] මේ කොතෙනෙක් දෑ?යි කී කල්හි පැළදෙර තුරය හිමි"යි කිව. මේ දෙරින් නික්ම සම්ගෙ බලමින් යා'යි කීයැ. හෝ එයට ගොස් "මෙ සම්ගෙය තා වසනතැන්දෑ? හිමි!යි කිව. මා වසන තැනය"යි ඈය පිටින් බැස සම්ගෙට වනී.

---

1. යෙම්ද හිමි යි. 2. පිටිනුවරට. 3. පුළුහුන.

අභ්‍යාස ප්‍රයෝග.

සාමාන්‍ය ප්‍රශ්න.

1. දිළිම්බගලිකා-යනු කවර නාමයක්ද? ඒ නම ලැබීමට හේතු කවරහු ද? ඇයගේ ස්වරූප පේළි 10 කින් යුත් වැකියකින් දක්වනු.
2. එකල පැවැති නරක සිරිත් මේ මේ ය යි පොතෙන් දැක්විය හැකිතාක් සහේතුකව ලියනු.
3. දිළිම්බගලිකාවගේ මානයෙන් වූ වැඩ හෝ අවැඩ දක්වනු.
4. චණ්ඩාලස්ත්‍රියකගේ ද පුරුෂයකුගේ ද ස්වරූප දක්වනු.
5. දෙගුරුන්ට ද සුවච නො වූ ඈ මානබඟ වචනයෙන් කුමක් නිසා ඔහු කරින් ගෙන නුවර සැරිසැරුවා ද?

ව්‍යාකරණ ප්‍රශ්න.

1. **නිලසියල්ල-විඑඹින්-පිළිමෙබව**. යන පදයන්ගේ නිෂ්පත්තිය ලියනු.
   "විඑඹින්" යන්නෙහි ප්‍රකෘතිය ලියා ඒ වරනගනු.
2. **වුව- දෙව්- නික්මුණු- වන,** යන ක්‍රියාවන්ගේ උක්තපද හා ධාතු ප්‍රත්‍යයන් දක්වනු. විමෙහි **ව** ධාතුව අයු-වත්මන්හි වරනගනු.
3, **දෙපෙලාස් යොදුන් අත් බව්- ඇතුළු නුවර- සඳ මඬල**- යන පදයන්හි සමාස වාක්‍ය ලියනු.

පුරාවිද්‍යා ප්‍රශ්න.

1. **කහවුණු- මස්ස-** මේ මුදල් කවරකල කවරුන් වහරෙහි යොදනලද ද: එකිනෙකෙහි ස්වරූප හා වටිනාකම දක්වනු. කොතෙක්කල් මේ වහර පැවතීද? කවර කල සිට මේ වහර නැතිවී ද?

පුදුම තාපසයා.

ප්‍රධාන කරුණු.

**1. මාතඞ්ග පැවිදිවීම, 2. සැඬොල් ගෙට වන් නවුසා.
3. දිට්ඨමඞ්ගලිකා තම ගිම් මහ බඹුයයි කියා ඇවිදීම.
4. මාතඞ්ගපණ්ඩිත සඳමඩල බිඳගෙන ඒම.
5. දිට්ඨමඞ්ගලිකාව සියල්ලන් පුදනුලැබීම.**

1. මාතඞ්ග පැවිදිවීම.

දිට්ඨමඞ්ගලිකාය! මා හුදකලා කලැ මෙහෙ නොවිනුද්[1] නො කොට්නුද් වැටෙන්නට[2] නිස්සෙමි. දැන් වූ කල තා හුදකලා බැවින් මෙහෙ නො කොට වැටෙන්නට නො පිළිවන. මා එනතැන් දක්වා තෝ උසාටලි නො වා,,යි කියා ගොස් වනයට වැද සොහොන් පියළි[3] සොයා හඳනා පොරෝනා සිවුරු කොට රද පෙරවගෙන පැවිජිව කිසුණු පිරියම්[4] කොට සත්දවසින් අතුළත අටසමවත් හා පස්අභිඥ නිපයා, දැන් කලි දිට්ඨමඞ්ගලිකාවට වහල්වන්නට නිස්සෙමි යි අහසින් ගොස් සැඬල්ගම් දෙර බැස යිහමින් දිට්ඨමඞ්ගලිකාවගේ ගෙදොරට ගියෝ.

2. සැඬොල්ගෙට වන් නවුසා.

හෝ දොරසිටියන් දුක නො හැඳින, වඩව වහන්සැ! සැඬල්ගෙයකැ යි කිව. ඔහු නො ගොස් එහි ම වැඩසිටියෝ හෝ පුනපුනා බලන්නී හැඳින ළෙහි අත් පැහැර හඬා[5] පාමුල හී. හිමි? තොපට මෙවැනි සිතක් ඇති බැවින් මා මහත් යසසින් පිරිහෙළා අනාථ කුමට කළුව යි නො යෙක් දේ වැහැස ඇස කඳුළු පිසපියා නැඟී අතින් පයගෙන ඇතුළුගෙයි

---

1. කොවිතිද්‍ද. 2. නොවැටෙන්නට නිස්සෙමි. 3. සොහොන් පියළි. 4. පිළියම්. 5. ළෙහිපැහැර හඬගා.

වඩා හිඳුවා බත්දූන, වළඳ හිද, "දිඝමඬගලිකාව! [1]තෝ සොස් නො ව, නොවහස, මම් තීපා දෙව් දිය මුළු දඹදිව රජනට අභිෂෙකොදක කරන්නට පොහොසත්මි. තෝ මා කීවා [3]කාරා.

නුවර වැද [4]ම සැමි සැඩලෙක් නො වෙයි. මහබඹ යි හඬා[5] ගහා ඇවිද යි කීහු. හෝ මම් මාගේ මුවදෙරින් දූප්පත් වීමි." එසේ කියන්නට නො තිස්සෙමි යි කිව. ඔහු "මා ගිහි මිනිස්කල ත් බොරු [6]නො කියෙමි. දූන් පැවිජිව කුමට කියම් ද? අද පුර අටවක තෝ අන් සත් දවසකින්? පනුරසී පොහෝ දවස් ම සැමී මහබඹ සඳමඩල [8]පළාපියා මා කාරා එයි මුළුනුවර හඬගහා"යී කියා නැගී ගියෙ. හෝ හදහා සූරව සතුටු ව සවස හා [9]රූසිම්හි නුවර වැදූ කී පරිද්දෙන් හඬගහයි. මිනිස්හු අත්පිඩූ ගසා "බලව.' දිඝ මඬගලිකා අපට සැඩල්දරුවා මහබඹ සොරෙයි" [10]සෙමින් සොළි සොරෙන් හෝ අනික් දවස්හි ත් එසෙයින් [11]සවස දූ රූසිම් දූ නුවර වැදූ "අන් ස දවසෙකින් පස් දවසෙකින් සතර දවසෙකින් තුන් දවසෙකින් දෙ දවසෙකින් එක් දවසෙකින් ම සැමි මහබඹ සඳමඩල බිදපියා මාකාරා එ යි" හඬගැහූ. එකල බමුණෝ මේ දිඝමඹගලිකා ඉතා සූරව කියයි [12]සැබැවෙක් වන්නේ වෙයි. ඒ දිඝමඹගලිකාවගේ ගෙය සදම්ය යි ගොස් ගෙය වටා වැලි එවූහු, හෝ ද පොහෝ දවස් රූසිම් මෙහි නුවර වැද "අද ම සැමි එ"යී හඬතැගුහු.

8 දිඝමඩගලිකා ගිම් බඹැයි කියා ඇවිදීම.

---

1. කී රොස් නො වා
2. දෙවිය.
3. කරූ. / කරනු,
4. මාසැමියා.
5. හඬගහා.
6. නොකිගම්.
7. පණුරූසී. / පුණුරූසී.
8. බිදපියා.
9. රූසිම්හිදූ.
10. සෙමින්.
11. සවස රූසිම්දූ
12. සැබෑවෙක්.

4 මාතඞ්ග පණ්ඩිතයා සඳමඬල බිඳ ගෙන ඒම.

බමුණෝ මෝ හුදුරුකොට කියති. අද මහබඹ 13ඒල වසනතැනක් බලම්හ යි ගොස් සම්ගෙය පිළින් වසා තිම සිවුහදින් තෙමෙර ගෙන උඩ සෙල්වියන් බැඳ ගඳ දුම්ත් මල්දුම්න් ලලදී සැදූහු. ගෙය සදද් සදද්, හිරු එළ් සිණ මහසත් සඳ තැගෙත් ම ඉද්හයෙන් දෙලොස් යොදුන් බඹවෙයක් මවාගෙන අගසට නැගී සඳවිමන් ඇතුළට වැද වත අගනායෙන් නැගෙන සඳ බිඳැ තික්මැ සඳවිමනට පෙරට වැ මහාජනයෝ මා දකිත්ව යි ඉටූහු. ජනයෝ ඔවුන් දූත "දිඪමඞගලිකාව කී දූ සැබව, එන්නේ මහබඹ, තිසඟු පුදම්හ"යි ගඳමල් ආදි ගෙන ඇයගේ ගෙය පිරිවරා සිටියෝ, මහසත් නුවර මුදුනෙහි සත් යළක් වටා ඇවිද මහජනා දූවබව් දූත දෙලොස් යොදුන් අත්බව් හැර, 2 මිනිස් පමණ කොට ඒවා හැම දෙනා දක්නා සේ සම්ගෙට ගොස් වත.

ජනයෝ දූසා අපගේ මහබඹ බට යි. ජවනිනා ගෙන්වා ගෙන වටා බඳවා පිරිවරා සිටියාහ. මහසත් සිරියහන්මැද වැඩහිඳ දිඪමඞගලිකාව වැළන්ව සිටියට තෝ ඔසප්හු වෙහි දූ යි කීය. එසේය, හිමි යි කිව. මාදුන් පුතක්හු ගතැ යි, ඇඟිල්ලෙන් නැබ මඩුලු පිරිමටහ, එ ම විගස ගැබ් පිහිටිය. මෙ පමණෙකින් තී පාදෙව්දිය මුළු දඹදිව රජනට අභිෂෙකො දූත වෙයි. තෝ සිට යි කියා බඹ අත්බැව් මවා හැම දෙනා දක්නා සේ නික්මැ අගස නැගී සඳමඬලට ගොස් වති.

---

13. එළඹ. 14. තෙමෙරගෙන.

1. උදයගිරි අතනසෙත්. 2. අතුරු දහන්කර.

3. ජන්ම ඇතියන්.

4. {වදනී.
{වන්දනී.

6 දිඹමඩගලිකාවට සියලුදෙන පුදන්ට වීම.

හෝ එ තැන් පටන්ගෙන බ්‍රහ්මප්‍රජාපතී නම් වූව. බමුණෝ මහබඹනු අඹුව ඇතුළු නුවර වූව මැනැවැ යි, ඇය සව්බරණින් සද, සවර්ණසිවිකායෙක්හි හිඳුවා ගෙන සත්වන කුල සොළවර දක්වා නො පිරිසිදු කුල ඇතියන්[3] සිවිගේ නො ගත දී පිරිසුදු කුලඇති බමුණන් සොළොස් දෙනකු ලවා ගන්වා ගඳමල් ආදීන් පුදමින් නුවරට ගෙන වැද බ්‍රහ්මප්‍රජාපතිය ඉඳුල්ගෙහි නො විසිය හැක්ක. කිම්පිස ගෙකක් කරවම්හ. කරවත තැන් දක්වා මඩුයෙහි වුසුව මැනවැ යි, මඩු ගෙකොක්හි වාස කැරූවූහු.

එ තැන් පටන්ගෙන ඇස්හමුයෙහි සිට ඇය වැන්දටියෝ කහවුණක් දී වඳිත්. [4]බස් ඇසෙන තැන සිට වැන්දටියෝ සියක් දී වඳිත්. ළඟ ව සිට වැන්දූටියෝ පන්සියයක් දි වඳති. පාවිට ගිස් තබා වැන්දටියෝ දහසක් දි වඳති. පාදෙව්දිය කැමැත්තාහු දසදහසක්දි ගන්ති. පිටිනුවර පටන් ගෙන ඇතුළු නුවර මඩු තැන් දක්වා එන්තිය. [2]ලද් ධන සියක් සොළ පමණ විය. සියලු දඹදිව රජහු බ්‍රහ්මප්‍රජාපතියගේ පාදෙව් දියෙන් අභිෂෙක කරම්හ යි පිටිනුවර පටන් ගෙන ඇතුළුනුවර මඩුතැන් දක්වා ලක්‍ෂ ලක්‍ෂ දී ගෙන්වා ගෙන ඇය පාදෙව් දිය මුදුනෙහි ඔති.

---

4. වඳති. විත්දති.

අභ්‍යාස ප්‍රයොග.

සාමාන්‍ය ප්‍රශ්න.

1. මාතඞ්ග පැවිදිවීමට හේතු කවරහු ද?
2. ඔහුගේ පැවිද්දෙන් ලත් ප්‍රයොජන මේ මේ යයි පැහැදිලි කරනු.
3. සැඩොල් ගෙට වත් තවුසා හා දිඨමඞ්ගලිකාව අතරවූ කථාව දෙබසක් කොට ලියනු.
4. යමක් නිතර කිමෙන් ලැබෙණ ප්‍රයොජන මෙයින් උගත් ලෙස ව්‍යක්තාව ලියනු.
5. දිඨමඞ්ගලිකාව බමුණෝ කෙසේ පිදූහු ද?
6. අට සමවත් -පස් අභිඥවන් දක්වනු.

ව්‍යාකරණ ප්‍රශ්න.

1. "තෝ ගොස් නො ව." "මඬු ගෙකොක්හි වාසකැරැ වූහ" මෙහි වියරණවිදි පැහැදිලිකර ගෙකොක්හි යනු සිඩකරනු.
2. "ළඟව- වඳති- ඔති" යන පද සිඩකරනු.
3. "තෙවෙර- මල්දම්න්- ලල්දී- ඉඳුල්ගෙයි- පිරීම්ටහ මේ පදයන්ගේ අර්ථ හා වර්තමාන ව්‍යවහාරයද ලියා නිෂ්පත්ති දක්වනු.
4. දිඨමඞ්ගලිකාවගේ චරිතය ලුහුඬින් ලියනු.

මණ්ඩපප කුමාරයා.

ප්‍රධාන කරුණු.

(මණ්ඩපප කුමරුගේ උත්පත්තිය. 2. ඔහුගේ දන විධිය. 3. ඕහට මාතඞ්ග පණ්ඩිත හමුවීම. 4. මාතඞ්ග ඕහට දුන් අවවාද. 5. ඔවා බසින් කිපි කුමරු. 6. මාතඞ්ග පලායාම හා කුමරුට වූ විප්‍රකාරය. 7. දිට්ඨමඞ්ගලිකා වහසන් සොයා යාම. 8. මාතඞ්ග දුන් අමා ඔසු. 9. මණ්ඩපප කුමරුගේ මුළාව දුරුවීම.)

---

1 මණ්ඩපප කුමරුගේ උත්පත්තිය.

මඩුයෙහි වෙසෙමින් පුතකු ලදූ මහපුරිසා පිණිස උපන් කුමර ඔහු සේම යහපත් විය. හැම ලකුණෙන් පරිපූර්ණ වී. මහමඔහු පිතෙක් උප නැ" යි සියලු දඹදිව ඒක කොලාහල විය. කුමරහට කිරිමිල වැලමිල ය" යි ඒ ඒ [1]දිගින් අල ධනය දසදහසක් සොළයැ. පහයද් නවහම් දසමසින් නිමියැ. කුමරහු නම් තබම්හ යි ගෙ සඳ දරුවා ගඳදියෙන් කුමරබරණ පළඳවා පහයට වඩා මණ්ඩපයෙහි උපන්නෙන් මණ්ඩපප නම් කොළෝ.

කුමරහු [2]සුවයෙන් මහත්[3] පෙරහරින් මහත් පිරිවරින් වැඩ සත් හැවිරිදි [4]වයසට පත් කල්හි සියලු දඹදිව ශිල්ප දන්නා තාක් දෙන අවුදු ශිල්ප උගත්වති. දරු නුවණැත්තේය. ඇසු ඇසුවා මුතු අවුණන්නක්හු සෙයින් ගත්ති. ගත් ගත් දූ රන් බජනෙහි ඔත් සිහතෙල් සෙයින් [5]සිටී. බසින්

1, තැනින්. 2, සුවසේ. 3, පෙළහරින්.
4. විය පැමිණී. 5. තහවුරුවී.

උගන්නා තාක් දූයින් ඔහු නො උගත් දූතම් නැති. බමුණෝ ඔහු පිරිවරා ඇවිදිති.

2 ඔහුගේ දාන විධිය.

හේ ද බමුණන් කෙරෙහි භක්ති ඇත්තේ යැ. සොළොස් ඇවිරිදි කල් පටන් ගෙන බමුණනට බත් දෙයි. නිත්තෙන් ගෙහි බත් කන්නාහු අසූදහසක් බමුණහ. ඔවුන් සතරවන දොරටුයෙහි හිඳුවා බත් දෙයි. එසේ දන් දෙමින් සිටිකාල එක්දවසක් ගෙයි කිරිබත් පක්හ. අසූදහසක් බමුණෝ සතරවන දොරටුයෙහි හිඳ ගිතෙලින් හා මීකාඩ සකුරෙන් කිරිබත් කති. දරු සව්බරණින් සැදී රන්මර වඩියට නැගී අතින් දළ දඬුවක් ගෙන මොහු පෙරට සකුරු තබව. මොහු පෙරට ගිතෙල් ඔව, මිනි ඔව යි කියමින් විචාරමින් ඇවිද්දි.

එකල්හි මාතඞ්ග පණ්ඩිත හිමවත්හි ආශ්‍රම පදයෙහි වසනුයේ දිෂ්ටමඞ්ගලිකාව පුතුගේ පවත් කිම හෝ යි බලනුයේ දුළුද් සැඩ සලා කිඹුල් මුවර සියෝ නො තොටට බට බව දැනැ අද ගොස් දරුවා දමා යම් සොනෙක්නට දුන් දනැ ඵල මහත් වේ ද, ඔවුනට දන් දෙවා අව මැනව යි සිතා අහසින් ගොස්........................සතර වන දොරටුයෙහි අසූදහසක් බමුණන් බත් කන තැනම බැස සිටියේ යි.

3 ඕහට මාතඞ්ග පණ්ඩිත හමුවීම.

මණ්ඩපකුමර බලනුයේ මහ සත්හු දැකැ දැහැව තා පහසින් නො ගත් බැවින් කසල පිසක්හු වැනිවූ තොට පියලි ගොතා ගත් බැවින් ලාමිකවූ මාගේ දන් පිළිගන්නට නො නිසි වන බැවින් දක්ෂිණෙය නොවූ නෝ මාගේ පරම දක්ෂිණෙයවූ බමුණන් හුන් තෙනට කුමට අයි" යි කිය.

4 මාතඞ්ග ඕහට දුන් අවවාද.

ඒ අසා මහසත් මෙළෙක් සිතින් අවවාද කරනුයේ යශස්විය. තානේ බත් යුතු සොළේය. ඒ බත් වළඳ ගන්නාහු. බොහෝ ජන්මවත්හ. යම් හැනෙක්හි දු ලැබෙති. සැඩල්නට දෙනුවෝ කවරහ. මට නොදූහැව, මා යපෙන පමණක් දෙ"යි කිය.

එසඳ කුමර මේ බත් මට වැඩ සඳහා සැදූහැ යෙන් ජන්මවත් බමුණන්ට යුතු කොළේය. අප වැන්නෝ තාවැති සැඩල්නට දන් නො දෙති, යා කුමට සිටිහි දූ යි කියැ. මහසත් "දන්නම් ගුණවද්නට ද් නො ගුණවද්නට ද් දිය යුත්තේ යැ. .. ..ඵල කැමති විහිනම් ආතාක් දෙනහට සැදූහැයෙන් දන්දෙ. එසේ දෙන කල සිල්වත් ගුණවත් කොනෙක් සමුඩු වුහු නම් සරු කෙත වපුළ බිජ් සෙයින් තට ඵල මහත් වේ'' යි කිහු.

කුමර "මම් කොත් හැඳින බිජ් පිහිට්වමි. ජාතිමත් වේද දන්නා බමුණෝ සරුකෙත්ත'' යි කියැ,.................... ... .මහසත්හු පුන පුනා සිල්වත් ගුණවත්නට

5 ඔවා බසින් කිපි කුමරු.

දුන් දනැ ඵල මහත් පරිදි කියත් කියත් දඩුයෙන් ප හ ළ ඇසිවසක්හු සෙයින් කුපිතවැ "මෙතුන් දෙරටුයෙහි ගොව්වෝ කොයට ගියහ'' යි කියැ. ඔහු අවුදු වෙළෙව්ව වැඳ සිටියාහ. මොහු කුමට වැද දුන් ව''? යි කිය. වදනා කල නුදුටු වම්හ. මෙනම් තැනෙක ගෙන අය යනු නොදන්මහ මායා කාරයෙක් දේ හෝ අප විසින් කළමනා කිමෙක් ද?'' යි කිහ. මොහු

6 ඔවා බසින් කිපි කුමාරයා.

මූහුණ පැහැර පලාපියා දඬුයෙන් හුණු පත්තෙන් සිපා පිට වරළු තගා පියා කරගෙන [1]සත්වන දෙරටුයෙන් පිට තට නෙරපියව'' යි කියැ. මහසත් ඔහු ළඟ නො වත

තුරු ම අහස නැඟී සිට "තො විදුරුගල් තියෙන් හැණියටියෙහි වහනෙ දතින් කැටියෙහි ගිනි ගිලියටියෙහි" කියා ඔහු දු බමුණනු දු දක්නා සේ අහසින් නැඟී ගියෝ.

6 මාතඞ්ග පලායාම හා කුමරුට වූ විප්‍රකාරය.

මහසත් පැදුම් දෙස බලා ගොස් වෙයක බැස මා පියවර දිට්ඨමඞ්ගලිකාවට පැනේව යි, ඇත් අස් ආදීන් විසින් නො මැකේව" යි ඉටා කෙණෙහි අහර සිහා ගෙන එක් සාලායෙක වළඳයි.

6 මාතඞ්ග පලායාම.

එ නුවර දෙවියෝ අපගේ සිල්වත් ගුණවත් වහන්සේට ඔහු බුණු සේ "නො යෙදෙ" යි දැහැවැ ගොස් ඔවුන් කෙරෙහි නායක යක්, දරුවා ග්‍රිවාව ගෙන පෙරලා තිබිය. සෙසු යක්හු සෙසු බමුණන් ග්‍රිවා ගෙනපෙරළා තුබුහ. මේ මහපුරිසා පිතැ" යි මෙළෙක් සිතින් නොමැරූහ. කුමරහු මුහුණ පෙරළී පිටිපස් බලාතැබූයේය. ඇස් පෙරළී මළ මිනිසුන් ඇස්වැනි වියැ. 2මියෙන් කෙල පෙණා වැහෙයි. සිරිරු තද වියැ. අත් පා දැඩිවී. සෙසු බමුණෝ 2මියෙන් පෙණ නහමින් පෙරළි පෙරළී අත් පා 3සිපත්. ඔහුගේ පරිජනයෝ ගොස් එ පවත් දිට්ඨමඞ්ගලිකාවට කිහ. හෝ වෙලෙව්ව පහසින් බැස ගොස් මපුත්හට මේ කළාහු කවරහ යි කිව. "ජනයෝ මෙයට ආ පවුල් පෙරෙව් මහණෙක මේ කෙළේ ය" සි කිහු.

7 දිට්ඨමඞ්ගලිකා මහසත් සොයායාම.

හෝ ඒ අසමින් ම අතික් කොනෙකුන්ගේ බල නො වෙයි මට මහත් සමපත් දුන් මාතඞ්ග පණ්ඩිතයන්ගේ බැලය. පුතු පමා සේ දැක ආයේයැ. හේ මෛත්‍රී භාවනායෙන් සමපන්නයැ. මෙතෙක් දෙනාහට 4මෙතෙක් දුක්පත් කොට නොවාපියා

සිතා හේ කොයට ගියෙ?" යි පිළිවිස පුත්සඳක් [1]සෙයින් තෙව්මින් පැදුම්දස බලා අහසින් ගියේ යැ. යනු අසා මපුතු දිවි සඳහා ඒ උතුමා අයදනට ගිය මැනවැ" යි රන් කලස [2]රන්මලා ගන්වා ගෙන දස් ගණා පිරිවරා ගොස් මහපුරිසා පියවර දක "මේ මහිමියා පියවරැ" යි බලමින් ගොස් ඔවුන් පුටුයෙක හිඳ වළඳන්නවුන් දක වැඳ සිටියැ. මහසත් ඇය දක මඳ බතක් පය තිබියැ. හෝ මහපුරිසා රන්කලසයෙහි දිය ගෙන [3]අත් දෙවා මුව දෙවා මපුත්හට මෙ දුක් කළාහු [4]කවරහ? හෝ?" යි කිව. තී පුතු තපස් වීනට කළ [5]ආක්‍රොශ දක ඔවුන්ගේ ගුණ දන්නා දෙවියෝ උහුට මෙතෙක් දූ කළහ යි කීහු. මම පුත්‍ර ශොකයෙන් [6]අොයෙමි. තොෂ සරණයෙමි. මපුත්හට [7]නො දූනැව" යි කිව. තීපුතු මට ආක්‍රොශ[8] කරනකල හෝ [9]දූත් තී අයදනාකල හෝ මා සිත දෙම්නස් ඇත්තෝ නො වෙයි. හේ [10]වේද මදයෙන් මත. අපී අනාඡී නො දන්නි," යි කීහු.

ඔහු දිවි ගැළ නො යන තුරැ ඒ බාලයහට ක්‍ෂමා කරන්නෙ යැ වහන්සේ!" යි [11]කමවා වැන්ද එසේ බැවින් යකුන් පලා යනු සඳහා තිට අමා ඔස්සක් දෙමි. මා ඉඳුල් බත් ගෙන යා" යි කිහ. මැනැව වහන්සෙ! යි රන්මලාව එළවූව. මහසත් එහි ඉඳුල් බත් එව, ඉඳුල් දිය එව. මෙයින් සමහරක් තීපුතු [12]මියෙහි ඔව. තුබුවා සැළ දිය නහාපියා එහි ලා අළලා සෙසු බමුණන් මියෙහි ඔව. ඔහු හැම්දෙන නීරොග වෙති." යි කියා අහසට නැඟී හිමවත් ගියහ. හෝ ඒ රන්මලාව හිසින් ගෙන "අමා ඔස්සක් ලද්මි" යි කියමින් ගෙට ගොස් පළමු පුතු මියෙහි ඔතැ. නායක දෙව්රජ "සවාමිහි තමා බෙහෙත් කරනකල අප කිසිදූ නො කටහැක්කැ" යි පලාගියේ.

8 මාතඞග දුන් අමා ඔසු.

---

1. ලෙහසිට. 2, එකියාකෙන්.

9. මණ්ඩ කුමරුගේ මුලාව දුරුවීම.

දරු වෙර ධූලි පිස්මින් නැගී [13]අත්ත! මට මේ සොලේ කිමෙකැ?" යි කිය. තා කල දෑ තො ම දන්හි? මොබට එ තා පරම දක්ෂිණෙය කොට ගත් බමුණන්ගේ විකාර බලා" යි, කිව. හේ බමුණන්ගේ [1]විප්‍රකාර දැක විපිළසර [2]ඇතිවිය. එකල්හි ඔහු මවු පුතැ මඬප්පය! තෝ බාලයෙහි දනඵල මහත් වනතැන් [3]නො දන්හි [4]දක්ෂිණාහියෝ නම් මෙසේ නො වෙති. මාතඞ්ග පණ්ඩිතයා සේ [5]වෙති. මෙතෙන පටන් ගෙන මේ දුශ්ශීලයනට දන් [6]නො දෙව. සිල්වත්නට දෙ. මේ බලා. තාගෙ කුලුපගයන් අමා ඔසු පොවා නිරොග කරම්හ" යි ඉඳුල් කැඳ දිය සැලලා අසූදහසක් බමුණන් [7]මියෙහි එවූහු. බමුණෝ වෙර ධූලි පස්මින් නැංගහ, එකල්හි සෙසු බමුණෝ "ඒ බමුණන් සැඬල්හු ඉඳුල් දිය [8]පූහ" යි නො බමුණු කළහ. ඔහු ලජ්ජා ඇතිව පලාගොස් මෙධ්‍ය මහරජහු කොරෙ වූසූහු. මඬප්ප කුමර බරණැස ම විසී.

අභ්‍යාස ප්‍රයොග.

සාමාන්‍ය ප්‍රශ්න.

1. මණ්ඩප්ප යන නාමය කෙසේ ඇතිවී ද? මණ්ඩප්ප කුමරු වැඩු තියා දක්වනු.
2. ඔහු බ්‍රාහ්මණයන් ගරු නොට සැලකීමට හේතු දක්වනු.
3. දන් හළ තුළ දී හමුවූ මාතඞ්ග හට මණ්ඩප්ප කුමරු කිපියේ කුමක් නිසා දැ යි ලියනු.
4. දන් දියයුතු පරිදි හා දියයුතු තැන් දක්වනු.
5. ජාති මානයෙන් යුක්තයෝ කුමක් නිසා නො පිදිය යුතුද?
6. දිඨමඞ්ගලිකාවට මාතඞ්ග පඬිතුමා කොහිදී හමුවීද?
7. ඇය ලත් අමා ඔසු හා ඉන් ලත් ප්‍රයොජන දක්වනු.
8. මණ්ඩප්ප කුමරු හා බමුණන්ට වූ විප්‍රකාරය දක්වනු.
9. ඉඳුල් දිය ඔත් කළ බමුණෝ කුමක් නිසා සුවපත් වූ හු ද?
10. ජාති මානයේ උග්‍රභාවය හා එයින් වූ විපත් මෙහි පෙනෙණ ලෙස පැහැදිලි කරනු.

ව්‍යාකරණ ප්‍රශ්න.

1. මඬුයෙහි- නවහම් අවුදු ගුණවද්නටද්- තිත් තෙන්- කවර විධින් සන්ධිවූ තැන්දැ යි දක්වනු.
2. ගෙහි- පහයට- මරවඞියට- මූවර- මාගේ- මේ පදයන් විභක්ති හා ශබ්ද ප්‍රකෘති ලියනු.
3. උපන- තබ්මිහ- පක්හ- කොළෙව් - ඔව- ඇවිද්දි- මේ ක්‍රියා පදයන්ගේ ධාතු ප්‍රත්‍යයන් දක්වනු.
4. ඔත්- ගොස්- ගෙන- ගිය- යන මේ පදයන්ගේ නියපත්තිය දක්වනු.
5. සිදතෙහි වියරණ විධින් සිඬකළ නොහෙන යමක් වේනම් දක්වනු.

අමෘත බින්දු,

(නොහොත්)

උද්ධෘත අමාවතුර.

ග්‍රන්ථි පද විවරණය.

1 සිටුව.

මගධරට— බුදුරජාණන් වහන්සේ ගේ කාලයෙහි දඹදිව දියුණුව පැවැති මහාජනපද සොළසින් ප්‍රධාන එකකි. නැගෙනහිරින් චම්පා නදිය ද, නිරිත දිගින් වින්ධ්‍යා කඳු වැටිය ද, බස්නාහිරින් සොනා නදිය ද, උතුරු දිගින් ගඞ්ගා නදිය ද සීමාවූ, බුඞජීවිතයේ ප්‍රධාන ස්ථාන බොහෝ සෙයින් පිහිටි මහාජනපදයකි.

රජගහා නම් නුවරෙක්- මගධ රාජ්‍යයෙහි අගනුවර රජගහා නම් විය. ගඞ්ගානදියෙන් දකුණු දෙස යොදුන් පහකින් පමණ දුර පිහිටියේය. මහරජුන්ට නිවාස ව පෙර සිට ම පැවැති හෙයින් රජගහා නම් විය. වෙභාරාදි පර්වත පසකින් වටවූ හෙයින් ගිරිව්‍රජ පුර යයි ද, පෙර මීට ව්‍යවහාර විය. **දැ**නට "රාජ්ගිර්කුණ්ඩ" නමින් ඒ හඳුන්වයි. **මන්ධාතු-** මහාමන්ධාතු යයි ප්‍රසිඞ ව කෘත යුගයෙහි විසූ මිනිස්ලොව හා දෙව්ලොව ත් රජසිරි වැළඳූ ආදිකල්පික මහරජතුමෙකි. **මහාගොවිඳ, දි-** මහාගොවිඳ + ආදි, එ ම කෘතයුගයෙහි විසූ එබඳු මහානුභාවසම්පන්න රජෙක් මහාගොවිඳ නම් විය.

මහාපණ්ඩිතයෙක් යයි ද කියති. මෙතෙම රජගහ නුවර විශාල රාජධානියක් ලෙස දියුණු කෙළේය. ආදි ශබ්දයෙන් මෙබඳු තවත් රජහු ගැනෙත්. **පිරිගා**– පරිග්‍රහය= වාසය කිරීම. 'පරිග්‍රහ' ශබ්දයෙන් 'පිරිගා' යනු නිපන් විය. පිරි යන අව්‍යය පූර්වවූ ගැනීම් අරුත්හි 'ගහ්' ධාතුයෙන් පර ව භාවයේ 'අ' පස කර 'පිරිගා"යි නිපදවිය හැක. **සක්විත්තන් දවසුදු**– සක්විති + අන්, දවස් + දු. චක්‍රවර්ති රජවරුන්ගේ කාලයෙහි ද, "චක්කවත්ති" ශබ්දයෙන් "සක්විති" යි ආදේශය. 'සක්විත්තන්' යනු විකාරරූප සම්බන්ධ සි, දවස් ශබ්දය දිනවාචි "දිවස" ශබ්දයෙන් නිපන්නවූ නමූ දු මෙහිදී කාලාර්ථයෙහි වී. 'දු' යන අව්‍යයයාගේ ස්වරය සකාරයට ද වීමෙන් ස්වරපරරූප විධින් "දවසුදු"යි විය. **වසත් උයන් සෙයින්**– වසන්තකාලයෙහි සුපිපි ලියතුරු පෙළින් සැදි උයනක් ලෙසින්. වසන්තකාලය වෘක්ෂ ලතාවන්ගේ මල් හටගන්නා කාලය වේ. උයන් නම්:– සුව පහසු ලබනු රිසියන්ගේ විනොදය පිණිස ඒ මේ අත සක්මන් කළ හැකිලෙස නොයෙක් තුරු ලිය ආදිය යථාවිධින් රොපිත ස්ථාන වෙති. රජගහ නුවර සියලුකල්හි සැමසැපතින් යුතුව පැවැති බැව් මෙයින් කිහ.

2 පිටුව.

කිසොව ගබ් ගත— කිසොවගේ කුසෙහි දරුගැබෙක් පිහිටියේය. ඕතොමෝ මහකොසොල්රජහුගේ දූවද, බිම්සර රජුගේ කිසොව ද වූ. **දකුණු දසරුණෙන්**– දකුණු උරහිසින්, දසරු + එන්, දසරු + ය් + එන් = දසරුයෙන්, යකාරාගම සන්ධියි. **වැහැරගියා**– කෘශවූ ශරීර ඇත්තියක් වූ, 'වැහැර, වැහැරීමෙහි ධාතුයෙන්වූ පෙරකිරිය 'වැහැර' යී විය, එයින් පරව ගියා යන්නෙන් ද වැහැරුණු බවම කියයි. **විපරීතවනු**– වෙනස්වීම. **යත්නෙන්**– උත්සාහයෙන්. **සැවසාමු දෙලෙක**– නින්දිතවූ බලු දෙළ දූසොක, සංස්කෘත 'ශවකාම්‍ය' ශබ්දයෙන් නිපන්නයි. එය බල්ලන් විසින් කැමති වියයුතුවූ යන අර්ථයෙහි වී, "දෙහල" යන්නෙන් 'දෙළ'යී නිපන්නයි. ගැබ්හි වූ දරුවාගේ

සිතෙහිවූ අදහස් මවගේ හිත හා සම්බන්ධවන බැවින් දෙ සිතකින් පහළ කරන අදහස් "දෙළ"යයි කියති. **වෙදු- ශල්‍යකම්** චිකිත්සකයා, **රන්සැතින්**- රතින්කළ ආයුධයෙන්. **පොවාලිය**- 'පො' පෙවුම්හි යන ධාතුයෙන්වූ අතීතකාලික ප්‍රයොජ්‍යක්‍රියායි. **සන්හින**- සන්හිඳිණි, සන් යන අව්‍යය පූර්වවූ 'සිඳු' ධාතුයෙන් වූ අතීතකාලික ක්‍රියායි. **නෙමිතති කයෝ**- ශාස්ත්‍ර කියන්නෝ. **රද්සතුරු**- රජුහට සතුරු=රජ් සතුරු, රද්සතුරු. **නස්යි**- නසනු ලැබෙයි, නැසීම් අර්ථයෙහිවූ 'නස්' ධාතුයෙන් වූ කර්මකාරක ක්‍රියායි. **නෙළාපියපි ව**- විනාශ කරවනු කැමතිව, පියනු + අපි = පියපි, අපි නම්:- අදහසයි. **එක්ධන්**- නිරතුරුව. **පරිජනයන්**- පිරිවර ජනයන්. **අතුරු දැක**- කාරණය දැනගෙන. **වටාලා**- නැවත, වැටුම්හිවූ 'වට' ධාතුයෙන්වූ 'වටා' යන පූර්වක්‍රියායෙන් පරව දැමීම් අර්ථයෙහිවූ "ලා" ධාතුයෙන් වූ පූර්වක්‍රියා පදයක්ද වී එකාර්ථයක් ම දැක්වෙයි. **හෝ**- ඒ බිම්සර රජුගේ බිසොව. **රකවල්**- රක්ෂාවරණය. **පාකලහ**— පහ කොළෝය. **පුත්‍රසනා**— පුත්‍රස්නේහය. **නො පොහොසත් වුව**- අසමර්ථවී. **යුවරජ තන්**- උපරජ පදවිය.

8 පිටුව.

මහසුබු- මහාකාශ්‍යප, මහකසුප්=මහකසුබ්=මහකසුබු= මහසුබු, මධ්‍යලොපයි. **මසිඳු**- මා දු = මධ්‍යයෙහිවූ 'සි' කාරය ආගම වී, මා විසින් ද, යන අර්ථයි, අනත්‍ය ස්වරලොප්ව 'මසිද්' කියා ත් සිටියි, **ලාභ විනා**- ධනයෙන් තොර ව, ලැබීමක් නැති ව, **උපැසුව**- උපදවා ගතහොත්, "උපද" දයින් වූ අසම්භාව්‍ය ක්‍රියාපදයි. **සෘඩි පෙළහර**- සෘඩි බලයෙන් දැක්වූ ආනුභාවය, ප්‍රාතිහාර්‍ය්‍ය, "පාටිහෙර" ශබ්දයෙන් හිතනයි. මෙකල වනුයේ පෙරහර යි. **සවසැ දු**- සවස් කාල යෙහි ද, **රැයිම්මෙහි දු**- උදෑසනකාලයෙහි ද, "රතතිසිමා" යන්නෙන් "රැ + හිම්"යි හිතනයි. රැ + ඉම්=රැ + ය් + ඉම්= රැයිම් + එහි=රැයිම්මෙහි. පසු ව මකාර ද්විත්වයෙන් සිඩයි,

විශ්වාස්කළ සේ- විශ්වාසයකු කළ ආකාරය. **රජවව**- රජවනු මැනවි. **අප වස්හිමියෝ**- අපගේ වස්තු ස්වාමිහු, ආර්‍යයන් වහන්සේ, කුලදෙවි යන අරුත්හි වැටේ. **නෑනී**- නෑති + ඊ= නෑති+ඊ=නෑතී, නැත්තේය. **කලවයෑ**- කළවයෙහි. **සිරිසක්**- එනම් ආයුධයක් "ජුරිකා" ශබ්දයෙන් නිපනසි. **දෙවෙන් දවාල්**- මධ්‍යාහ්නකාලයෙහි, දිව + එන්=දෙවෙන්. "දිවාකාල" දවකල්=දවහල්=දවාල්. **වෙවුලමින්**- සිත උපන් බියෙන් ඇතිවූ කම්පාවෙන් යුක්ත ව. **තිරෑසෙකාව**- තරව අල්වාගෙන, (නොහොත්) එයින් වළක්වාගෙන, "සථිර" යන්නෙන් හෝ 'තිරස්' යන නිපාතයෙන් 'තිරැ සී' නිපනසි. **බෑණගෙන**- කථාකරගෙන, සම්මතකරගෙන. **සෑලකොට**- රජුට දැනුම් දී, බුහුම නින් කරන නිවෙදනය සැලකිරීම නම්. **ඇමැත්තන් අසා**— ඇමතියන් අයත්වූ රාජකාරි පැහැරගෙන, නිලවලින් පහ කරවා. **බලාගනෑසි**- බලා යන පෙරකිරියෙන් පරවූ 'ගන්' ධාතුයෙන් ගනු යන විධික්‍රියා වී, බලාගනු යෑ=බලාගනු+ ඇ= බලාගන් + ඇ=බලාගනැ. **මනොරථය**- චිත්තාභිලාෂය.

4 පිටුව.

තා පියේ- තොපගේ පියතෙමේ, පිය + ඒ=පියේ, ඒ යනු පළමු විබත් එකබස් පසයි. **නිහසර**- නිග්‍රහය, අවනම්බුව, 'නීචාචාර' යන්නෙන් නිපනසි. **රජය ගත්ති**- රාජ්‍යය පැහැර ගත්තේය. 'ගන්' ධාතුයෙන් වූ අතීත ක්‍රියාසි. **මරාපිව**— මැරුව හොත්, මරා යන පෙරකිරියෙන් පරව 'පිය' පියුම්හී යන ධාතුයෙන්වූ අසම්භාව්‍ය ක්‍රියා පදයි. **අන්නිය මිස**— මැණියන් හැර. **ගිහෑ තබාගෙන**-ඉනෙහි තබාගෙන. **යෙපයි**- යාපනය වෙයි, කල්ගෙවයි, යැපීමෙහිවූ 'යප' ධාතුයෙන් සිඬයි. **මපෙණෝ**- මාගේ පියතුමෝ. **මුහුල**- කෙශකලාපය, මකුට යන්නෙන් නිපනසි. **රත්මරවඩිය**- රතින්කළ පංචහන්. **සිසුම්පුරෑ**- චතුමධුර, වෙඬරු, ගිතෙල්, මීපැණි, උක්සකුරු යන මිහිරිවගී සතර. **පිළිපෙරවගෙන**- වස්ත්‍ර පෙරවගෙන. **රජපා**— රාජෝත්තමයා, සර්විරපාද යනාදි තන්හි සේ

ගෞරවාර්ථයෙහි වූ 'පාද' යන්නෙන් පා යනු එයි. **පුවිව—** පොෂණය කෙලෙහිය, පොෂණාර්ථයෙහිවූ 'පුස්' ධාතුයෙන්වූ අතීතකාලික ක්‍රියාපදයි, ධාතුයෙහි වූ 'ස' හට 'ට' ආදෙශ යි,

6 සිවුව.

නිමාවඳුක්මය– අවසාන දුකිම වෙයි. **වැළැප වැහැස–** වැළපී, මහත්සේ හඬා. වැළපුම්හි වූ 'වළප්' ධාතුයෙන් ද, වැහැසුම්හිවූ "වහස්" ධාතුයෙන්ද, වූ පූර්වක්‍රියායි. **කිහිරඟු ෂරකි–** කිහිරි අඟුරු මතුයෙහි, "ඛදිරඞගාර" යන්නෙන් 'කිහිරඟුරු'යි කිඳිණි. **නැවැමියන්=** සාරතැවැමියන්, **දුළී** රුවුල් සාපනුවන්, නහාපිතක යන්නෙන් හිතානවී. **එකෑ ෂින්–** ඒකාන්තයෙන්. **දන්වනලද්දේ–** පියාට වධකරවීමේ දෙෂය කියනලද්දේ. **දුළිදුළුමෙණහ පිණිස–** රුවුල්කැපීම පිණිස. **හස්න–** සන්දෙශය, පණිවුඩය, 'සාසන' ශබ්දයෙන් හිතානයි. **වහන්සේ–** ස්වාමීනි! ගෞරවය පිණිසවූ ආමන්ත්‍රණාර්ථයෙහි අව්‍යයකි. **ගොජ්ඇටය,–** ගුල්ඵාස්ථිය, ඇස්ඇටය. **කරශ—** දුළිපිහිය. **පක්හ—** පිසූහ, 'පස්' දයින්වූ අතීතාඛ්‍යාතයි.

7 පවුව.

පූර්වජන්මයෙහි– පළමු ජාතියෙහි. **දුගබගණක්හි–** දුගොබ්මළුවෙක්හි, දුගබ් + අඟණ=දුගබ'ඟණ, "ධාතුගබ්භ" යන්නෙන් 'දුගබ්'යි කිඳේ, අඞගණ නම්:– මිදුලය, මළුවය යනු යි. **ලා–** දමාගෙන, 'ලං' ලීමෙහි යන්නෙන්වූ පෙර කිරියයි. **අතුළ–** අතුරනලද, "අතුර" දයින්වූ අතීත කෘදන්තය. **කලාලක්—** පැදුරක්, "කිලඤ්ජ" යන්නෙන් කිඳිණි. **නොසෙදවි–** නොසෝදන ලද. **ඇක්මිණ–** ආක්‍රමණය කොළේය, ආක්‍රමණාර්ථයෙහි ඇක් ම, ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාතය. ආත්මනෙ පදික ධාතූන්ගේ ක්‍රියාරූප සාධනයෙහි කම්

කාරක ප්‍රත්‍යය යෙදීම භාෂාරීතිය වේ. එබැවින් ඇක්මේ, ඇක්මණ, යනාදි විසින් වරනැඟෙයි. **සවුමහරජ දෙව්ලොවෙහි**- චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි, සදෙව්ලොවින් ආයුඃශ්‍රී ආදීන් හීනවූ පහත් දෙව්ලොවය, ඒ සතරවරම් රජහු පාලනය කරති. **සත්වනවර**- යක්ෂව උපන් සත්වැනි වාරය මේ උත්පත්තියෙන් සම්පූර්ණවූ බැව් දක්විණි.

8 පිඩුව.

එක්වටෑ ම අළහ- එකවර ම ගෙන ආවාහුය. යැවීම් අරුත්හිවූ 'හර' දයින්වූ අතීතාඛ්‍යාතය අළහ යි විය. **සුත සනා**— දරුසෙනේහය. දරු ප්‍රෙමය. **ඇඹමුල් පැහැර සිඹියේ යෑ**— ඇටම්දුලු දක්වා ප්‍රෙමය පැතිරිණි. **ම පණනට ද්**- මාගේ පියාණන් හටත්. **සනා**- ස්නෙහය. **විකිද්ව යි**- නිදහස් කරව්යයි. "විහිදු" දයින්වූ විධික්‍රියායි. **වලප්මින්**- විලාප කියමින්. **අන්න**- මෑණියෙනි! **බාලපුත**- අඥනවූ පුත්‍රය! ආත්මාපරාධ විනාශකාරයා බාලනම්. **විනිස මණ්ඩලෙහි**- විනිශචය සභා මධ්‍යයෙහි. **මියෙහි**- මූඛයෙහි, මුව + එහි, මිව + එහි, මිය් එහි=මියෙහි, මූඛ යන්නෙන් ආ "මුව"ශබ්දයේ උකාරයට ඉකාරයවී. **පොළ**- බිබිල,'පොට'ශබ්දයෙන් 'පොළ'යි හිත්‍යායි. **ලේ මුසුපුසා**- ලේ මිශ්‍ර සැරව. **මෙබන්දුයි**- මෙබඳුය යි, මෙබඳු + යෑ + යි=මෙබන්දුයි, අඩි වශීානතයාගේ වෘඩිය වී. **හළුකිස**- හසමකෘත්‍යය, ආදෘහනය. **යොධදුනුවාසන්**- යුඩසමුදායයට අයත් ධනුර්ධරයන්, විදීමෙහි සමර්ථ පුරුෂයන්. **කෑරුණු දෑ**- සිඬවූ දෙයක්. **ගිජුකුළු පවුවට**- ගිජ්ඣකූට නමින් රජගහානුවර පවත්නා පර්වතයට, ගිජුකුළුපවු + අට, ගිජුකුළු පව්වට, විකාරරූපසන්ධිය. **ගල්පාත**- පර්වතප්‍රාන්තයෙහි, පර්වතය පහත. **සෙල්විහිදු**- ගලක් පෙරළා. **පස්වරයක්**- වරය නම් කැමැත්ත (ප්‍රාර්ථනාව) වේ, වරපසක්, එනම්:- භික්ෂූන් දිවි ඇතිතෙක් වනයෙහි ම විසීමය, පිණ්ඩපාතයෙන් ම යැපීමය, පාංශුකූල චීවරම පෙරවීමය, රුක්මුල්හි ම විසීමය, මත්ස්‍යමාංශානුභවයෙන් වැළකීමය, යන

මෙයින් යුක්තවිය යුතු බවට ශික්ෂාපද පණවනසේ කළ ආයාචනා පසයි. **විපිළිසර**– පසුතැවීම, 'විප්පටිසාර' ශබ්දයෙන් නිපන්නයි. **උපයා**– උපදවා. **සැණකෙළියක්**– උත්සව ක්‍රීඩාවෙක්, 'ක්ෂණක්‍රීඩා' ශබ්දය සැණකෙළි යී ආදේශය. **පනුරැසි පොහෝ දවස්**– පසළොස්වක් පොහෝදිනයෙහි, 'පන්නරසී' ශබ්දයෙන් නිපන්නවිය. "පණු" යනු ප්‍රාමාදිකයි. **සරාසඳුරැසින්**– ශරත් කල්හි උදවූ නිර්මල චන්ද්‍රාලෝකයෙන්.

9 පිටුව.

රිදීකෙළෙන්– රිදී කළයෙන්, කළ + එන් = කෙළෙන්, ස්වර පරරූප සන්ධියි. **කිරිදහර**– ක්ෂීරධාරාව. **රිදීවිමනින්**– රිදියෙන් කළ විමානයෙන්. **සමන්කුසුම්දම්සෙයින්**– සමන් මලින් කළ මාලාදාමයක් පරිද්දෙන්, එදින රාත්‍රිය චන්ද්‍රාලෝකයෙන් අතිශය සුදුපැහැයෙන් බැබළුණු බැවි කී නියාය. **නිරිඳුමහමලෙහි**– රජුගේ මතුමහල් තලයෙහි. **ඇමතිමඬුලු**– අමාත්‍ය සමූහයා. **සෙසත්යට**– සේවතච්ඡත්‍රය යට. **ඝනරන් මුවා**– ඝනවූ රනින් කරනලද, "මුවා" යනු එයින් ම කරන ලද්දේය යන අර්ථය සඳහා යොදන ප්‍රත්‍යයකි. **සැත්දහස් ඔත්කල්සෙයින්**– ආයුධ දහසකින් පහර ලත් කලක්මෙන්. **පුබුද්දී**– ප්‍රබොධ වෙයි. නැගිටියි, පිබිදීම්හි "පුබුදු" දයින්වූ ආඛ්‍යාතය, 'මෙරජ' යනු එයින් උක්ත වේ. **වළහයි**– සඟවයි, වැළහීම් අර්ථයෙහි 'වළහ' දයින් නිපන් තත්කාල වර්තමාන ආඛ්‍යාතයි. **නො රිසියෙයි**– රුචි නො වෙයි, නො යනු අව්‍යය යි. රුචිවීම් අරුත්හි 'රුස්' දයින් පරවවූ 'ඉ' පස හා මධ්‍යයෙහි 'ඉය්' ආගමයි. **අභිරූප සෑ**– වලාපටලාදියෙන් තොරවූයෙන් යහපත් ස්වභාවයෙන් යුක්ත වෙයි. **දශීනිය සෑ**— දක්නට සුදුසු වෙයි. **පහද්දිසි**— පහදීද? පැහැදීම් අරුත්හි 'පහද' දයින් සිඩයි. **උදන්ඇනී**– ප්‍රීති වචන කියේය. 'උදන්' යනු සිත පුරා ඉතිරගිය ප්‍රීතියයි. 'ඇනී' යනු ප්‍රකාශාර්යෙහි "අන" ධාතුයෙන් වූ අතීතාඛ්‍යාතයි. **පුරණකායපයා**–

කාශ්‍යප ගොත්‍රයෙහි උපන් පූරණ නමින් යුක්ත ශාස්තෘවරයා. **මක්ඛලීගෝසාලයා**- ගවහලෙක උපන් බැවින් ගෝසාල යන නමකින් පළවූ මක්ඛලී නම් ශාස්තෘවරයා. **අජිතකේසකම්බලයා**- කෙශයෙන් කළ කම්බිලියක් සිවුර කොට ගත් අජිත නම් ශාස්තෘවරයා. **පකුධකච්චායනයා**- කාත්‍යායන ගොත්‍රයෙහි උපන් පකුධ නම් ශාස්තෘවරයා. **සඤ්ජයබෙලට්ඨපුත්‍රයා**- බෙලට්ඨ නම් අයගේ පුත්‍රවූ සඤ්ජය නම් ශාස්තෘවරයා. **නිගණ්ඨනාථපුත්‍රයා**- නිගණ්ඨඥාතපුත්‍රය යි ද කියති, කෙලෙස් ගැට නැතැයි=නිගණ්ඨ යන නමකින් පළවූ නාථ පුත්‍ර නම් ශාස්තෘවරයා. මේ නාමයන්ගෙන් දඹදිව එකල බුදුවරුය කියමින් විසූ ශාස්තෘකල්පීන් දැක්වූහ. **නුවටැජරන්**- නිගණ්ඨ ආචාර්යයන්, නිගණ්ඨ යන්නෙන් 'නුවට' යයිද, 'ආචෙර' යන්නෙන් 'ඇජර' යි ද හිතනයි. **අඹපකක්**— ඉදුණු අඹ ගෙඩියක්. **කැටිපුරුෂයක්හු**— කානු කැමැත්තකු, කැමෙහි අටි=කැටි, අටි නම් ආශාවයි. **හෑයි**- කිම යන අරුත්හි නිපාතයි. **සබඳ**— මිත්‍රය! **නොයි**— නො වෙහි ද?

10 පිටුව.

පරිකථා- බැහැරකථා. ප්‍රධාන කාරණයෙන් පිටත්හිවූ විස්තර කථා. **ගමාඇර**— තමන් ගෙන ගොස්. **නොනිසිද යත්**- සුදුසු නොවන්නේ ද? කියත් හොත්, යත් යනු අසම්භාව්‍ය ක්‍රියා පදයි. **දන්ති**- දැනීම් අර්ථයෙහිවූ දන් දයින් පරව 'ඉති' ප්‍රත්‍යයව දනිති යනුවී, "ඉති" ආදි ප්‍රත්‍යයන් පරකල ස්වරාන්තවූ ව්‍යඤ්ජනාක්ෂරයක් ආදිවූ ධාතුහුගේ අකාර ලොපය වෙයි. එයින් දන්ති යනු වී, **වැලි**- එසේ වීනම් යන අරුත්හි අව්‍යය පදයි. **විඛෙව**- වික්ෂෙපය, ව්‍යාකුල භාවය, "විකෙඛප" යන්නෙන් හිතනයි. **පසිඳුනා සඳහා**- වනසනු සඳහාය. **නිමාමට**- අවසානයට, නිමා + කම්, නිමා + හම්, නිමා + අම්=නිමාම්, 'අට' විබත් පසයි. **පුළුවුස්සි**- විචාරන්නේය, විචාරීම් අරුත්හි 'පුළුවුස්' දයින්වූ ආඛ්‍යාතය.

නාරජ වස වළඳ සිටි- නාගරාජයන්ගේ විෂයය (නාලොව)ට පැමිණි ගුරුළකු (නිශ්ශබ්දව) සිටි පරිද්දෙන්. **සවු ය**- ශ්‍රාවක යෙකි, සව් යනු සවු යී ශුඩ වියයුතු. **වත්සපන්**- වත්ත සම්පන්නාවූ, වත්ත යනුවෙන් ආචාරවිධි ආදිවූ ශීලය ගැනේ. **නො බුණු කල**- කථා නො කළ කල්හි. **ඇතක්හු ම ගේ**- ඇතකු ගේ ම, මෙහි 'ගේ' යන්න සම්බන්ධාර්ථයෙහි වූ අව්‍යයකි, 'ම' යනු අවධාරණාර්ථයෙහි වී.

11 පිටුව.

පසඟ පිහිටිවා- ශරීර අවයව පසක් බිම පිහිටුවා, දෙ දණය, දෙ අතය, හිසය, යන මොවුන් වසයෙනි. **නියරසින්**- නබරශ්මියෙන්, දෙහොත් මුදුන් දුන්කල එක පෙළට සිටි නිය පෙළ සුදු පැහැයෙන් දිලෙයි. **යමතම මහණෙක්හු**- සුළු ශ්‍රමණයකු, "යම්තම්" යනු අල්පාර්ථයෙහි වූ අව්‍යයකි. **අඩතෙලෙස් යල්සියක්**- අඩකින් තෙළෙස් සියක්වනු යේ= අඩතෙළෙස් සිය නම්, මෙහිවූ 'යල්' ශබ්දය ද අඩ යන අර්ථය ම දක්වයි, එක්දහස් දෙසිය පනසකි. **සියනු දු**— සියන් + දු, සියයකු ත් යන අර්ථයි. **සුවහසුනු දු**- දසදහස කු ත්, "සතසහස්ස" යන්නෙන් සුවහස් යි බිඳේ, සුවහසුන් + දු=සුවහසුනුදු. **පස්වණක් ප්‍රීතින්**- පස්අයුරකින් උපදනා ප්‍රීතියෙන්, ක්ෂණික ප්‍රීතිය, ක්ෂුද්‍රක ප්‍රීතිය, උබ්බෙග ප්‍රීතිය, අවක්‍රාන්ති ප්‍රීතිය, ස්ඵරණ ප්‍රීතිය යන මොහු පස්වණක් ප්‍රීති නම්. **යාචි ව**- යනු කැමති ව, යා + අචි + වැ=යාචි ව. **යාන යක්**- වාහනයක්. **යොජන්නට**- යොජනු + අට=යොජන් නට, සූදනම් කිරීම පිණිස. **යා**- යව, ගමන්හිවූ 'යා' ධාතු යෙන්වූ විධික්‍රියායි. **පස් පසැ**- පසු පාර්ශවයෙහි. **නිව**- උපශාන්තවූ **සන්හිඳුණු** යනු අර්ථයි.

12 පිටුව.

බුදුන් දක්නට යෙමි යෙසි— බුදුන් දක්නා පිණිස යන්නෙමැ යි කියයි. **අන්හු**- අන්‍යයෝ. **අකාලයෙහි**–

නුසුදුසු කාල (රාත්‍රි) යෙහි, **නො නගමා**– නො බලා=නො සලකා, බැලුම් හි වූ "නගම" දසින් වූ පෙරකිරිය නගමා යි වේ, **සුසංවිහිත**– මනාව කරනලද. තත්සම ශබ්දයෙකි, **රජ මා කිවා කෙරෙතී**– කෙරෙති + ඊ=කෙරෙතී, කර දසින් වූ ප්‍රථම පුරුෂ බහුවචනාඛ්‍යාතයි. සන්දේහාපිවාචී ක්‍රියා විෂය යෙහි ප්‍රථම පුරුෂ බහුවචන ම වේ. ඊට කර්තෘපදය තෘතීයා වෙත් වෙයි. රජ යනු කර්තෘ පදයි. පුරුෂ වචන භේදයක් මෙබඳු ක්‍රියාවන්හි නො ලැබේ. ප්‍රථම පුරුෂ බහුවචනය ම වේ. **අඹුන් මිනිසුන්**– පුරුෂ විලාසයගත් ස්ත්‍රීන්, ඒ නිසා පුරුෂ යනට බිය නැත්තේ ය, **සදවා**– සජ්ජිත කරවා, **මාගමුන්**– ස්ත්‍රීන්. **අසි**– කඩු. **තෝමර**– කුන්තායුධය. **පිරිවරව සි**– පිරිවර වේවා යි. කියා, **මඟ පලසට**– මාර්ගඥානය හා ඵලඥානයට, **වන්නා හා**– වීම හා එක්වම, රැස්වූ කල්හිය, යනාපිසි. **රජු පෙරමග**– රජුගේ පැමිණීම, රජු එන මාර්ගය දෙස.

14 පිටුව.

එලවූයෙමි– පැමිණෙව්වෙමි, "එලවූයේය" යනු ප්‍රාමාදිකයි, **මිණි දඹු වැට පහණින්**– මැණික් ඔබ්බා කළ මිටිවලින් යුත් දඬුයෙහි දල්වූ ප්‍රදීපයන්ගෙන්, 'දඬු වැට පහන්' යනු ලී කඩවල රෙදි ඔතා කරන පන්දම් විශේෂයකි. **තිස්සවලා**– 'තලප්පා' නමින් යුත් ශිරෝවේෂ්ටනයන් ගෙන් යුක්තව. **මිණි තෝමර**– මැණික් ඔබ්බා කළ තෝමර නමැති අවි වෙසෙස, **කුරු කුදු කිරාතාදි හ**– "ඛුජ්ජ වාමන කිරාතා දයො" යන අටුවා පදය සිංහල කළ නිසා යි, "කුදු කුරු කිරාතාදිහ"යි කිය යුතු සේ පෙනේ, කුරු නම් මිටි අයය, කුදු නම් නැමුණු සිරුරු ඇති අයය, කිරාත නම් වැදි ජනයා වැනි මිලේච්ඡයෝ ය. **රජගේ රක්නා**– රජුගේ අන්තඃපුර රක්ෂකයන්, **වෙසවිලාසධර**– නොයෙක් වෙස සැරසි ගත්, නොයෙක් වෙස් දරන්නා වූ.

16 පිටුව.

රුපී— රට වැසියෝ, ගොසිමින්— ජයඝෝෂ කෙරෙමින් ඝෝෂණාර්ථයෙහි "ගොස්" දසින් වූ මුසු කිරියය, පසඟ තුරු- පඤ්චාඞ්ගික තූර්යය, ආතත (එකැස් බෙර), විතත (දෙඇස් බෙර), ආතත විතත (සැම අතින් වසා බැඳි බෙර, ඝන කසිතාලම, ශුෂිර නලාය, යන මේ තූර්ය විශේෂ පසයි, බෙර පැහැර— ඇහෙහි ගැටෙමින්. ගෙලෙන් ගෙල- ග්‍රීවායෙන් ග්‍රීවාව, දසරිසෙන්- උරහිසෙන්. සෙනිහ- සෙනෙවියෝය වැළැක ගෙන- ලං වෙමින්, ලියවැට- ලතාකර්මයෙන් අලඞ්කාර කළ මිටි ඇති පත්දම් 'ලියවැට' යි කියති "ලතා වත්තිකා" ශබ්දයෙන් සිද්ධයි.

16 පිටුව.

කිබිස්නා හඬකු දු- කිබිසීම් මාත්‍ර ශබ්දයක් ද, නැහැයෙන් වාතය පිටකිරීම කිබිසීම නම්, එක්දහස් දෙසිය පනසක් භික්ෂූන් ඇති අඹ වනයෙහි එතරම් වූ ශබ්දයකු දු නො ඇසීම රජුගේ සැකයට හේතුවිය. නෙර ගෙන- නුවරින් පිටතට නික්මවා ගෙන, නෙරීමෙහි 'නෙර' යන ධාතුයෙන් වූ පූර්වක්‍රියා පදයි. පෙරවින්- ඉදිරි පැත්තෙන්. පස් ඇතක්හට- ඇතුන් පස්දෙනකුන් ගේ. පිරිහිණෙකැ යි- පරිහාණියෙක් ය අනර්ථයෙක් ය කියා, පිරිහිණි + එක්= පිරිහිණෙක්, පිරිහිණෙක් + යැ + යි=පිරිහිණෙකැ යි. මාගේ මාත්‍රා— මාගේ ප්‍රමාණය, ලිහිඬිත්ත කු දු— ඉතා කුඩාවූ ලෙහෙඬිය කු දු, ලිහිඬි නම් + යූකා බීජය=උකුණු බිජුවට ය, ලේඩියායි ඈලකිය යුතු, ලිහිඬි + ඉති, ලිහිඬිති= අල්පාර්ථයෙහි වූ "ඉති" ප්‍රත්‍යය යි, "පැණිත්ත කු දු" යනාදියෙහිද "ඉති" ප්‍රත්‍යය දක්නා ලැබේ. මණ්ඩලමාලයෙහි- භික්ෂූන් වහන්සේ රැස්ව වැඩහිඳින ශාලායෙහි. බට- බැස් සේ ය, බැසීමෙහි වූ 'බස්' ධාතුයෙන් සිද්ධ අතීතාඛ්‍යාත පදයි. ධාත්වන්තයට ටකාරාදේශවීම භාෂාරීතිය වේ. මෙවර

පහළ- ශරීරයෙහි වැදිණි, පැහැරීම්හි වූ 'පහර' දසින් වූ අතීතාඛ්‍යාතයි. ධාත්වන්තයට ළ කාරය දෙශයි. **හන්සළු**- අඳනා ලද වස්ත්‍ර. **පෙළාපිශන**- මිරිකා හරින පමණ, පෙළා යනු පෙළීම් අරුත් හි වූ 'පෙල' දසින් සිඬ පූර්වක්‍රියාය. **සැරිසරන්නක් හු**- ඇවිදින තැනැත්තකුත්, **මෙහෙයා**— යොදවා, මෙහෙයීමෙහි වූ 'මෙහෙය' දසින් සිද්ධ පෙර කිරිය පදයි. **දෙතිස්වර ලකුණෙන්**- දෙතිසක් මහාපුරුෂ ලක්ෂණ යන් ගෙන්, 'සුප්‍රතිෂ්ඨිත පාදතලතා' යනාදි මඞ්ගල ලක්ෂණ දෙතිසක් බුදු සිරුරෙහි වෙති. **අසූ අනුව්‍යඤ්ජනයෙන්**— දෙතිස් ලකුණු අනුව පවත්මින් බුදු බඳෙහි ශොභාව අතිශය දීප්තිමත් කරන ලකුණු වලින්, "විචිත්‍රාඞ්ගුලිතා" යනාදි ලකුණු අසූවකි, **සවණක් රසින්**— නීලාදි ෂඩ්වර්ණ රශ්මියෙන්.

17 පිටුව.

ඉසුරු ලීලායෙන්- අධිපති භාවයේ ලීලායෙන්=ඓශ්වර්‍ය සම්පන්නයන් ගේ විලාසයෙන්, **වැන්න**- වැනි + යැ=යකාර ලොප හා විවරූපයෙනි වී. **පෙරට සිට**— මුනිඳුන් ගේ ඉදිරියෙහි සිටගෙන. **මැද වැඩ**- මැද කණුව. **නිවාතෙනක්හි**— හුළං හැමීම් රහිත වූ ස්ථානයෙක්හි. **උපසමයෙහි**- සන්සුන් බවෙහි. **පහන් විලක් සෙයින්**- පැහැදුණු ජලය ඇති විලක් මෙන්. **සනහුන් ඉඳුරන් ඇති**- නොයෙක් අරමුණෙහි දිවීම් නැතිව එක අරමුණෙහි පිහිටි සිත් ඇති හෙයින් සන්සිඳුණු චක්ෂුරාදි ඉන්ද්‍රියයන් ඇති. **උදෑ කුමර හට**- උදය භද්‍ර කුමාරයන් හට. **දිලිඹිදූයක්**- දුලීභ වූ යම් කිසිවක්. 'දුල්ලභ' ශබ්දයෙන් 'දිලිබි' යි ආදේශය. **ලැබී**මට දුෂ්කර වූ යන අර්ථයි.

18 පිටුව.

සිත්හසර- සිත පවතින පිළිවෙළ හෙවත් රජුගේ සිතිවිල්ල, 'චිත්ත සඤ්චාර' ශබ්දයෙන් බිඳිණි. **උස්නැන**

වට දිය- උස් වූ ස්ථානයකට වැස්සාවූ ජලය, මෙහි "වට" යනු වර්ෂණාර්ථයෙහි වූ 'වස්' දයින් සිඬ අතීත කෘදන්ත පදයි. **තතු තැනට**— පහත් වූ ස්ථානයට, "ඔතත" ශබ්දයෙන් 'තතු' යි තද්භව වී, **අක්වටා**- අග්‍ර උපස්ථායකයා, "අග්ග උපඨාක" ශබ්දයෙන් බුන් අග් උවටා, යන්නෙහි උකාර ලොප හා 'ග' හට 'ක' කාරාදෙශයි, රජු යන්නට විශෙෂණ යි. **දුනුවාවන්**— ධනුර්ධරයන් **ගල්කුළු**— පර්වත කූටය. **වුහුටුයේ ය**- හරන (පෙරළන) ලද්දේය, හරණාර්ථයෙහි වූ 'විහිදු' දයින් නිපන් අතීත කෘදන්ත 'වුහුටු' ශබ්දය ප්‍රථමෛක වචන 'ඒ' ප්‍රත්‍යය හා 'ය' කාරාගමයෙන් 'වුහුටුයේ' යනුවී. **කරන දූය**- කරන සේක. ගෞරවය දක්වීම පිණිස යොදන 'සේක' යන අව්‍යය පදය මෙන් එම අරුත් හි "දෑ" යන්නද බහ්වර්ථයෙහි ම යෙදේ. **ශහන**— විසමයාර්ථයෙහි නිපාතය. **තාදී ගුණයෙහි**- ඉෂ්ටා'නිෂ්ටාරම්මණයන් හි නො වෙනස්ව සමව සිටීම 'තාදි' ගුණ වේ. හිතාහිතයන් සමව සැලකීම මෙයින් දක් වේ. **සුවයෙන් පස්වටති**— සුවපත් කොට පොෂණය කරති, "සුවයෙන්" යනු සුවපත්වනයේ ය යන අර්ථයෙහි වේ. පස්වටති- යනු පොෂණාර්ථයෙහි වූ 'පස්වට' යන දයින් සිඬ ආඛ්‍යාත පදයි.

19 පිටුව.

මුමු නගු වෙති- මද මද හඬනගා කථාකරති. **පුළුවුත් විවිදයක් හා ඇද්ද**- විචාරන ලද ආකාරයක් ඊබේ ද? මින් පලමු විචාරා තිබේදැ'යි කී නියායි. **දෙස් දෙති**— දෙශය දක්වති. **ඉදිකොට**- ඍජුවන පරිදි කැරැ. **පුළුවුත්මි**- විචාරන ලද්දෙමි. විචාරීම අරුත්හි වූ 'පුළුවුස්' දයින් නිපන් අතීත කෘදන්ත නාමයෙන් පරව 'මි' ප්‍රත්‍යය යොද කළ නාමධාතුක ක්‍රියා රූපයකි. **වැලිපෙලා**- වැලි පිරිකා.

20 පිටුව.

වහන්සෙ පැන පුළුවුස්නට- ස්වාමීන් වහන්සේගෙන් ප්‍රශ්න විචාරීම පිණිස. **මහණුවම් එළ**— මහණකමෙහි

ප්‍රයොජන. **කිකරු දසෙක්**— පිළිවිස කරන සුවච දූසයෙක්. **ඛය**— හෙළැවීමෙහි වූ අව්‍යය පදයි. **අපිස් සතොස්**— අල්පෙච්ඡව සන්තොෂව, ආශා රහිත බව 'අපිස්' නම්, ලද දෙයින් තුටුවීම 'සතොස්' නම්. **වෑමෙයි**— ජීවත් වෙයි, පැවැතුම් අරුත්හි 'වට' දයින් වූ ආඛ්‍යාතයි.

21 පිටුව.

අස දනෑ යි— අසව, දනුව, යයි, ශ්‍රවණාර්ථයෙහි වූ 'අස්' ධාතු, ජනනාර්ථයෙහි වූ 'දන්' ධාතුය යන මොවුන් ගෙන් සිදුවූ විධික්‍රියා රූපයෝ ය. **අහස්ගඟ**— ආකාශ ගඞ්ගාව, 'මන්දාකිනී' නදිය යි ද කියති. **පහසා**— සංසන්දනය කොට. **ධම්රජහු**— ධාර්මික වූ රජහු. **දස විජහන තැන**— ඇසට නො පෙණෙන පමණ තන්හි.

23 පිටුව.

මුහුදින් පිරිහුන්— සමුද්‍රයෙන් පිරිසිඳින ලද, වෙන් කරන ලද, "පරිච්ඡින්න" ශබ්දය පිරිහුන් කියා තද්භව වී. **දූනුයෙන්**— දිනූ (ජයගත්) හෙයින්. **කොටගෙ**— කොෂ්ඨා ගාරය, ගබඩා ගෙවල් 'කොෂ්ඨාගාර' නම්.

24 පිටුව.

සඞගති ක්‍රියායෙහි— එකතුකිරීමෙහි, සඞගති ක්‍රියා + එහි=සඞගති ක්‍රියායෙහි—යකාරාගමය 'එහි' ප්‍රත්‍යය පිළිබඳ එකාර නිමිත්තෙන් වී, **පෙරෙවි බමුණු**— පුරොහිත බ්‍රාහ්මණයා, රජුගේ ඉදිරියෙහි අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන බ්‍රාහ්මණයා. **බිජු බත් හුදලු කැති සිහිවෑල්**— කුඹුරු වල වැපිරීමට බීජ වගීද, කම්කරුවනට ආහාරද, වැඩ කරනට උදලු කැති හීවැල්, රජුන් විසින් දියයුතු බව මෙයින් දක්විණි. **වෙළෙඳහම්**— වෙළඳම 'වාණිජකම්ම' යනු 'වෙළඳ කම්,-යි භින්නවෙයි. එහි යකාරයට හකාරාදේශව

'වෙණෙදගම්' යනු වේ. සැම් වැපියනට— තිලකල ලැබ රාජකාර්‍ය්‍ය කරනු කැමැති පුරුෂයන් හට, සැම්කොට වැටෙනු යේ = සැම් වැටෙනු නම්. මෙහි 'වැටෙනු' යනු පැවැත්ම යි.

25 පිටුව.

නිමද දිවෙල්— නො මදවූ බොහෝ වැටුප් නිමද නම්. මද නො වනුයේ=නිමද, ස්වල්ප නොවූ යන අර්ථයි. ජීවන වෘත්තිය=වේතනය-පඩි මුදල= 'දිවෙල්' නම් වේ. **තනතුරු-** ඒ ඒ කාර්‍යයනට සුදුසු වූ ස්ථානාන්තර, **ළ මැඩියෙහි—** හෘදය මධ්‍යයෙහි=ළය මතුයෙහි. 'ළ' ශබ්දය හෘදය වාචී වේ. මධ්‍ය යන්න මැදි = මැඩි යි- වහරෙහි යෙදේ. **උපායෙන්-** උපදේශයෙන්, "උපායෙන්" යි ගුඩවිය යුතු.

26 පිටුව.

සැනැහැති- ස්නෙහය ඇති, සනහ + ඇති=සනැහැති ස්වර පරරූපයෙන් සැනැහැති. **අනුදන්නේ—** අනුදැනීම කරන ලද්දේ. අනුඥාපිවාචී 'අනු' ශබ්ද පූර්වවූ දැනීම් අර්ථයෙහි වූ 'දන්' ධාතුයෙන් සිඩ කෘදන්ත පදයි. **කලණ් හෙබුය-** කල්‍ය ආකාරය ඉතා යහපත් වේ. "සුවිට්ඨ" ශබ්දය යහපත යන අරුත්හි වේ. ඒ 'හෙට්ටු' යි තද්භවයි, 'ය' යනු වාක්‍යාව ධාරණයෙහි නිපාතයි. **දෙයඩම්—** දිය යුතු දන උසතුව, දිය යුත්තේ ය යන අර්ථයෙහි 'දෙය' යනු වේ. දෙය ය ම දෙය ධර්ම නම් වේ.

27 පිටුව.

අජන්මවත්- පහත් කුලයෙහි උපන්, මෙහි 'ජන්ම' ශබ්දයෙන් උසස් කුලයෙක් හි උත්පත්තිය දක්වෙයි. 'වත්' ප්‍රත්‍යය අස්ත්‍යර්ථයෙහි වේ. එබැවින් "ජන්මවත්" යනු උසස් කුල ඇතියේ යන අරුත්හි වේ. න + ජන්මවත්=අජන්ම

එත්. විපිළිසර— කලකිරීම, විප්පටිසාර ශබ්දයෙන් බිඳිණි. සංවිධානයෙන්— මනාසේ කරන ලද නියමයෙන්, අගර්හ හිත— ගැරහුම් නොකරන ලද, ගර්හා + ඉත=ගර්හිත, න+ ගර්හිත=අගර්හිත. තුන් කෙණින්— මුල මැද අග යන ස්ථානත්‍රයයෙන්, ධනනාටෑ සි— ධන + නට + ඈ + සි, ධන නට + ඈ + සි=ධන නටෑසි, ධන විනාශනවූයේ ය කියා, නෑසිම් අරුත් ඇති 'නස්' ධාතුයෙන් වූ කර්තෘකාරක ප්‍රථම පුරුෂෛකවචනය නට යි සිඩවී.

29 පිටුව.

පිළිගාවන්— ප්‍රතිග්‍රාහකයන් 'පටිග්ගාහක' ශබ්දයෙන් ගත්තාසි. පණිවා— ප්‍රාණවධය=සතුන් මැරීම. සිත් පාද වනාගන්ය- සිත ප්‍රසන්න කර ගන්නේය, දනයෙහි අනුසස් උසස් වන්නේ පහන් සිතින් දීමෙනි, ඒ සඳහා මේ කී. අයිනාදන්— නුදුන් දෙය ගැනීම, අන් සතු දෙය සොර සිතින් ගැනීම ය 'අදින්නාදන' ශබ්දයෙන් ගිත්තාසි. මුසවා— මෘෂා වාදය-අසත්‍ය වූ දෑ කීම.

30 පිටුව.

අසිණ් කියන්නා හු— අගුණ කියන්නා හු = කේලාම් කියන්නාහු. කස්ග නෙපුල්— රළු වචන, පරුෂ බස්. සම්ඵප්පලාප— අර්ථයක් නොවූ නිෂ්ඵල කථා. හැමෙන් නාගු ද්— තමන්ට අප්‍රියයන් කෙරෙහි ක්‍රොධකරන්නා හු ද්. මිසදිටුහ— වැරදි විශ්වාසය = මිථ්‍යාදෘෂ්ටිය, නොමනයේ— සමෙනාභයකප්‍රතිය. උපද්දී— උපදවී, උපද් + වී=උපද්දී, පූර්වරූප සන්ධියි. යූපයම්- යාගස්තම්භය පිණිස, යාගය පිණිස ගෙන එන සතුන් බැඳ තබන කණුව යූපය නම්. ඉළුප්ද නො ද අලහ— යාගස්ථානය හැරසිටව එන ප්‍රසාදම නොගෙනාන, කුසතණ හා එන මිලින් යනන මිල්දම 'ඉළුප්'ද නම්.

81 පිටුව.

මෙහෙ කෙරෙහි නම් කර— මෑඩ කරන්නෙහි නම් කරව, තලමහ, බඳමහ, යන්නෝ— තලමූ, බඳිමූ, යයි කියන්නාහු. වැලප වැලප— වලප්මින්, දුක්මුසු වචන කියමින්–පූර්වක්‍රියාවයක ගේ සහයෝගයෙන් මිශ්‍ර ක්‍රියාපිය ගෙන දේ. පිවිනුවර සතර දොර— සිවුදිගින් නගරයට ඇතුල්වීමට තනන දොරටු සතරකි, නුවරින් පිටත=පිට නුවර වේ, පිටිනුවරෙහි සතර වාසල් දොරටු පිහිටි තන්හි, යනාර්ථයි. රන් කෙණ්ඩිස්ස- රතින් කළ සැන්ද, පිණ් මු-ප්‍රණිත වූ. හබු කඳු බත් මාලු- කැඳ කැවිලි බත් ව්‍යඤ්ජන. සැනැප්පී- සන්තර්පණය කරවිය, සැනැපුම් හි වූ 'සතප්' දයින් සිඩ ප්‍රයොජ්‍ය ක්‍රියා යි, සැනැප් + වි=සැනැප්පි, පූර්වරූප සන්ධියි.

82 පිටුව.

තමා හැති දූ- තමන්ට අයත් වූ ද්‍රව්‍යයන්. නො යෙදෙයි— යොග්‍ය නො වෙයි. එනෙකො දු වුව ද්- එසේ වූ නමුත්, 'වුවද්' යන තන්හි ද කාරය විනියොගයෙහි වූ නිපාතයෙකි. ඈර දුන මැනව— ගෙන ගොස් දුන මැනව යහපත් වේ. නගා ගෙන— රැස් කර ගෙන. කරවුවයින්- අයබදුයෙන්, ආදායමෙන්. කැමැති— කැමැත්තාහු නම්. මොබින්— මේ ස්ථානයෙන්. අනුකාම— මහායානයට අවිරුඩ ව, ඒ අනුව කැරෙණ යාගය. නුවර වද්ද් ද- නුවරට ප්‍රවිෂ්ට වෙත් ද. රජ්දරු ආදීනු— රජකුමාරවරු ආදීහු, 'රජදරු' යන්නෙහි ජ කාරයට ස්වර ලොපයෙන් 'රජ් දරු' යි යෙදෙයි. මැල දෙසෙහි- පශ්චිම දිශායෙහි. නො ද කල කිරවා— නො කළ කිරෙන සේ කවුනුවූ කරවා.

34 පිටුව.

මිණි කවද— 'මණිකවච' ශබ්දයෙන් නිපන්නයි, මැණික් ඔබ්බා කළ සන්නාහය. **රන්පවුල්**— 'රත්නපංසුකූල' ශබ්දයෙන් නිපන්නයි. මහාසේ පඬුපාවන ලද පංසුකූල චීවරය, රත්තවණ්ණවූ සිවුරැය යි ඇතැම්හු කියති. **ගල් වල්**— පර්වත හා වනයන්. **කුමුටුවමින්**— නිමග්න කරවමින්. **නාලන්ද නම නුවර**— රජගහ නුවරින් සැතපුම් 6 කින් ඈත පිහිටි කුඩා නගරයත්, නාලන්ද විශ්වවිද්‍යාලය පැවැත්තේ මෙහි ය. **සාමිචි කොට**— පිළිසඳර කථාකොට. **හුන්නා හප්**— උන් තැනැත්තාට. **කියග**— කියව. 'කිය' යන විධි ක්‍රියාවෙන් පරව 'ග' ප්‍රත්‍යය යෙදීම තමාට පහත් අය පිළිබඳවූ විධික්‍රියා විෂයයෙහි වේ. **කිහි නමෙක්**— නම් කියක්, **දණ්ඩය දණ්ඩය මිසැ**— දණ්ඩය දණ්ඩය කිහිනු මිස.

34 සිට 38.

කිහි දණ්ඩයක්— දණ්ඩයන් කියක්, කම්ය හෙවත් කම්මාර යන ශාසනික ව්‍යවහාරය නුවටිහු මෙසේ වහරති, කති ශබ්දය කිහි යනුයෙන් සිය බසෙහි එයි. **අචින්තක කොට**— සිතින් නො නිපන්නක් කොට, සිත් නැතියක් කොට. **දිය හඬා ම ය**— වාතාදිය නිසා ජලයෙන් ශබ්ද ඇතිවේ ම ය, එහෙයින් දිය හඬා මැයි, ශබ්ද කැරුම් අරුත්හිවූ 'හඬ' දයින් පර 'ආ' පසින් වූ ආඛ්‍යාතය 'හඬා' යනු වේ, 'ම' අවධාරණාර්ථයෙහි නිපාතයි. 'ය' වාක්‍යාවසානාර්ථයෙහි වේ. **සමයෙන්**—ලබ්ධියෙන්, සමූහ-කාරණ-ක්ෂණ-ලබ්ධි ආදි අනේකාර්ථ වාචී සමය ශබ්දය මෙහිදී ලබ්ධිය (ආගම) දක්වයි. **නො කෙලමෙයි**— වෙහෙස නො වෙයි, කිලම යන ධාතුව වෙහෙසීම් අරුත්හි වේ. එ ම කෙලම යි ඒ, කෙලමේ කෙලමෙත් යනාදීන් වර නැගේ. **අනන්තරකම්හි**— ආනන්තර්ය කර්මයෙහි, අනතුරු අත්බැවෙහි දී විපාක දෙන අකුශලකර්ම මේ නමින් ගැනෙත්. **සුගිසඳු**— ස්වර්ග සම්පත්තිය, සුගති ශබ්දය තකාර ලෝපයෙන්

සුගි යනු වෙයි. **අශ අල**- අයබද්ද ගෙන පැමිණියා වූ, 'ආය' ශබ්දයෙන් 'අය' යි කියිණි. හැරුම්හි 'හර' දයින් වූ අතීත කෘදන්තයවූ හල යනු අල යි සිටී. **සථරනු**- ශාස්තෘවරයා, අනුශාසනා කරන්නේ ශාස්තෘ නම්.

39 සිට 42.

ආකඩ්ඪිණ— තමා වෙතට ඇද ගනීම, ඇදීම් අර්ථයෙහිවූ කඩ්ඪිණ ශබ්දයට පූර්වවූ 'ආ' යන අව්‍යයෙන් අභිමුඛයට යන අර්ථය දක්වා. **පරිකඩ්ඪිණ**- පසුපසට (පෙරළා) දැමීම. හෙවත් තල්ලුකර දැමීම. **සම්පරිකඩ්ඪිණ**— වරක් ඉදිරියට ද වරක් පස්සටද ඇදදැමීම. **මවුලුකස්ස**- මටුල්ලෙන් පිළියෙළකළ රා පෙරගත, පොල් ගොබය වසා සිටි මටුල්ල නම් ද්‍රව්‍යය රා පෙරීමට පාවිච්චි කරත්. ඒ මෙහි ගැනේ. **දෙ කන**- කොත් දෙක, කොණ ශබ්දය කොත් යි කියෙයි. 'වෙ' යන්න 'දෙ' යි කියේ. **කිබිසිනි කොට**— යටිකුරු කොට. **අවධූනන**— යටිකුරු කොට සැලීම. **නිර්ධූනන**- උඩුකුරු කොට සැලීම. **නිෂ්පොථන**- හාත්පස නැවත නැවත පෙළීම. (හෙවත්) දිගහැරීම. **සණපිළි**— හණ වලින් කළ වස්ත්‍ර, ශාණපට යන්නෙන් කියනයි. **සණදෙවුන් කෙළි**— හණ වැහැරි දෙවීම් පිළිබඳ ක්‍රියාව. **මායාවී ය**- මායා ගුණ ඇත්තෙකි. **ආවත්තක**- හරවා ගැනීම. **නෙයියාණික**- දුක් ඉක්මයාමට හිතවූ. **වමාලා**- නැවත. **මහාසාවද්‍යය**- මහත් වරද සහිතය, **තෝරුසෙක**- වීජපාතු ගොඩෙක්හි 'ප්‍රසරාස' යන්න 'තොහොරුස්' යි කියා හකාර ලොපයෙන් හා සවර්ණ දීර්ඝයෙන් 'තෝරුස' යි විය.

43 සිට 48.

හුණුදිය- උණු පැන්. **මනස්ගි බැඳි**- සිත්හි බැඳී, සිහි කරගෙන. **පිත්තජ්වරයෙක්**— පිත් කොපයෙන් ඇතිවූ උණ ලෙඩක්. **කියවිද්**- බොනු කැමැත්තේ ද. **වළඳ කමැවිද්**- පරිභොග කරනු කැමැත්තේ ද. **අරාමය**- ගෙනඑදන්නේ මැ යි. **බුන්**— බිදුණු. **නිරිහය**— නිරීයහ යනු නිරීහාය යි

ශුඩ වියයුතු, උත්සාහ රහිතය, නිර් + ඊහ + = නිරීහ + අ, ය කාරාගම යි. **පිළිසැඳුද්**- ප්‍රතිසන්ධිය (ඉපදීම) ද. **පරණලා**- පරණවූ කොළ, පුරාණදල ශබ්දයෙන් පරණ ලා සි භින්නවිය. දල ශබ්දය පත්‍රාර්ථ යි **හකුරු**- ගල්කැට 'සක්ඛර' ශබ්දයෙන් භින්නයි. **කැබිලි**— කැබිලිති කටු. කපාල ශබ්දයෙන් භින්නයි. **දැහැව**— කොපවෙලා, 'දහ' දයින් නිපන් පෙර කිරිය යි. **ප්‍රශ්න ව්‍යාකරණ**— ප්‍රශ්න විසඳීම. ප්‍රශ්නයන්ගේ අරුත් පළ කිරීම. **දුටිබඳ**- නුවණැසින් දක්නාලද බමී ඇති, දිඪධම්ම, ශබ්දයෙන් භින්නයි. **දත්බම්**- දත්නාලද දහම් ඇති. විදිතධම්ම යන්නෙන් භින්නවී.

50 සිට 55.

නෙර පියව- පලවා හරුව, බැහැර කරව. **සරහවා ගෙන**- සුදනම් කරවාගෙන, **කම් පරවශ ව**- කාමානුකූලව, කාමියේ බලයට යටත්ව. **නිල් පියල්ලක්**- නීලවස්ත්‍රඛණ්ඩයක්. **සන්ලදින්**- සංදලත් හෙයින්, සිහිලදින්, ගබ් දෙර- ගර්භාරයෙහි, කාමරයෙහි දොරකඩ. **ගැත්තන්**- පරිජනයන්, වහල්වූවන්, ගැති + අන්=ගැත්තන්. තකාර විත්තයි. **නස්බහ**- නැසෙමු. නස්දයින් සිඩවූ ආඛ්‍යාතයි. **ගැලහුනහ**- වැදගත්හ, පතිතවූහ. **සැණොල් කෙහෙ බැඳ**— චණ්ඩාලයන්ගේ කෙහෙ බඳනා පරිදි ඇයගේ කෙස් වැටිය බැඳ. **නැගෙන වන් වූ**— නැගිටින්නෙක් මෙන් වෙලා. **නටමි**— නසන ලද්දෙමි. **පැදිදෙරතුරට**- නැගෙනහිර දොරටු තුරට, ප්‍රාචීවාරාන්තර, යන්නෙන් භින්නයි. **භව අග්**— භවාග්‍රය, සසර ඉම. **පැළදෙර**- බස්නාහිර දොරටුව. **සම්ගෙ**- සම් වලින් කළ ගෘහය.

56 සිට 59.

වැමෙන්නට— ජීවත් වන්නට, පැවතුම් අරුත්හි වූ වම දයින් නිපන් භාවකෘදන්තය, වැමෙනු + අට = වැමෙන්නට. **උකටලී නො වා**- කල නො කිරෙනු, වා- ව වීමෙහි දයින්

සිඩ ආඛ්‍යාතය. නො-ප්‍රතිෂේධවාචි අව්‍යය යි. **සොහොන් පියලි**- සොහොන්වල වූ වස්ත්‍ර ඛණ්ඩ. **කිනුණු පිරියම්**— කසිණ පරිකර්ම, නීලකසිනාදිය වැඩීමට උවමනා කටයුතු. **අටසමවත්**— අෂ්ටවිධ සමාපත්ති, ප්‍රථමධ්‍යාන විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන-ආකාසානඤ්චායතන. විඤ්ඤාණඤ්චායතන. නෙවසඤ්ඤානාසඤ්ඤායතන. ආකිඤ්චඤ්ඤායතන යන මේ රූපාරූප සමාපත්ති අට. **පස් අභිඥා**- පස්වැදෑරුම් විශිෂ්ට ඥාන, සෘද්ධිවිධඥානය— දිව්‍යශ්‍රොත්‍රඥානය — පරචිත්ත විජානනඥානය— පූර්වනිවාසානුස්මෘතිඥානය— දිව්‍යචක්ෂුර්ඥානය යන මේ පසයි. **පුනපුනා**- නැවත නැවත. **කල ව**— කෙළෙහිද?. **වෑහෑස**- ශොක කොට. **පණුරසි**- පසළොස්වක; පණ්ණරසී ශබ්දයෙන් සිද්ධයි. **හදහා**- විශ්වාස කරව, හදහ ඇදහීමෙහි ධාතුයෙන්වූ විධික්‍රියායි. **රැසිමඩි**— උදයෙහි, රාත්‍රිශිඛා = රැ + ඉම් = රැ + ය් + ඉම් = රැයිම් = එහි = රැයිම් මෙහි. **සෙමින්**- සිනාසෙමින්. **ඒ ල**- පැමිණෙන්නෙ ලු, 'ඉ' ගමන්හි දයින් වූ අන් කරු එකබස ඒ-යනු වේ, ල යනු ශ්‍රැති සූචනයෙහි වී. **පිළින් වසා**— වස්ත්‍රයෙන් වසා. **සිවු ගඳින්**- චතුර්ජාතික සුගන්ධයෙන්, කොකුම්-යොන් පුප්-තුවර ලා සහ තුරුක් තෙල් යනු සිවු දෑ ගඳයි. **කෙවෙර කෙන**- තුවරා හෙවත් ගල්වා. **වැලෑත් ව**— ආසනන ව. **ගඳදුමින් මල්දුමින් ලල්දි**- ගන්ධදූම පුෂ්පදූමාදීන් ලීලෝපෙත කොට, ලීලා ශබ්දයෙන් ලල් යි සිද්ධයි. **පිරිමඩහ**- පිරිමැද්දහුය. **පා දෙව් දිය**- පා සෝදන ලද ජලය. **ඉඳුල් ගෙකි**- අන්‍යයන් පරිභොග කල ගෘහයෙහි. **මඬු ගෙහි**— මණ්ඩපගෘහයෙහි. **ඔත්**— බහාලති. ඔව—බහාලීමෙහි යන දයින් තිපත් වර්තමාන ආඛ්‍යාතය.

61 සිට 62.

වැලම්ල— පොෂකයන්ගේ වැටුප් මිල—බැලමිල යි ද සැලකිය හැක. **නව හම්**- අභිනව කර්මාන්ත. නවකම්ම=නව කම්=නවහම්. **පෙරහරින්**- සත්කාරාදීන් යුක්තවූ පරිහරණ

මෙයින් පරිහාර ශබ්දය පෙරහර යි යෙදේ. **මී කඩ සකුරන්**- මධුයෙන් හා උක්සකුරෙන්. ඛණ්ඩශර්කරා ශබ්දයෙන් කඩ සකුරු යි තද්භව වේ. **රන්මර වනියට**- රතින් කල් (මහත්) පාදුකා වනට. **මිණි බඳ**- මධුබහාලව. **දුලද සැඩ ඔලා**— දුලිබිඩි නඟැති වණ්ඩ වූ දිය සුළියෙන් ද. **කිඹුල් මුවරසිහෝ**— කිඹුලන් හා මොරුන්ගෙන් යුක්තවූ. **පහයින් නො ගත්**- පලදනාවක් නොගත් හෙයින්. **කසල පිස්සත්තු**- සංශෝධකයකු. **තොට පියලි**- තොටුපළවල දමා තිබූ රෙදි කඩ. **දක්ෂිණෙය**— දක්ෂිණාවට සුදුසු.

63 සිට 66.

යශස්විය— යශස් ඇති තැනැත්ත, යශස් නම් පිරිවරයි. **සුතු කොළෙල් ය**- පිළියෙල කොළල් ය. **වළඳගන්නාහු**- අනුභව කරන්නාහු. **මා යපෙන පමණක් දෙ**— මට යැපෙන ප්‍රමාණයක් දෙනු මැනවි, දෙ දීමෙහි යන දයින් නිපන් විධි ක්‍රියායි. **සුමුඩුවුහු නම්**— සම්මූඪවූවාහු නම්. **වපුල බිජ්**— වපුරන ලද බීජයන්, වැපිරීම් අරුත්හි වපුර දයින්වූ අතීත කෘදන්තයි. **සරුකෙත්න**— සරුකෙත් හ විය යුතු, සාරවූ ක්ෂෙත්‍රයෝය යනාපීයි. **වෙලෙව්ව**— ඉක්මන් ව. **හුණුපත් තොන්**- උණ පතුරෙන්. **සිසා**- පහර දී. **කරගෙන**- බොටු වෙන් අල්වාගෙන. **විදුරුහල්**— වජ්‍රපීඨය. **නිසෙන්**— නබයෙන් = නියපොත්තෙන්. **කැණිසපිසෙහි**— කණිනු කැමැත්තෙහිය. **වහනෙ**— වානය නම් ලෝහ විශේෂය. **දතින් කෑසපිසෙහි**— දතින් කනු කැමැත්තෙහිය. **වෙසකා**- විපයෙක්හි. **කොණෙණකි අහර**- කොණෙණකි අහර විය යුතු. ඒ ඒ තැනින් හැන්දෙන් ලැබෙණ මිශ්‍ර ආහාරය. **අත්පාසිපත්**- හස්ත පාද විලපනය කරත්. **පවුල්පෙරෙව්**- (සාංඝු කූල) චීවරයක් පෙරවිගත්. **නොවම්නි**- බබලමින්. **රන මලා**— සුවර්ණමය භාජනයක්. **අමාබස්සක්**- අමෘත ඖෂධයක්. **වෙර**- සිරුරෙහි. **අන්න**- මැණියෙනි! **සුහ**- පානය කළහ, **පෙං**- පීමෙහි යන දයින් නිපන් අතීත ආඛ්‍යාතයි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු